පදසාධනසන්නය.

දෙවිරජමහාරාමවාසී ශ්‍රීමත් පියදර්ශී මහාස්ථවිරප්‍රණීත

පදසාධනය හා

දිඹුලාගල ශ්‍රීමත් ආනන්ද වනරතන මහාස්ථවිරප්‍රණීත

පදසාධනසන්නය.

පැලියගොඩ

විද්‍යාලංකාර පරිවෙණාධිපති

ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය උපාධ්‍යාය ධුරන්ධර.

රත්මලානේ ධම්කිර්ති ශ්‍රී ධම්මානන්දාභිධාන

කොළඹ හලාවත දෙදිගෑවේ

ප්‍රධාන සඞ්ඝනායකස්ථවිරයන්වහන්සේ විසින්

සංශොධනයෙන් ප්‍රතීසංඛරණයි.

පිරනේනේ

විල්ෆ්‍රඩ් පිරිස් පතිරණ අප්පුහාමි විසින්

සත්‍ය සමුච්චය යන්ත්‍රාලයෙහි

මුද්‍රා පිතයි.

2475

1933

සංඥපනය.

"අථප්‍රවෘත්තිතත්ත්වානාං ශබ්ද එව නිබන්ධනම්
තත්ත්වාවබෝධඃ ශබ්දානාං නාස්ති ව්‍යාකරණාදෘතේ"

ශ්‍රීමතසුගතතථාගත අප සම්මාසම්බුදුරජාණන්වහන්සේ සකලසත්වයා කෙරෙහි පතළ මහාකරුණාවෙන් සාරාසංඛ්‍යකල්ප ලක්ෂයක් මුළුල්ලෙහි පූරිත පාරමිතානුභාවයෙන් ප්‍රතිලබ්ධ බුද්ධඥානයට විෂය වූ ලෞකික ලෝකොත්තරවශයෙන් ද්විවිධ වූ අර්ථයන් සතරාමරලොකයාගේ පරිඥානය සඳහා අනන්‍යසාධාරණවාග් විලාසයෙන් ප්‍රකාශිත නෛයර්‍යාණික ධර්මදේශනා ලොමේ පාළි නම් වන්නීය. ඒ පාළියට=බුද්ධවචනයට ප්‍රභවස්ථානය බුද්ධඥාන නිඃපත්තිහෙතුභාවයෙන් මාතෘස්ථානතුල්‍ය වූ මෙරට මිණ්ඩිය පිහිටි ජනපදය වූ මගධදේශය බැවින් 'මගධෙසු විදිතො' මිගධඃ, 'මගධෙසු භවො' මාගධඃ=සත්ත්වයා යි තද්ධිතනිර්වචන වශයෙන් පාලිශබ්දය, පාලිශබ්දලක්ෂණය මාගධය යි ද පාලි භාෂාව මාගධී ය යි ද ව්‍යවහාර ය.

මෙසෙයින් මේ පාලිභාෂාව=මාගධීභාෂාව බුද්ධභාෂා ය යි ද පුරාණාචාර්යයන් විසින් සම්මත ය. එසේ වූ මේ සභාවනිරුත්තිභාෂාව පවා ශබ්දලක්ෂණසංඛ්‍යාත ව්‍යාකරණානුකූල ව සංරක්ෂණය කිරීමෙන් ම ත්‍රිවිධසද්ධර්මය යි සම්මත පර්‍යාප්ති ප්‍රතිපත්ති ප්‍රතිවේධසංඛ්‍යාත ත්‍රිවිධශාසනය සංරක්ෂණය වෙයි යනු ද ආචාර්යසම්මත ය.

මේ සම්මතය පරිදි ත්‍රිවිධශාසනසංරක්ෂණය සඳහා ව්‍යාපෘත වූ ශ්‍රීලඞ්කාද්වීපවාසී මහාවිහාරාධිවාසී ධර්මාචාර්ය උතුමන් අනුරෙන් ශ්‍රෙෂ්ඨතරෙත්තමයා වූ අනුරාධපුර සත්‍යාරාමවාසී වූ ශීලවාරශ්‍රුතාදිගුණාභරණාදී ලෞකිකාලෞකික ගුණරත්නාභරණයෙන් විභූෂිත වූ සම්සන්නශබ්දශාස්ත්‍රසාගරපාරදර්ශී වූ ශබ්දලක්ෂණකරණයෙහි අනන්‍යසාධාරණසාමර්ත්‍යාතිශයයෙන් පරිපූර්ණ අප ඔළුඳුගල්‍යාශ්‍රමාධිවාසී මොග්ගල්ලාන ස්වාමියන්වහන්සේ විසින් විරචිත මාගධශබ්දලක්ෂණ නම් වූ මෙතුන්ගල්‍යාගම ව්‍යාකරණය වනාහිඃ පෙළඳම් රක්ඛා දිණිස ඇති වූ සියලු ශබ්දශාස්ත්‍රඥයින් අතුරෙන් සර්වාතිශායි පූර්ණ අසන්දිග්ධව්‍යාකරණය යයි ප්‍රඥාශ්‍රුතීකාරී උතුමන් විසින් සම්මත ය. සර්වඥීයව්‍යාකරණය අනන්‍යසාධාරණ අභිප්‍රායශුද්ධියෙන් පරිපෝෂිත වූ මෙහි

වැසී වටහා ගත් මුගලන් මාහිමියන්වහන්සේ විසින් මේ ව්‍යාකරණය සම්බන්ධ සූත්‍ර, වෘත්ති, ධාතු, ගණ, ණවාදි, පඤ්චිකා සංඛ්‍යාත අවයවයන් නිමා කළ ඉක්බිති උන්වහන්සේගේ සම්මුඛශිෂ්‍ය ධූතනය වූ දෙවිරුජවිහාරාධිවාසි සකලමාගධශබ්දශාස්ත්‍රපාරදර්ශී වූ අප ප්‍රියදර්ශී මහාසඨවිරයන්වහන්සේ විසින් තමන් වහන්සේගේ මයිලණු වූ රුහුණ දෙළොස්දහස්රට කදැලිවිහාර ග්‍රාම්‍යාධිපති වූ පැණෑති සද්ධම්මකිත්ති මැතිවරයාගේ ආරාධනා පරිදි ආඛ්‍යාතනිපාතානුග්‍රහය සඳහා සූත්‍රානුක්‍රමය හැර ප්‍රයෝගසාධනානුක්‍රම පරිදි මේ පදසාධන නම් වූ ශ්‍රේෂ්ඨතර පරිවාරග්‍රන්ථය කර වදාරන ලද්දේ ය. 'මේ ප්‍රකරණය මෙතෙකල්‍යායනව්‍යාකරණ නැමැති රත්නාකරයට පැමිණෙනු කැමැති ආඛ්‍යාතකයන්ට උපායමාර්ගය සෑ' සි පදසාධනටීකාකාර ශ්‍රීසද්ධම්මබෝධිශ්‍රීවිජයබාහු පරිවෙණාධිපති සද්ධර්මාභරණපරමේශ්වර ත්‍රිපිටකවාග්ගීශ්වරාදිරුවායන් අප නොමගමුවේ ශ්‍රී රාහුල සද්ධර්මරාජමාහිමියන්වහන්සේගේ ප්‍රකාශයෙන් මේ පදසාධන ප්‍රකරණය පිළිබඳ ප්‍රයෝජනමහත්ත්වය සැලකිය හැකි වේ.

"මිනිසුන් කුමක් කිවත් යමෙක් පාණිනීය නොදනී නම් ඒ කිසිවෙක් සංස්කෘත නොදනී" යනාදීන් මහාපණ්ඩිත මෙක්ස්මුලර් තුමා ආදි පාශ්චාත්‍යපණ්ඩිතවරයන් විසින් පවා වර්ණිත මහර්ෂි පාණිනීන් විසින් විරචිත පාණිනීයව්‍යාකරණසාගරයට වරදරාජ වාසීයන් විසින් විරචිත ලඝුසිද්ධාන්තකෞමුදිය ප්‍රවේශොපාය වන්නේ යම්සේ ද,

ශ්‍රී ලඞ්කාද්වීපවාසී පුරාතන මහාපණ්ඩිතවරේණ්‍යයන් විසින් අත්‍යූනතාසම්භාවිත වූ ප්‍රශස්‍යාතිප්‍රශස්ත වූ මුනි චන්ද්‍රගොමීන් විසින් විරචිත චාන්ද්‍රව්‍යාකරණසාගරයට බෞද්ධ ඉතිහාසයෙහි නොමැකෙන කීර්තියක් පිහිටුවා වදාළ නෛසර්ගිකගුණරත්නාකරායමාන දිඹුලාගල භදන්ත මහාකාශ්‍යප සද්ධර්මරත්නාකරයන් වහන්සේ විසින් විරචිත බාලාවබෝධනය ප්‍රවේශොපාය වන්නේ යම්සේ ද,

නොයෙක් පරිවාරග්‍රන්ථයන්ගෙන් හෙබියාවූ ජිනවචනසංරක්ෂණයෙහි ලා මහත් අර්ථයක් සිදුකරන්නාවූ කාත්‍යායන මහාසඨවිරපාදයන්වහන්සේ විසින් විරචිත කච්චායනව්‍යාකරණසාගරයට ධම්මකිත්ති මහතෙරපාණන් විසින් විරචිත බාලයන්ගේ මනදෙළ පුරන්නා වූ බාලාවතාරය ප්‍රවේශොපාය වන්නේ යම්සේ ද,

ශ්‍රී සඞ්ඝරක්ඛිත, ශ්‍රී රාහුලාදි පණ්ඩිතප්‍රකාණ්ඩ සඞ්ඝරාජෝ තතමයන් විසින් අත්‍යර්ථයෙන් සංවර්ණිත වූ අනාකුල වූ සම්‍ය ඞ්ගසම්පූර්ණ වූ නානාමත සම්මිශ්‍රනයෙන් නොකිලිටි වූ අශෙෂ ලක්ෂ්‍යයන් පරිග්‍රහණය කළ හෙයින් අනූන වූ අසිසංක්ලිෂ්ට නොවූ නාතිව්‍යක්තාත වූ ඉතා සුගම වූ අනිශයින් නිත්‍යානු භත වූ ශිෂ්‍යයනට විමතියක් හෝ සැකයක් නූපදවන හෙයින් අසන්දිග්ධ වූ මහාශාබ්දිකයාචීහෞම **මෞද්ගල්‍යායන** මාහිමි යන් විසින් විරචිත මොග්ගල්ලානව්‍යාකරණසාගරයට ඔබ ශිෂ්‍ය වූ **ප්‍රියදර්ශි** යතිතුමාණන් විසින් විරචිත මේ **පදසාධන** නම් ප්‍රකරණය ත් එසේම ප්‍රවෙශොපාය වන්නේ ය.

මහාශාබ්දික මෞද්ගල්‍යායනසූත්‍රකාර **මුගලන්** මාහිමියන් වහන්සේගේ සම්මුඛශිෂ්‍යරතනය වූ මේ පදසාධනප්‍රකරණකාර **ප්‍රියදර්ශි** යතිතුමා පදසාධනප්‍රකරණසම්පාදනයෙහි දී සවකිය ආචාර්‍යවරප්‍රණීත මොග්ගල්ලානවුත්තිපඤ්චිකාගත රූපසාධන ක්‍රම නොගෙන දෙතැනක දී අන්‍යාකාර රූපසාධනක්‍රම සැලැස් විය. එනම්:-

ණාදිකාණ්ඩයෙහි 'කව්වාන කව්වායන කාතියාන' යන පදසාධනයෙහි ද ඒ කාණ්ඩයෙහි ම 'දුතිය තතිය චතුත්ථ' යන පදසාධනයෙහි දැයි යන දෙතැන්හි ය. එයින් 'කව්වාන කව්වායන කාතියාන' යන පදසාධනයෙහි දී මුගලන් මාහිමියන් පිළිගත් මූලප්‍රකෘතිය 'කත' යනු යි. කත නම් **ගාඩෙශවිශ්වාමිත්‍ර** නම් වූ බ්‍රහ්මර්ෂිහුගේ පුත්‍රයකු වාච්‍ය වන ශබ්දයකි. මේ ඍෂිපුත්‍ර නාමය දීඝ කලඝ පටන් පොත්වල 'කත' යි ද 'කති' යි ද පාඨභෙදයකින් යුක්ත ව පවත්නා බැව් පෙනේ. දැනුදු වාවසපතියෙහි හරිවංශයෙන් උද්ධෘත ශ්ලෝක යෙහි 'කතශ්චෙව' යි ඇත; 53 වන තෙළෙනස්වෙනියකින් පෙර මුද්‍රිත හරිවංශයෙහි 'කතිශ්චෙව' යි දක්නා ලැබේ. පාණිනීය වාඤ්ජාදි ව්‍යාකරණකාර උතුමන් විසින් ද ගර්ගාදිගණායත්ත 'කත' යන ප්‍රකෘතිය ම මූලප්‍රකෘතිවශයෙන් සංගෘහීත ය. එ පරිදි පිළිගත් මුගලන්මාහිමියෝ කත යන මූලප්‍රකෘතියෙන් අපත්‍යාර්ථයෙහි ණ්‍යප්‍රත්‍යය කොට 'කව්ව' යි සාධා * ඉක්බිති අපත්‍යප්‍රත්‍යයාන්ත ඔහු මෙකරෙන් ණානණායනප්‍රත්‍යයන් කිරීමෙන් 'කව්වාන කව්වායන' යි ද කත යන ප්‍රකෘතියෙන් පර ව මේ නිසා ඉරවිත 'කතා ණියො ච' 4(19) † යන ගණසූත්‍රයෙන් අපත්‍යාර්ථයෙහි ණ්‍යප්‍රත්‍යය කොට 'කාතිය' යි සාධා ඉක්බිති ණානප්‍රත්‍යය කිරීමෙන් කාතියාන යි ද සැදූහ.

---

* කණ්වස්‍යාපත්‍යං කාත්‍යඃ, 'ගර්ගාදිභ්‍යෝ යඤ්' 4.1.105-පා. -2.4.24-වා.

† මේ ගණසූත්‍රය අනික් පොත්වල 'කත්‍ථා ණියෙව් ඝත්‍ථ ඉරිත්‍ථිව' යි මුද්‍රිත ම ඇත. මේ එහි නියම ඉඝිය බැව් සැලකියයුතු යි.

පදසාධනප්‍රකරණකාර යතිතුමා මූලප්‍රකෘතිය වූ භූත යන්න හෝ අපත්‍යප්‍රත්‍යයානත කළුව කෘතිය ප්‍රකෘතීන් හෝ නො ගෙන භූත කතී යන දීපිවිධපාඨයන් අතුරෙන් 'කතී' යන්න පිළිගෙන අපත්‍යාර්ථයෙහි කරන ලද ණ්‍යප්‍රත්‍යය රහිත හුදු කතී යන ප්‍රකෘති ශබ්දයන් පර ව ණානණායනප්‍රත්‍යයන් කොට තකාරසථ ඉකාර ඝට ඝකාර ඊකාර ය පර කල්හි වවඟී ද පුඕරූප ද කොට කළුවාන කළුවායන සී ද එසේ ම ණ්‍යප්‍රත්‍යය රහිත හුදු කතී යන ප්‍රකෘතිශබ්දයන් ණානප්‍රත්‍යය කොට වෘද්ධි ද ඝකාරාගම ද කොට කාතියාන සී ද සාධන කෙළේ ය.

කාතියාන යන පදසාධනයෙහි දී පියදස්සී යතිතුමා ණ්‍යප්‍රත්‍යයානත කෘතිය යන්න ප්‍රකෘතිය වශයෙන් නො පිළිගත් හෙයින් ඒ සඳහා ඝකාරයක් ආගම කරගනු පිණිස පදසාධන වෘත්තියෙහි 'යාගමෙ කාතියානො' සී යොදන ලදි. එය එපරිදි ලියලූ සවදෙඝ විදෙඝ මුගලන්වෘත්තිපොත්වල ද පැවැත එයි. ඒ පිණිස ම 'ඝනා ණ්‍යො ච' 4-(19) යන ගණසූත්‍රය රචනා කළ මුගලන්මාහිමියන්ගේ පදසාධනක්‍රමයට 'යාගමෙ' යන්න කිසි ද හෙතුවකිනු ත් නු වුවමනා හෙයින් මුගලන්වෘත්තියෙහි වූ 'යාඝමෙ' යන්න පදසාධනප්‍රකරණයෙහි ඝසළ නුවණින් යුත් ලිපිකරඝ්‍රමයකැ සි ම සැලකිය යුතු ය.

මෙ පදසාධනක්‍රමයෙහි දී සත්‍යකාර ආනන්දසථවිරතුමා ප්‍රකරණයෙහි වූ පරිදි ව්‍යාඛ්‍යාන කොට ඉක්බිති 'මෙහි මෙසෙ කියන ලද; පඤ්චිකායෙහි වනාහි' යනාදීන් පඤ්චිකාගත ක්‍රම ද පැවසී ය. නමුත් ටීකාකාර මාහිමිතුමාණෝ මේ ගැන කිසි ත් ප්‍රකාශ නො කොළෝ ය. තවද කළුවායන මහාසද්දනීති යන ව්‍යාකරණවල 'කළෙවාති කිර තසමිං ගොත්තෙ ආදිපුරිසො' සී 'කළුව' යනු ම ප්‍රකෘති කොට ගෙන ණානණායනප්‍රත්‍යයන් කිරීමෙන් කළුවාන කළුවායන සී සිද්ධ කොට විශෙෂයෙන් මහාශබ්ද නීතියෙහි 'අඤ්ඤථාපි භවති කාතියානො' සී ද පැවසූහ.

'දුතිය තතිය චතුත්ථ' යන පද මුගලන් මාහිමියෝ 'දුතියස්ස සහ දිසඩ්ඩදිවඩ්ඩා' 3-106 'චතුත්ථතතියානමඤ්ඤතියා' 3-105 යන සූත්‍රද්වයක නිපාතනවිධියෙන් සැදූහ.

පදසාධනප්‍රකරණකාරයතිතුමා 'චතුත්ථදුතියෙසෙඝසං තතිය පඨමා' 1-35 යන එකසූත්‍රනිපාතනයකින් ම සාධන කෙළේ හි. ටීකාකාරමාහිමියෝ මේ සාධනක්‍රමය ගැන හෙතුඤ්ඤතා දක්වී

මින් ඒ සාඛනක්‍රමය ප්‍රයෝගසිද්ධිප්‍රකරණකාර මතරහාපර නාමධෙය මෙධඞ්කර යනිතුමන් විසිගත් පරිදි ද ප්‍රකාශ කොළෝ ය.

මෙයින් පියදස්සී යනිතුවාණන්ගේ මුගලන්වියරණ විසිදිද් හසළ බුද්ධිමත්තය මැනෙවින් සපුට වේ. මුන්වහන්සේ මුගලන් වියරණ පමණක් නොව සපිරිවර සසයින්වියරණ ද, පෙළවිය රණ පමණක් නොව සකුවියරණ ද, එපමණකුත් නොව සාර්‍ථ කථා ත්‍රිපිටකධර්මය ද උද්ග්‍රහණ ශ්‍රවණ ධාරණ චින්තන නිරූප නාදිවශයෙන් සකසා පුරුදුපුහුණු කළ බව ද මේ ප්‍රකරණයෙන් ප්‍රකට වන්නේ ය.

> "රූපසිද්ධියං පනස්ස අඤ්ඤථා රූපනයෝ දස්සිතෝ; න සෝ ගන්තබ්බෝ; අමූලත්තා. නහි තත්‍රාගමාදි මූලමත්ථි. එවම්දිසමඤ්ඤම්පි."

මෙහි අදහස මෙසේ යි:-

රූපසිද්ධියෙහි වනාහි මේ ශ්‍රාවකබුදුහාගේ රූපක්‍රමය අනිත් පරිදි දකින් නොවන් 'නිච්චනත්තිමහි වා' 2.2.33 යන සූත්‍රයෙහි ව ග්‍රහණ යෙන් සියලු විඤ්ඤාණ්ගේ ම පරතල්හි ආන යන ආදේශයක් කොට දක්වන ලදි. ඒ රූපක්‍රමය නො ගත යුතු යි කුමක් නිසාන් ද යත්? මූලක් නැති බව හෙයිනි. ඒ රූපක්‍රමයෙහි ආගමාදි යියි ද මූලයෙක් නො ම ඇති. මෙ බඳු වූ සෙස්ස ද මේසේ මැ යි.

මේ ආදිය බැලීමෙන් ඒ බැව් සපුට වන්නේය.

මේ ආදි නයින් මේ පදසාධනප්‍රකරණකාර පියදස්සී යනිතුමා අනිච්චාරද ශබ්දශාස්ත්‍රාකාර මුගලන්මාහිමියන් ඇසුරු කිරීමෙන් ඉන්ද්‍රියනිප්පාදනයෙහි පවා ප්‍රතිලබ්ධ විශාරදඥානමාහත්ම්‍ය ඇත් තෙකැ යි ප්‍රතීයමාන වේ.

සංඝාතශබ්දලක්ෂණ ව්‍යාකරණ අනුවාදය.

වාගධිශබ්දලක්ෂණ රචයිතාරහු සුදුසු තැන්හි දී මෙහෙයින් සංඝාතශබ්දලක්ෂණයන් අග්‍රගණනය කළහයි කියනාහුත් හේ යුක්තියුක්ත නො වන්නේ නො මේ. දැනට අප අතරෙහි 'පවත්නා පාලිව්‍යාකරණග්‍රන්ථ සංඝාතව්‍යාකරණයන් ගුරුතාදූරෙහි තබාගෙන රචිත යැ යි ඒ ඒ ග්‍රන්ථ සමාලොචනය කරන්නාවුන්ට ම ඒකාන්ත වැටහේන්නේ ය.

1. සම්මොහවිනොදනී සංඝභාවිත්‍යංකරණග්‍රන්ථයන් ත්‍රිපිටකයෙහි – විද්‍යමාන පාලිව්‍යාකරණ රචනාවට පෙරුතුවී රචිත ව පැවතීම්,

2. එම ග්‍රන්ථයන්හෙන් පාලී උගතුන් ව්‍යරණ ඉගෙනීම.

3. පාලි සංස්කෘත භාෂා දෙකින් භාෂාතාත්වය මුත් ප්‍රත්‍යයාගතාත්වයක් හෙතෙමින් විද්‍යමාන නොවීම,

යනාදි හෙතුහු පෙළවියරණැදුරන්ගේ සංස්කෘතව්‍යාකරණානුගමනයට කාරණ වූහ.

කච්චායනව්‍යාකරණය රචනා කළ කසයින්හිමිපාණෝ ආචාර්ය ශබ්දවම්ශයන්ගේ කාතන්ත්‍රව්‍යාකරණය ගුරුකොට ගෙන සඛ්‍යාත පාලිව්‍යාකරණය රචනා කොළෝ ය. ඔබ පාණිනීයාදියන් ඇසුරු නොකෙළේ නොවෙයි යනු ඔවුන්ගේ සූත්‍රයන් හා අර්ථයෙන් පමණක් සමාන වූ ද, අර්ථසවරූප දෙකින් ම සමාන වූ ද සූත්‍රයන් කසයින්වයරණෙහි තිබීමෙන් පැහැදිලි වන්නේ ය. එහෙත් ඉදුරා අබිමුවෙහි තබාගත්තේ කාතන්ත්‍රය ම ය යි කීමට බොහෝ සුතුකම් ඇත.

මුගලන්ව්‍යරණ සැපයූ මුගලන් මාහිමියෝ අතිප්‍රශස්‍ය බෞද්ධමහාශාබ්දිකයකු වූ මුනිවසුගොම්පාදයන්ගේ වාඤ්ජව්‍යාකරණය ගුරු කොට ගෙන පෙළවියරණට සවල්පමාත්‍ර වූ ද හානියක් නොවන පරිදි පෙළබසට ගැලපෙන සේ තමන් ව්‍යරණ සැපයූහ. උන්වහන්සේත් පාණිනීයාදිය ඇසුරු නොකොළෝ නොවෙති.

කාත්‍යායන පරිවාරග්‍රන්ථයක් වූ බාලාවතාරය රචනා කළ ධම්මකීර්ති මහාසඵවිරපාදයෝ වාඤ්ජපරිවාරග්‍රන්ථයක් වූ මහාකාඤ්ජපමාහිමියන්වහන්සේගේ බාලාවබොධනයෙන් හා ධම්මකිත්තිපාදයන්ගේ රූපාවතාරයෙනුත් ගුරුකම් ගත්හ.

මුගලන් පරිවාරග්‍රන්ථයක් වූ මේ පදසාධන ප්‍රකරණය රචනා කළ ප්‍රියදර්ශීමහාසඵවිරපාදයෝ තමන් ඇදුරුතුමන් ගිය මඟ ම යනුවෝ වාඤ්ජපරිවාරග්‍රන්ථයක් වූ බාලාවබොධනය ම ගුරු කොට ගත්හ.

පදසාධන රචනා සම්බන්ධ.

මේ පදසාධනප්‍රකරණය පොළොන්නරුකාලයට අයත් කළ සුතු ග්‍රන්ථයකි. පියදස්සි යතිතුමන් මුගලන් මාහිමියන්ගේ පාණ්ඩවන ඇසුරු කොට ශබ්දශාස්ත්‍රාදිය ඉගෙන ගත් සම්බුද්ධ ශිෂ්‍යයා බව තමන්වහන්සේ ම පදසාධන නිගමනාඨාවන්හි පවසති. මුගලන්මාහිමියෝ මහාපරාක්‍රමබාහු

රජතුමන් ජීවමානකාලයෙහි ම මුගලන්වියරණ නිපදවූහ. එසෙ සින් පියදස්සි යහිතුමන් ද ඒ කාලයට අයත් විය යුතුය ධර්මාශෝක බාහු රජතුමා ත්‍රිසිංහලය එක්සේසත් කොට අභිෂෙකයට පත් වූයේ ක්‍රිස්තුවර්ෂ 1164 දී ය. කාලක්‍රියා කෙළේ 1197 දී ය. හෙවත් මින් 735 වර්ෂයකින් පූජා යෙහි ය. එහෙයින් මේ පදසාධනප්‍රකරණය රචනා කළ කාලය ඉතා අඩුවශයෙන් සලකතත් මින් හවුරුදු 700 කින් පෙරාතුව ය.

මේ පදසාධනප්‍රකරණය ලිපිදෙසින් යුක්ත ව පවත්නා අතර මිට

පදසාධන සංශොධනය.

පන්සාලිස්වසකට පෙර විද්‍යොදයපරිවෙණාධිපති ව වැඩවසූ ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය අප නික්කඩුවේ ශ්‍රී සුමඟලාභිධාන සඞ්ඝනායක සාමිපාදයන්වහන්සේගෙන් ලත් උපසම්පදාදිය ඇති රත්මලානේ පරමධර්මවෙනිය පරිවෙණාධිපති ව වැඩවසූ අප වලානේ ශ්‍රී ධර්මානන්දාභිධාන නායකස්ථවිරයන්වහන්සේ සහ පසු කාලයෙහි විද්‍යොදය පරිවෙණාධිපති ව වැඩවසූ ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය අප මහාසංඝරාඡ ශ්‍රී සුමඞ්ගලවරාභිධාන සඞ්ඝනායක ස්ථවිරපාදයන් විසින් ද සංශොධිත ව මෙරට මුද්‍රිත පොත ද බුරුම රට ගණවාචකාචාර්‍ය්‍ය වූ අප ශ්‍රී සීලාචාරාභිධාන ස්ථවිරතුමන් විසින් සංශොධිත ව එරට මුද්‍රිත පොත ද ආධුනිකප්‍රජානුග්‍රහ පිණිස කලක් පැවතිණ. ඒ අතර මිට සමීපකාලක මාතර මහා මහනිඳුපරිවෙණාධිපති අප බඹරුන්දේ ධර්මකීර්ති ශ්‍රී ධර්මාචාර්‍යාභිධාන නායකස්ථවිරයන් විසින් "මේ පොත මුගලන්වියරණ පිළිබඳ පුනරුද්දීපනියක් ඇති මේ කාලයෙහි නැවතත් සංශොධනයකර වදාළොත් මහත් විද්‍යුර්පිතානුග්‍රහයෙක් වේය"යි අයැදනාලදින් ඒ මෑනවැසි පිළිගත් අපි සබරගමුවදෙහිමුද්‍රිතපොත් ද මහනුවර හෙඬිගේ විහාරාධිවාසී අප උඩුවාවල රෙවතස්ථවිරයන්ගෙන් ද මාඹිටිය ගල්ලෙන්විහාරාධිපති අප කුකුල්පනේ වනරතනස්ථවිරයන්ගෙන් ද ගල්කෙමේ විහාරාධිපති අප නාරාපේතියේ රතනපාලස්ථවිරයන්ගෙන් ද ලැබුණු පොත් හා අප විද්‍යාලඞ්කාර පිරිවෙන්හි පොත ද මුගලන්වියරණට ඇතුළත් සෙසු පොත් ද සුදුසුතන්හි කසසින්වියරණ හා සකුවියරණ පිළිබඳ පොත් ද සසඳා බලා ගුරුක්‍රම සම්ප්‍රදායපරිදි සංශොධනය කෙළෙමු.

මේ පොත් අතුරෙන් මෙරට මුද්‍රිත පොත හා බුරුමයෙහි මුද්‍රිත පොත ද, මහනුවර හෙඬිගේ විහාරස්ථ පොත හා ගල්කෙමේ විහාරස්ථ පොත ද, මාඹිටිය ගල්ලෙන්විහාරස්ථ

පොත හා විදුලඬ්කාරපිරිවෙන්සතු පොත ද බොහෝ සෙයින් අන්‍යෝන්‍ය සමානතා ඇතැයි පැවසිය යුතු ය.

පදසාධනප්‍රකාශය.

මේ පදසාධනප්‍රකාරණයෙහි විද්‍යමාන වූ ප්‍රයෝජනමහත්ත්වය සැලකූ දිඹුලාගල පරම්පරාගත අප ආනන්දස්ථවිරයන්වහන්සේ විසින් ආඛ්‍යා නිකායප්‍රකාශනානුග්‍රහ පූර්වක ව **පදසාධනප්‍රකාශය** නම් වූ මේ අතිප්‍රශස්ත ව්‍යාඛ්‍යානය කර වදාරන ලද්දේ ය.

මේ පර මෙබඳු ව්‍යාකරණග්‍රන්ථයනට ව්‍යාඛ්‍යාන නිපදවනු වස් ආරම්භ කරන්නවුන් ශාස්ත්‍රවිෂයෙහි අප්‍රතිහතඥානමහත්ත්වය ඇති උතුමන් ම බැව් පූර්ණ සත්‍යග්‍රන්ථ බැලීමෙහි දී වැටහෙන්නේ ය. මේ අප ආනන්දස්ථවිරයන්වහන්සේ ද එපරිදි ශාස්ත්‍රඥානයෙන් පවුත්තර බුද්ධිමත් උතුමෙකැ යි සැලකිය යුතු ය.

මුන්වහන්සේ සවකීය ආචාර්‍යපාදයන්ගේ කල්‍යාණමිත්‍ර වූ ද ගුරු වූ ද සාරස්ථවිලාසිනිප්‍රඥාවිභා, සුසඳුසිඳුසම්බුද්ධවිචිත්‍රතා යන මුඟලන්පරිවාරග්‍රන්ථයන් රචනා කළා වූ සඞ්ඝරක්ෂිත මාහිමියන්ගෙන් උගත් බැව් පෙනේ.

ආනන්ද යතිතුමාගේ ආචාර්‍යවරයෝ.

ව්‍යාඛ්‍යානකර්තෘ වූ ආනන්ද යතිතුමා දිඹුලාගල වනවාසවෙහෙරැ වැඩවසූ දිඹුලාගල පරම්පරාගත අප **ආරණ්‍යක මෙධඞ්කර** මාහිමියන් වහන්සේගේ ශිෂ්‍යවරයෙකි. මේ මෙධඞ්කර මාහිමියෝ විනයාචාර්‍ය සමුච්චය නම් විනයසන්නයෙහි කතුතුමාණෝ ය. මුඟලන් වහන්සේ දිඹුලාගල පරම්පරෙන් පැවත ආ **බුද්ධවංස වාග්විලාසාභිධාන** මහාස්ථවිරපාදයන්ගේ ප්‍රධාන ශිෂ්‍යයාණෝ ය. **මහාශාබ්දික මුඟලන්** මාහිමියන් හා ටීකාචාර්‍ය **සෑඟිසුන්** මාහිමියන් ද සමීපයෙහි උගත්හ. **සඞ්ඝරක්ෂිත** මාහිමියන්ගේ ද ශිෂ්‍යයෙකි. කල්‍යාණමිත්‍රයෙකි. සියලු කටයුතුවල සහායයෙකි. තුන්වෙනි **විජයබාහු වක්ක්‍රම** මහරජාණන් විසින් ශාසන ශෝධනයක් හා කනිකාවහක් ද කරවන ලද්දේ මේ දෙදෙනා වහන්සේගේ ප්‍රධානත්වයෙනි. සඞ්ඝරක්ෂිත මහාස්වාමිපාදයන්ගේ ඇවැමෙන් සඞ්ඝරාජපදවියට පත්වූවෝ ද මේ ආරණ්‍යක මෙධඞ්කර මාහිමියෝ ය.

යථොක්ත විජයබාහු රජතුමාගේ අනිජාතපුත්‍ර වූ පියරජහු ඇවැමෙන් ශ්‍රීබුද්ධවර්ෂ 1779 දී දඹදෙණිනුවරැ රාජ්‍යශ්‍රියට පැමිණි **මහපැණවත් කලිකාලසාහිත්‍යසවිහදපණ්ඩිතපරාක්‍රමබාහු** රජතුමන් විසින් කරවන ලද ශාසනශෝධනයෙහි හා දඹදෙණි සඟිකාථිත සඞ්ඝාදනය කිරීමෙහි ද ප්‍රධානත්වය උසුලන ලද්දේ

මේ ආරණ්‍යක මේධඞ්කර මාහිමියන් විසිනි. එහෙයින් ම මුන්වහන්සේ පණ්ඩිතපරාක්‍රමබාහු රජුගේ කාලයෙහි මාහිමි පදමය ඉසුලූ සේක සි පැහැදිලි වන්නේ ය.

පදසාධනසන්නයකාර ආනන්ද යතිතුමා මේ මේධඞ්කර මාහිමියන්ගේ ශිෂ්‍යයා බැව් නිගමනගාථාවන්ගෙන් පැහැදිලි වන්නේ ය. *

මේ ව්‍යාඛ්‍යානකරණයෙන් පසුකාලයෙහි දී මුන්වහන්සේ පරපුරට අයත් වූ වනරතන සහ උපනාමයෙන් ද යුක්ත ව වනරතන ආනන්ද යයි ප්‍රසිද්ධ වූ බැව් තවද්ශ්‍ය යන්ගේ සානිවලින් පෙනේ. ඒ ශිෂ්‍ය යන්ගෙන් වැඩියෙක් ප්‍රසිද්ධියට පැමිණියේ නම් සිදත්සඟරා, සමන්තකූටවණ්ණනා, රසවාහිනී යන ග්‍රන්ථයන් රචනා කළ වෙදෙහ හිමිපාණෝ ය. වෙදෙහසඵච්චපාදයෝ ආනන්ද යතිතුමාණන්ගේ ගුණ වර්ණනාවෙන් උන්වහන්සේ "මහා ගණ ඇතියාහ, අභස්මඩලෙහි හිරු මෙන් ලෝකුස පතළයහ, බුද්ධශාසනයට ජීවිත වැනියහ, මහාකවියහ, මනා පිළිවෙත්හි සාරයහ, ශාස්ත්‍ර සාගරපාරංගතයහ" සි පවසති. මුන්වහන්සේගේ තවත් ශිෂ්‍ය යෙක් වූ ඉඟානම සථවිරපාදයෝ සඞ්ඝරක්ඛිත මාහිමියන්ගේ සම්බඞ්ගවිභාවනාවට ව්‍යාඛ්‍යානය ලියූහ. එසේ ම ඒ අවසන්හි "ආනන්දසථවිරතුමන්ගේ නෙපස නිසා තැවතිඹ්‍යගණයා කිසි විටෙකත් නොම දුටු නොද ඇසූ ග්‍රන්ථයන්ගේ පවා අවි පහළ කිරීමෙහි සමර්ථ බැව්" ද පවසති. මෙසෙසින් පදසාධනසන්‍ය කාර ආනන්දයතිතුමාණන්ගේ ප්‍රඥාපාටවය සවකීය සම්මුඛශිෂ්‍ය යන් විසින් ම මැනවින් වර්ණිත ය.

සන්‍යසෙයි නාඞ්ග.

එහෙයින් ම උන්වහන්සේගේ මේ ව්‍යාඛ්‍යානග්‍රන්ථය අතීශයින් වැදගත් සි ද ඉගෙන ගනු කැමැති ශිෂ්‍යයන්ගේ මනදොළ පිරවීමෙහි අත්‍යර්ථයෙන් පොහොසත් සි ද සලකා ගත හැකි ය.

මෙහි 60 වෙනි පිටෙහි "බහුලාධිකාරා තු ඞවී විසා[illegible]විධා නඤ්ඤාපත්තියමොහිඞ නීච්චා නොා එවමුපරි වාතියමෝ' යි සුඛබදසිද්ධියෙහි කී නෙසින් ද සුඛබදසිද්ධියෙහි ද වෘත්තියෙහි ද

---

* පඤ්ඤාඅඞ්ගි නම් මූලග්‍රන්ථ පිරිවර පොත කරන ලද්දේ ද වනරතන මේධඞ්කර නම් යතිතුමකු දිසිනි ආනන්ද යතිතුමාගේ හා උන්වහන්සේගේ ඇතැම් අදහස් මැනවින් සැසඳේ. එහෙත් උන්වහන්සේ මේ මේධඞ්කර මාහිමියන්ගෙන් මොබ විසූ බවට කරුණු පෙනේ.

අඤ්ඤිනෝ අඛ්‍යස්ස' යන දෙරූපය මුත් 'අඤ්ඤස්ස' යන රූපය නො දැක්වූ හෙයින් ද මෙහි 'අඤ්ඤස්ස' යන රූපය අධිකය යි දත යුතු යි'.

මේ ආදි ව්‍යාඛ්‍යානවිධියෙන් මුන්වහන්සේගේ ව්‍යාඛ්‍යාන කරණය පිළිබඳ තත්ත්වය සලකාගත හැකි වනු පමණක් නොව මෙකල නාමමාත්‍රාවශිෂ්ට වූ සුඝබදසිද්ධිඝණ්ඨි හත්ත්වය ද * සුසඳු සිදුවී යනු පඤ්චිකාටීකාවට ව්‍යවහාරකරන නාමානතරයෙහි සිටින්නා හැඟීමේ සාවද්‍ය බව ද වටහා ගත හැකි ය.

සන්‍ය රචනා සමය.

ආරණ්‍යක මේධඞ්කර මාහිමියන් සඟරාජපදවියට පත්වීමෙන් පූර්වයෙහි මේ සන්‍යය නිපද වූ බැව් නිගමන ගාථාවන්ගෙන් නිශ්චය කළ හැකි ය. එසේ ඇති කල්හි මෙය නිපද වූ කාලය පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ ශාසනශෝධනයෙන් එපිට බැව් මෙඛඞ්කරමාහිමියන් ගැන ඔට දැක්වුණු කරුණු සසඳා බැලීමෙන් තීරණය කළ හැකි වේ.

ආශ්‍රය.

තවද මේ පදසාධනසන්‍යකාර යතිතුමා විශාරදපාණ්ඩිත්‍යයකින් යුත් අන්‍යතරථෙරතුමකු විසින් අතිසංක්ෂිප්ත ව කළ විරිහසන්‍යය ගුරුහන්ගේ තබා මේ සන්‍යය සම්පාදනය කළ බැව් සැලකිය යුතු ය. ඒ විරිත සන්‍යයෙහි නිසඟීස ඤ්ඤිපනභාවය නිසා ව්‍යාඛ්‍යාන නො කළ තැනක දී මුන්වහන්සේගේ සඛලනමාත්‍රයෙක් විය. එනම් 2:9 පිටෙහි "යං- යමෙක්හිය යන සප්තම්‍යර්ථයෙහි, යතෝ- යනු වේ" යනු හි. මේ ගැන ටීකාකාර මාහිමිතුමා බොහෝ යුක්ති දක්වා ඉක්බිති "අප විසින් දක්වන ලද රූපසාධනක්‍රමය ම සාරවශයෙන් පිළිගත යුතු ය" යනු පැවසීම මේ සන්‍යයෙහි සෙසු තැන්වල පවත්නා සාරවත් ව්‍යාඛ්‍යාක්‍රම නිසා සන්‍යකාරයතිතුමාගේ සඛලනමාත්‍රයෙහි පවා හඳුරන්නන්ගේ සේවාකාර්‍ය ඇති වේ දෝ යන කාලපරිච්ඡේදයෙන් විය යුතු ය. මුන්වහන්සේගේ බොහෝ ව්‍යාඛ්‍යානවිධි ටීකාකාරමාහිමියන් විසින් ටීකාවෙහි ඇතුළත් නොට තිබීම රාහුල්මාහිමියන්ගේ මේ සන්‍යග්‍රන්ථය පිළිබඳ ව තුබූ ගෞරවය හඟවයි.

---

* පාණිනීයට සිද්ධාන්තකෞමුදියත් වාඤ්ඡයට පාණ්ඩිකරණයත් සඛවායන සට රූපසිද්ධියත් යම්සේ නම් මොග්ගල්ලානයට සුසද්දසිද්ධියත් එසේ යි. ප්‍රයොගසිද්ධියත් එබන්දක් හෙයින් මුගලනට එබඳු පොත් දෙකක් පැවැති බැව් පෙනේ.

ආනන්දසථවිරයන්වහන්සේ විසින් කරනලදු සි ව්‍යවහාරයම පැමිණි පදසාධනසත්‍ය දෙකක් ඇත. ඉන්

පදසාධනසත්‍ය දෙකක්.

එකක් නම් මීට සත්විසිවසකට පෙර උගත් දෙඩන්දුවේ ධම්මසෙනමහතා විසින් සංශොධිත ව මුද්‍රිත පොත ය. අනිත අප විසින් සංශොධනයෙන් ප්‍රතිසංස්කාර කළ මේ පොත සි. මේ පොත් දෙක එකම ආවාර්‍යවරයකු විසින් කරන ලදු සි ව්‍යවහාරප්‍රාප්ත නවුදු එය එසේයයි පිළිගැනීමට තරම් වන එක ද හෙතුවකු ත් නැත්තේ ය.

ආනන්ද සථවිරුමාණන්ගේ සත්‍යය කුමක් ද?

ඒ දෙකින් මේ පොතෙහි මූල පටන් අවසානය තෙක් පුරුණ සත්‍යයයෙන් පවත්නා පිළිවෙළ වූ ගැඹුරු තැන් ලිහිල්කොට දැක්වීම, පදවිභාජනයෙන් පමණක් නො වැටහෙන තැන් භාවාර්‍ථය ත් දක්වා පැහැදිලි කිරීම, ව්‍යාකරණ ඉගෙනීමෙහි ප්‍රධාන ප්‍රයෝජනය වූ පදනිඝණ්ඨනිර්ධිය සූත්‍ර දක්වමින් පෙන්වා දීම්, සුදුසු ඛන්ධි ග්‍රන්ථාන්තරයන්හි එන කරුණු ත් ගෙන හැර ලීම, සුගම තැන් සෙසොවින් දක්වා ග්‍රන්ථප්‍රමාණය හැකිතාක් කුඩා කර ලීම ආදි සියලු ව්‍යාඛ්‍යානවර්‍ගයිහු ම එකසේ පවත්නාහු ය. එහෙයින් මේ පොත සත්‍යග්‍රන්ථයක් ලිවීමෙහි සාමර්‍ථ්‍යයෙන් යුත් පණ්ඩිතයෙකුගේ කෘතියකැ සි ද එසින් ම ශාසනාභිවෘද්ධිප්‍රාප්ත ආනන්දසථවිරයන්වහන්සේ විසින් රචිත පදසාධනසත්‍යය නම් මෙය ම යයි ද නිසැක ව එකහෙලා පිළිගත හැකි ය.

පළමු මුද්‍රිත පොතෙහි තත්වය.

මීට පෙර මුද්‍රිත පොත ක්‍රම දෙකකින් යුක්ත ය. එසින් මුල්කොටස සමාප්ත කොට ඇති පිටු දෙකකින් හෙවත් 'වජිරාදිනො ඤානඤාණනා' 4·2 යන සූත්‍රයෙහි මදකින් අවසාන වන්නේ ය. ඒ කොටසෙහි ගුරුවරයකු විසින් ශිෂ්‍යයකුට පදවී කියවන ක්‍රමය විනා පුරාණව්‍යාඛ්‍යාක්‍රම කිසිවක් නැත්තේ ය. අවශ්‍යයෙහි ලියයුතු විස්තරයක් හෝ දුබ්බොධතැන් අදහස් දක්වා සුබොධ කිරීමක් හෝ පදසිද්ධික්‍රම දැක්වීමක් හෝ එහි නැත. ඇත්තේ හුදු පදවීය පමණෙකි. හෙද ආනන්ද සථවිරුමාණන් වැනි උගතෙකුගේ පදවීකථනයක් නොව වරදින්

ගෘහණ වූවකි. මේ සන්නයොටසෙහි ඇති සාවද්‍ය අර්ථකථනයන් මෙය : ශාස්ත්‍රාගම මැනවින් උගත් ආනන්දස්ථවිරයන්වහන්සේ ගේ සත්‍යග්‍රන්ථ යයි පිළිගත් එහෙයින් ම තදනුගත වන. පරිදි පදසාධනය ශුද්ධ කිරීමෙහි යුහුසුළු වූ සත්‍යසහිතපදසාධන ශොධකයන් ලවා මූලග්‍රන්ථය ද දූෂිත කරවන ලදි. එකැවැ ම හෝ වැටහෙන මඳක් දුරවබෝධ වූ හැම තැන්වලදී ම මේ සන්නයොටසෙහි දී නිබෙන අර්ථ විවෙකබුද්ධිය නැතියවුන් මුළාකරවිය හැකි වරදින් ආකුල ය. සුගම වූ බොහෝ තැන් ද නොපිරික්සා වහා අර්ථ කිරීමෙන් ඇති වූ උගතකුගෙන් ඇතිවිය හෝ හැකි තරම් වරදින් ව්‍යාකුල ය. සාරණිය හැඟවීමට තරම් වන උදාහරණ කීපයක් ද මේහි දක්වනු ලැබේ.

සදෙඝව්‍යාඛ්‍යා:- "හි- යම්හෙයකින්, තතෝ- ඒ විශෙෂණයා කෙරෙන්, ජාතා-වූවා වූ ඝණ්ඨිවිභක්තිය, සම්බන්ධං-සම්බන්ධය, වදෙය්‍ය- කියන්නේ ද එහෙයිනි. අඤ්ඤතෝ පන- අනික් විශෙෂ්‍යයා කෙරෙන්, න- ඝණ්ඨිවිභක්ති නොවේ." (පළමු මුද්‍රිත සන්න 30 පිට)

නීවැරදි අර්ථව්‍යාඛ්‍යානය මෙසේ සි:- "කුමක් හෙයින් ද යත්? හි- යම්හෙයකින්, තතෝ ජාතා- ඒ විශෙෂණයා කෙරෙන් වූ නෙළුත් ප්‍රයොග කරන ලද ඝණ්ඨිතොම, සම්බන්ධං-උභයගත සම්බන්ධය, වදෙය්‍ය- කියන්නී ද, අඤ්ඤතෝ- අන්‍ය වූ විශෙෂ්‍යයා කෙරෙන් වූ ඝණ්ඨිතොම, න පන වදෙය්‍ය- උභයගතසම්බන්ධය නො කියන්නී ද එහෙයිනි." (අප විසින් මුද්‍රිත සන්න 44 පිට)

ආනන්දයතිපාදයෝ මෙය උදාහරණයෙන් පැහැදිලි කෙරෙති, "රක්ඛන්ති පුරිසෝ යන මෙහි පරිපාල්‍යපරිපාලනලක්ඛණ සම්බන්ධය යැ. රාජ පරිපාලක යැ; පුරුෂ පරිපාල්‍ය යැ; මේසෙ සම්බන්ධය දර්ශව වුව ද

'දුවෙධා යදිපි සම්බන්ධෝ ඡට්ඨිපපත්ති තු භෙදකා'

යනු හෙයින් විශෙෂණ වූ රජහු කෙරෙන් ඝණ්ඨි වෙයි. විශෙෂ්‍ය වූ පුරුෂයා කෙරෙන් ප්‍රථමා වෙ. කුමක් හෙයින් ද යත්? විශෙෂණයා කෙරෙන් වූ ඝණ්ඨිය වීසින් උභයගතසම්බන්ධය ප්‍රකාශ වන හෙයිනී" සි.

සදෙඝව්‍යාඛ්‍යා:- "සා පනු වේ, සුවාදිතතා- සුවාදි බව හෙයින්, යොනමාණතා ඉතිවා 'යොනමාණතා' 2·159 යන සූත්‍රයෙන්, නීවචං- අවිකල්පමානන්, ආණතා- ආතෝ යනාදෙශ වේ, සාණතා යනු වේ, නෝත්තාභාවෙ- නෝ යනාදෙශ නු වූ ඝණ්ඨියෙහි ද, තථා- එසේවැයි." (පළමු මුද්‍රිත සන්න 47 පිට)

මේ අර්ථකථනය මුද්‍රිත පදසාධනයෙන් "යුවාදිත්‍යා සිසු අා. සානෝ. නොත්තානාවපකෙඛ, 'යොනමානෝ'නි 2.158 වාසී කාරස්ස වවත්‍ථිතවිභාසත්තා නිච්චමානෝ" යන කොටස බැහැර කරමින්මෙහි කරුණු විය.

මෙතැන්හි වුච්චමානා නිවැරදි සම්මූණි අර්ථකථන මෙසේයි:- "සා යනු වේ; යුවාදිත්‍යා- යුවාදි බව හෙයින්, සිසස- සිහට, අා- ආඛ්‍යාතදෙශ වේ. බහුවචනයෙහි සානෝ යනු වේ. නොත්තාහාවපකෙඛ- 'යොනං නොනෙ වා' 2.133 යන සූත්‍රයෙන් නොඋවිය හු වූ පක්‍ෂයෙහි, වාඩිභාරස්ස- වාඩිභාර යා ගෙ වවත්‍ථිතවිභාසත්තා- ව්‍යවස්ථිතවිභාෂා බව හෙයින්, යොනමානොති- 'යොනමානෝ' 2.158 යන සූත්‍රයෙන්, නිච්චං- අවිකල්පයෙන්, අ නෝ- ආනෝ යන ආදෙශ වේ. සානෝ යනු වේ. නෙත්තාහාවපකෙඛ- නෙඋවිය හු වූ පක්‍ෂයෙහි ද, තථා- එසෙ මැයි." (අප විසින් මුද්‍රිත සත්‍ය 70 පිට)

මෙය සුගම් කෙරෙහි ආනඤ්ජිමිපාණෙන්

"යුවාදීන් කෙරෙන් පර වූ ප්‍රථමාද්විතීයා යොවිභක්තීන්ට 'යොනං නොනෙ වා' යි ඔඛල්ප්‍රත්‍යයන් නොනෙ කළ කල්හි, හු වූ පක්‍ෂයෙහි 'යොනමානෝ' යන සූත්‍රයෙන් වන ආනෝ ද විකල්පයෙන් වී නම්, හු වූ පක්‍ෂයෙහි සා සෙ යන අනිෂ්ට ප්‍රසඞ්ගය ද වන්නෙය යන අාසඞ්කායෙන් 'නොත්තානාභාව පකෙඛ' යනාදි කියන ලද 'නෝ' කළ ද 'ආනෝ' කළ ද රූපභෙදයක් නැති බැවින් ප්‍රථමායොහට නිත්‍යයෙන් ආනෝ කරන් ම අාදෙශය ද අනිෂ්ටප්‍රසඞ්ගය ද නො වෙයි. සානෝ යන එකාරූපය ම වෙයි. ද්විතීයායොහට ද නේව්‍ය හු වූ පක්‍ෂයෙහි නිත්‍යයෙන් ආනෝ කළ කල්හි සානෙ සානෝ යන රූපද්වය වෙයි දත යුතු" යි.

සදෙඛ:- "ඉහ- මේ ගුණවන්තා යන තන්හි, අභිධානසාමත්‍ථියා- අභාර කළ සාමර්ත්‍යයෙන්, ගුණවන්තස්ස ඉති- ගුණවන්තස්ස කියා, චරිතත්ථතාය- චරිතාර්ථබව හෙයින්, අභිධානස්ස- අභිධානයාගේ, අපත්ති- අප්‍රාප්ති නොමෝ, න ච- නැති." (58 පිට)

නිර්දෙඛ:- "ඉහ- මේ ගුණවන්තා යන සුන්හි, අභිධානසාම ත්‍ථියා- අභාර කළ සාමර්ත්‍යයෙන්, අපත්ති- වාදෙශයාගෙ අප්‍රාප්ති නොමෝ, න ච- නොම ඇති. කුමක් හෙයින් ද යත්? ගුණවන්තස්සාති- ගුණවන්තස්ස යන මේ ආදියෙන්,

අවිඛාකස්ස- අවිඛාකස්ස ගෙ, මරිනඛකාය- මිරිනාඛ බව හෙයිනි." (85 පිට)

මෙය මදක් දුරවබෝධ තැනකි. එහෙයින් ආනන්ද හිමි පාණෝ භාවය ද දක්වා එය සුබෝධ කෙරෙති,

"අගහයෝ, මුනයෝ යනාදියෙහි මෙන් අවිඛානසංඛ්‍යයෙන් ලයාහට වා නු වුවමනා වේ ද යත්? අවිඛානය ගුණවනාසස යනාදියෙහි වරිනාඛ බව හෙයින් මේ තැන්හි වාදෙකය වේ ම ය යනු භාවයි" යි.

සදෙඛ:- "ඉඡියමඛානි- ඉඡියමඛා යන සූත්‍රයෙන්, ආපපච්ච යෝ- සන්ලිඟුයෙහි වැටෙන්නා වූ අකාරානනයා කෙරෙන් ආප්‍රත්‍යය වේ. සරලොපෙ ච කතෙ- පූජීසවරයා ලොප් කළ කල්හි." (72 පිට)

මේ අවිව්‍යාඛ්‍යානය ද සන්‍යශොඛකයන් ලවා පදසාඛනය පවා දූෂිත කරවී.

නිර්දෙඛ:- "ඉඡියමඛානි- 'ඉඡියමඛා' 3.26 යන සූත්‍රයෙන්, ආපපච්චයෙ- ආප්‍රත්‍යය ද, සරලොපෙ ච කතෙ- සවර ලොප් ද කළ කල්හි." (106 පිට)

සදෙඛ:- "රත්‍යාදීහි- රත්‍තිඛඳාදීන් කෙරෙන්" (50 පිට)

නිර්දෙඛ:- "රත්‍යාදීහි- රත්‍තිආදි ඛඳයන් කෙරෙන් පර වූ" (75 පිට)

සදෙඛ:- "සවිසයෙ- සවකීය වූ පුලලිඟුවිඛයෙහි" (74 පිට)

නිර්දෙඛ:- "සවිසයෙ- සවකීය විඛයෙහි" (110 පිට)

සවිසය නම් කිමැ යි පඬ දෙන ආනන්දඛයනිපාණෝ "මෙහි සවිසය නම් 'ඛොනමෙවි' 2.140 යි එවි හදුළ හෙයින් ප්‍රථමා දවිතියා ඛොවිඛය යි" යි පැවසූහ.

මෙබඳු අවියත්කමින් හා නොසැලකිල්ලෙනු ත් භවගත් සිය ගණන් දෙඛයන්ගෙන් දූෂිත වූ මේ කොටස පෙර ඛී නසින් වෙදෙහ, ගෞතම යන දෙශිඛ්‍යයන්ගේ වැණුමට පාත්‍ර වූ ආනන්දයනිතුමාණන් විසින් ව්‍යාඛ්‍යාත ඛ යි සිතීම කෙතරම් සැහැසිකමක් ද? කෙතරම් අපරීඛාවක් ද?

පළමු මුද්‍රිත පොතෙහි වූ මුල්කොටස මෙසේ ධුවත් එහි ම වූ අඟ කොටස නෙවත් තදුභීතයෙහි 'වඡාදිතො ණානණායන

4.2 යන සූත්‍රයෙහි මඳතැනක පටන් පොතේ අවසානය තෙක් ඉතා වැදගත් පුරාණසන්නයක පිහිටියමහා සියලු ව්‍යාඛ්‍යාන විධීන්ගෙන් ම සමන්විත ය. මුල් කොටසෙහි ආ ශිෂ්‍යයන්ට අවශ්‍ය කියවීමේ ක්‍රමය සම්පූර්ණයෙන් ම එහි නැත. එසේ ම මුල් කොටසෙහි මෙන් දෙගඳුම්හකමක් ද එහි නැත. ඒ කොටස් බලන්නවුනට මෙය නම් පඬිවරයකු විසින් කරන ලද වැදගත් පුරාණසන්නයක කොටසකැ සි එනහෙලා ම වැටහෙන්නේ ය. එනෙසින් ම මෙය අනෙනක් නොව ආනන්දයතිතුමන්ගේ පදසාධනසන්නය වූ අප විසින් සංශොධිත මේ පොතෙහි අවසානභාගය ම යසි සිතිය යුතු ය. පොත් දෙකෙහි ම අවසානභාග සසඳා බැලීමේ දී දෙකක් නැසි බවත් ඇත්තේ එකක් ම බවත් වැටහෙයි.

පොත් දෙකෙහි ප්‍රමාණය.

ප්‍රමාණවශයෙන් බලන කල්හි අප විසින් මුද්‍රිත සන්නය පිටු 303 කින් යුක්ත ය. පළමු මුද්‍රිත සන්නයෙහි ඇත්තේ පිටු 199 යකි. එවිට අප සන්නයෙහි පිටු 104 ක් අධික බැවි පෙනේ. මෙසින් පිටු 72 ක් ම වැඩි වූයේ මුල් සන්න කොටසිනි. මෙසින් පොත් දෙකේ මුල් කොටස් දෙකෙහි එකිනෙකට ප්‍රමාණයෙන් ඇති වෙනස්කම් ද පැහැදිලි වෙයි. මේ වෙනස්කම ඇති වීමට ප්‍රධාන හෙතුව නම් මේ සන්නයෙහි තිබෙන ආනන්ද යතිතුමන් විසින් අවශ්‍යයෙන් විස්තර කළ යුතු කරුණු පිළිබඳ ව කල කිසි ද විස්තරයක් ඒ කොටසෙහි විද්‍යමාන නොවීම යි. ආනන්ද යතිතුමාගේ ඒ විස්තරයන් කෙබඳු දැ යි සංඥපනයෙහි 12, 13, 14 පිටුවලින් බලාගත හැකි ය. පොත් දෙකේ ම අවසාන කොටස් සමාන ව තිබියදීත් පිටු 32 ක් මේ පොතෙහි වැඩි වූයේ පැහැදිලි ලෙස ඇත් කළ යුතු පද ඇත් කොට මුද්‍රණය කිරීම, සූත්‍රයන්ගේ අඛණ්ඩ කෙදීම, පළමු මුද්‍රණයෙහි දී අතහැරීගිය දැ ඇතුළත් කිරීම යනාදි හෙතූන් නිසා යි. ඒ විනා ඒ කොටස් දෙක්හි ප්‍රමාණයෙන් හෝ කරුණුවශයෙන් හෝ පවත්නා අසමාන කමක් නිසා නොවේ.

අලුත් පොත ඇති වූයේ කොහේද?

ඇත්ත වශයෙන් ආනන්දයතිතුමාගේ සන්නයට වඩා අනෙකෙහි වෙනස්කම් ඇත්තේ 'වඤ්ඣදිතෝ' 4.2 යනාදි සූත්‍රයෙහි මඳ තැනක් දක්වා වුවත් මේ දෙක කලක පටන් ම පොත් දෙකක් වශයෙන් පවත්නා බැවි පෙනේ. සුත්තෝකපා කරුණු පිළිබඳ ව පරිකථාකාරි ව සලකා බැලීමෙන් විටහා ගත හැකි හෙතූන්ගෙන් මේසේ කිව්:-

ආනන්දස්ථවිරයන්වහන්සේ විසින් කරන ලද මේ පදසාධන සන්නය ක්‍රමයෙන් පැවතෙන අතර කලක දී ශබ්දශාස්ත්‍රය වඩා නුදන් ගුරුවරයකු කෙරෙන් අවී සියවා ගන්නා ශිෂ්‍යයකු විසින් ඒ සඳහන ලද අවී යථොක්තසථානය දක්වා (මෙතැලත් ඇතැම් ශිෂ්‍යයන් වෙන්) ලියා තැන්පත් කර ගන්නා ලදි. හෙද වැදගත් අවී ලිපියකැ සි සැලකූ කිසිවකු විසින් නැවැත් වූ තැන පටන් අවසානය තෙක් අඩාළ නොවස මේ පුරාණ සන්නයෙන් ලියා පොත සම්පූර්ණ කරන ලදි. එයේ ලියා ගත් කොටස් දෙකකින් යුත් පොත ත් පුරාණසන්නය මෙන් ම ක්‍රමයෙන් පැවත ආයේ ය යනු සි.

කවර කාලයක දී ද?

මේ අලුත් අවී ලිපි කොටස ඇති වූ කාලය නිශ්චය වශයෙන් කිය නො හැකි ය. එසේහත් කරුණු පරීක්ෂා කරන විට මෙය කොටගමුවේ සිරි රහල් මාහිමියන්ගෙන් පසු කාලයෙහි ඇති වූ බැවී සලකා ගත හැකි ය. සිරිරාහල්මාහිමියන්ගේ පදසාධන ටීකාව ඉදිරියෙහි තබා ගෙන ගුරුවරයා විසින් පදසාධනයට අවී කියවා තිබෙන බැව් සිතා ගැනීමට යුතුකම් ඇති හෙයිනි. ඒ අවී කොපියෙහි සූත්‍රයන් ගැන කියවන "අආදයෝ තිහාලීස වණ්ණා යනු වණ්ණසංඥාවිධානසූත්‍ර සි. අආදයෝ යනු සංඥීනිදේශ ප්‍රථමා බහුවචනාන්තපදය; තිහාලීස යනු සංඥීවිශෙෂණ වූ සංඛ්‍යා නිදේශ ප්‍රථමෙකවචනාන්තපදය; වණ්ණා යනු සංඥානිදේශ ප්‍රථමාබහුවචනාන්තපද සි." යනාදිය ග්‍රන්ථයාගේ ලඝුභාවය ම පරමාවී කොට ගත් පුරාණසන්නයන්හි විද්‍යමාන නො වූවත් දැනුත් සූත්‍රයන්ට අවී කියවන ආචාර්යවරයන් විසින් පුරුදු පුහුණු කරවන අවී වාචනාමාර්ගයෙකි. මේ ද මේ කොටස ගුරුවරයා වෙතින් කියවා ගත් අවී ලියා ගැනීමෙන් නිපන් බවට හෙතුවකි. මේ විස්තරය යථොක්ත ආචාර්යවරයා විසින් පදසාධනටීකාවෙන් ගන්නා ලද්දක් සි සිතිය හැකි ය. පදසාධන ටීකාවෙහි දැඩොඩ වූ සියලු සූත්‍රපදයන් ගැන ම මේ විස්තරය දක්වා තිබේ. ඒ ක්‍රමය ගෙන එහි නො එන සුගමපදයන්ට ත් තමන් ඒ විස්තරය කියවා මුළු කොටස ම එසින් යුක්ත කළා සිය හැකි ය. පදසාධනටීකාවෙහි වූ පාළිපාඨය ම, සිංහල කිරීම් විශෙෂයන් අවී කී තැන් ද මෙහි බොහෝ ය.

මේ නිදසුනක් මෙසේ යි:-

පුරාණසන්නය.	පදසාධනසිකා.	අලුත් අර්ථකථාව.
1 සංහිතායං- සංහිතා යෙහි	1 සංහිතායඤ්ඤි සන්ධි සූත්‍රෙ	1 සංහිතායං- සන්ධිසූත්‍ර යෙහි
2 අධිකාරෝ- වැටීම, සබ්බ සන්ධිසූ- සියලු සංහිතා යෙහි ම වේ.	2 අධිකරියතීති අධිකා රෝ; නියුජ්ජති සම්බන්ධති නි අත්ථෝ. සබ්බසන්ධි සූනි සබ්බසූ සන්ධි සූත්‍රෙසූ.	2 සබ්බසන්ධිසූ- සියලු සංහිතා සූත්‍රයන් කෙරෙහි, ...අධිකාරෝ- සම්බන්ධ කිරීම වේ.
3 දීඝෙ- දීඝ කාදෙ සන්ධි	3 දීඝෙනි 'බ්‍යඤ්ජනෙ දිඝ රස්සා' දීඝෙ.	3 දීඝෙ- 'බ්‍යඤ්ජනෙ දිඝ රස්සා' යන සූත්‍රයෙන් දීඝ කළ සන්ධි
4 සද්දෙන- ශබ්දයන්	4 සද්දෙන- නාමෙන	4 සද්දෙන- නම්න්
5 ව්‍යාපකාදිපරතද නෝ- ව්‍යාපකාදි ප්‍රභෙද හෙයින්	5 ව්‍යාපකාදිපරතෙදතෝ නි ව්‍යාපකාදීනං ව්‍යාප කඛපසිලෙසිඝාවෙස සිඝසම්පිකාධාරානං පකාරතොනි අත්ථෝ.	5 ව්‍යාපකාදිපරතෙදතෝ- ව්‍යාපකාදි ප්‍රභෙද හෙයින් හෙවත් ව්‍යාපකා ඔෂ්ඨපශ්ලේෂ සාමීප්‍ය වෙෂධිඝ ප්‍රභෙද හෙයින්
6 යථා- යොමිහක්ඛී න්ට,	6 යථානන්ති පඨමාදුනියා යොමිහත්ථිනං	6 යථා- ප්‍රථමාවිභක්තිය යොමිහක්ඛිංට
7 වුත්තියා එව- ව්‍යා ඛ්‍යාය ම සින් ම	7 වුත්තියායෙවානි සුත්ත පෙත්තෙව.	7 වුත්තියායෙව- සූත්‍රාර්ථ යෙන් ම

මේ කාරණු ගැන සලකා බලන විට කොටස් දෙකින් මිශ්‍රිත පොත සිරිරාහුල් මාහිමියන්ගෙන් මොබ ඇතිවූවකැ සි නිශ්චය කිරීම සුදුසුසඟහට වන්නේ ය.

ලුත් සොත බුදුරජාණ ඒම හා එකි ප්‍රාතිහාර්‍ය.

අලුත් පොත ත් පුරාණපත්‍රයන් යන දෙකම අවුරුදු සියගණනාක් මුළුල්ලෙහි පඨනපාඨනයෙහි හොයෙදීමෙන් ඇතිවූ දෝෂයන් ගෙනුත් අනියාහට ලියා ගෙන ඊමෙහි දී ලිපිකරු වන් ගෙන් ඇතිවූ භ්‍රමයන් ගෙනුත් විශෙෂතයන් අලුත් පොතෙහි මුල් බොවිස අපි හියවූ ආචාර්‍යයාගේ උදානගාථාත්‍රඥතහෙතු වෙන් ඇතිවූ දෝෂයන් ගෙනුත් සැලකිළිවම පැවැතිණ. මේ අතර ධම්මානන්ද මහා මියන් 'ආනන්ද යනිතුන් සළ පදසාධනපුරාණසන්නය'ක් සලසා කොටස් දෙකින් මිශ්‍රවූ

පොත සංශොධිත ම ප්‍රකාශයට පළමුවන ලදි. එහි පොතෙන් තුනෙන් දෙපංගුවක් පමණ පුරාණසන්නයට ඇතුළත් නො වූ වත්, පුරාණසන්නයෙහි එන කිසි ම වැදගත් කරුණක් ඒ කොට සෙහි ඇතුළත් නො වූවත්, පොත ඇති වූ දා පටන් ම පැවත එන අනෙකදෙනෙකුන් ගෙන් ගහණ වූවත් මේ තාක් ම පදසාධනය හදරන්නන්ට බෙහෙවින් උපකාර වූයේ ඒ පොත ය. එහෙත් එය මුද්‍රිත ව පැවතුණු නිසා ම මේ සා වැදගත් ආනන්ද යතිතුමන් විසින් ලියන ලද නියම පදසාධනසන්නය ඉගෙන ගන්නා නවීනයන් අතින් පමණක් නොව උගන්වන ප්‍රවීණයන් අතිනු ත් බොහෝ සෙයින් බැහැර විය. එය ආනන්ද මහාස්ථවිර පාදයන් වහන්සේ විසින් ලියන ලද ව්‍යාඛ්‍යානය සි ප්‍රකට වූ හෙයින් හා තමන් බලාපොරොත්තු වන අර්ථය යම්තමකින් නමුත් එයින් සිදු වූ හෙයිනු ත් ය. එහෙයින් ම මෙපමණ කලක් මේ වැදගත් ග්‍රන්ථය මනාශුද්ධියකින් තබා සාමාන්‍යශුද්ධි යකින් වත් සුඛාන ව මුද්‍රණය වී පරිශීලනය කරන්නන් අතට පත් නො වී ය.

පුරාණසන්නය ශොධනයට හෙතුව.

මේ අතර 'පදසාධනය මනා ශුද්ධියකින් සුඛාතව මුද්‍රණය කළ හොත් මැනවැ' සි මාතර වැලිවේ රියේ මහාමනනිඳ පරිවෙණාධිපති අප බඹරුන්දේ **ධම්මකිත්තිශ්‍රීධම්මාවාසා** භිධාන නායක ස්ථවිරයන් විසින් කරන ලද ආරාධනාව සාදරයෙන් පිළිගෙන එහි ඉඳුණු අපට පුරාණසන්නය මුද්‍රිත ව නො පැවතීම ශබ්දශාස්ත්‍ර දිවුනු වට බලවත් බාධාවක් බැව් වැටහිණ.

එසේ ම "පොතෙහි මහාඝ්‍රර්ථය, ප්‍රයොජනබහුය කෙතරම් වුව ද දැනට පවත්නා මේ අනාථ බව, උගතුන්ගේ අභාවිතය තව කලක් මෙසේ ම පැවතිය හොත් ඉතා නුදුරු වූ ම අනාගතයෙහි දී මේ පොත නෂ්ටප්‍රාය වන්නේ මැනු" යන චිත්තාව බලවත් සේ අප තුළ ඇති විය. "පුරාණාවාසීවරයන්ගේ පොත්පත් ආදි කෘති හැකි තාක් දුරට නො කැඩිය දී රැක ගැන්ම නවීනාවාසීවරයන්ගේ ප්‍රධාන යුතුකම් විය යුතුය" සි සිතට එකඟ ව මේ පිළිගන්නා අපි යථොක්ත චින්තාව විසින් මෙහෙයන ලද්දමෝ මේ පදසාධනපුරාණසන්නය පිළිබඳ සංශොධනයෙහි උදයුක්ත වූමු.

උපකාර වූ පොත්පත්.

මේ සංශෝධනයෙහි දී අප ගලගෙදර ශ්‍රී ධර්මසිද්ධිනයාභිධාන ගුණරත්නාභිධාන මහතුමාගේ ගිරිවිජයසුන්දරාරාමවිහාරයෙහි අනු නායකස්ථවිරයන්වහන්සේගෙන් හා කෝට්ටේ සිරි පැරකුම්බා පරිවෙණාධිපති උපාධ්‍යායගත අප මාදිවෙල මඟඟල ධර්මකීර්ති ශ්‍රී අනවමදර්ශ්‍යභිධාන අනුනායක ස්ථවිරයන්වහන්සේගෙන් ද ගල්කෙමේ විහාරාධිපති අග්ග නාරා ප්පරියේ රතනපාලස්ථවිරයන්ගෙන් හා බුද්දියාගම නොතුරු කඩුපව් පුරාණ රජමහාවිහාරවාසී අප බුද්දියාගම ගුණරතන ස්ථවිරයන්ගෙන් ද ලැබුණු පුරාණපදසාධනසත්‍ය පුස්කොළ පිටපත් හා අප විද්‍යාලඞ්කාරපිරිවෙන්හි පුස්කොළ පිටපත ද මුද්‍රිත පදසාධනසත්‍යය හා විරිතසත්‍යය ද බොහෝ උපකාරී වූ බැවි කිය යුතු ය. මේ හැර නොයෙක් පෙළවියරණපොත් හා සකුවියරණපොත් ද ඇසුරු කිරීමට සිදු විය.

පදසාධන පුරාණසත්‍ය සංශෝධනය.

විරකාලයක් අභාවිතබවට පත්ව තුබූ මුගලන්වියරණ පිළිබඳ පරිවාරග්‍රන්ථයන් කොපමණ දුරට දූෂිත ව පවත්නේ දැයි හැඟවීමට දීඝීවාක්‍ය ලිවීම අනවශ්‍ය ය. පොත් පත්වල තත්ත්වය දන්නා බුද්ධිමතුන් හමුවෙහි එය ප්‍රකට වූවක් හෙයිනි.

'මේ පොතෙහි ශුද්ධිය ඉතා ඕනෑවැ' යි අපේ සිතට පිළි ගැනෙණ පරිද්දෙන් පොත සකස් කිරීමෙහි අපට ඇති විවේක කාලය හා ශක්තිය ද යෙදුවු. පොතෙහි ඔදක් අඩු තුනෙන් දෙපංගුවක් පමණ මීට පෙර කිසි විටෙක ත් මුද්‍රණය නො වූ වක් බැවින් එහි වූ ලිපිකරහුම පවත් සියලු මල ම ඉවත් කරන්ට අපට සිදු විය. මදක් වැඩි තුනෙන් එකපංගුවක් පමණ වූ පොතෙහි අග කොටස මින් පළමු මුද්‍රණය කළ පොතෙහි ඇතු ළත් හෙයින් ශෝධිත වූවකි. එහෙත් මුගලන්ව්‍යාකරණයාගේ පුනරුද්දීපනියේ යම්තම් පවත්ගැනුම් සම්ය වූ එහෙයින් ම මුගලන්වියරණ පිළිබඳ දැනුම බෙහෙවින් ඕන වූ ඒ කාලයෙහි ශුද්ධ කරන ලද මුගලන්වියරණ පිරිවරපොත් මනාශුද්ධියකින් යුක්ත නො වන්නේ නම් හේ පුදුම විය යුත්තක් නො වේ. මතා ශුද්ධියකින් යුක්ත වී නම් හේ ම පුදුමයට කාරණීයකි. එහෙයින් ම ඒ කොටසෙහි ද ශුද්ධ විය යුතු නොයෙක් තැන් අපට හමු ව අපේ ශුද්ධියෙන් සංශෝධිත බවට පත් විය. මේය මුගලන්පඤ්චිකාව මෙන් නෂ්ටප්‍රාය වූ එක

පුස්කොළ පොතකට සිමා වූ එක ම පිටෙහි විසි තිස්පොළොස් අකුරු හා පද පමණක් නොව වාක්‍ය ද අඩාල වූ "ව්‍යාඛ්‍යානාගේ අහොසාලත්‍යයෙන් විරකාලයක් නො හදුළ ශාස්ත්‍රානන්තර නයාකූල වූ ඒ පඤ්චිකාව විභාවෙනු ත් දුර්බෝධ ය" යනාදීන් අභිභාෂාපරමේශ්වර මහාපණ්ඩිවරයන් විසිනු ත් ප්‍රකාශ කළ ගුණ බැව් ඇති පොතක් නො වන හෙයින් මෙහි ගුද්ධිපත්‍රයක් යොදන්නට සිදු නො විය.

පොතෙහි අවසානයට පරිශිෂ්ටසංග්‍රහයක් වශයෙන් පද සාධනයෙහි එන සියලු සූත්‍රයන්ගේ හා සියලු උදාහරණප්‍රත්‍යුදාහරණපදයන්ගේ අකාරාදික්‍රමයෙන් අනුක්‍රමණිකාව සකස් කොට යොදන ලදි. සාධිතෝදාහරණප්‍රත්‍යුදාහරණපදයන්ගේ අකාරාදිය යෙදීමේ සිරිතක් ලක්දිව ව්‍යාකරණ පොත්වල නැති වුවත් මුගලන්ප්‍රකරණයෙහි එය යෙදීමේන් ලත් විපුල ප්‍රයෝජනය අපට ම ප්‍රත්‍යක්ෂ වූ හෙයින් මෙහි ද යොදන ලදි. සූත්‍ර පමණක් සාධාරණ කොට ගනු කැමැති ශිෂ්‍යයන් සඳහා පදසාධනක්‍රියට සූත්‍ර පිළිවෙළ අප විසින් සංශෝධිත පදසාධනයෙහි පවත්නා බැවින් මෙහි එය නොයොදන ලදි. අපට පොත් පත් සපයා දීමෙන් ආධාර කළ පිනැතියන් නැති විමට මහ පැදි තුබූ පොතක් ආරක්ෂා කර ගැනීමෙන් හා ඒ මාර්ගයෙන් මේ සිද්ධ කළ ධර්මශාස්ත්‍රසංග්‍රහයෙනු ත් ජනිත වන පුණ්‍යඵලයට හිමිකාරයන් විය යුතු සි.

මේ පදසාධනසහිත නම් ශ්‍රේෂ්ඨතර ග්‍රන්ථය, පදසාධනය ඇතුළු වූ මුගලන්විය්‍යාකරණ පිළිබඳ සෙසු පොත් හා සමාන, පාලිභාෂාව පවත්නා හෙක් ම නො කැසී, විද්‍යුර්පින්ගේ ධර්මශාස්ත්‍රඥානවර්ධනයෙහි හා ජිනවචනසංරක්ෂණයෙහි ත් කරුණු වෙමින්, මැනවින් පවත්නේ නම් එ තුමා අපගේ ශ්‍රම සාඵල්‍යයට පමණි.

මේඛවට,

කොළඹ දෙමටගොඩ ධර්මාලංකාර විහාරාධිවාසී පැලියගොඩ විද්‍යාලංකාර පරිවෙණාධිපති ත්‍රිපිටකවාගීශ්වරාචාර්‍ය්‍ය උපාධ්‍යායධුරන්ධර **රත්මලානේ ධම්කිර්ති ශ්‍රී ධර්මානන්දනිධාන** කොළඹ ගලාවිහාරාදීන්හිවැසි ප්‍රධාන සඞ්ඝනායක ස්ථවිරයන් වහන්සේ ය.

L. Sri Dharmananda
C. H. P.

14. 9. 32
පැලියගොඩ දී ය.

ප්‍රසන්නවනා

---

1 සංගිශ්‍රියේ යං ජගදේකනාථං
මොහාගවිව්‍රශ්වනබන්ධභාජම්,
ප්‍රඥුදයාමූර්තිමතෙ නමෝ'සතු
තසෙම ජගද්බාන්ධවබන්ධවෙ නඃ.

2 යං සාධු ශ්‍රැතාපි සහස්‍රශඃඒඃ
ප්‍රධ්‍යෑ න තෘප්තිං සමවාප්නුවන්ති
තසෙම නමෝ මුකතිරසොපලිප්ත-
නවාසිධාමාය සභාං මහාය.

3 වයඃප්‍රමාණං ප්‍රරූඪප්‍රමාණං
යෙෂාං පුරා නෙව භවෙත් ප්‍රමාණම්,
නරාමරාධිශශිඛාභනාවුම්බි-
පදාරවින්දාය නමෝ ගණාය.

4 යඝර්ධිමච්ඡ්‍රාවකමුඛ්‍යභාවං
යථාවිවෙදි භගවාන් බහාෂෙ,
බහුව තන්නාමවිභූෂිතාතමා
යතිශ්වරශ් ශාබ්දිකසාර්වභෞමඃ;

5 මහාපරාක්‍රානතිභූජ විජිත්‍ය
මහාප්‍රභාවෙන මනිං මහිපෙ
විධාය ශුද්ධිං ජිනශාසනස්‍ය
ලඞ්කාං සවිතාං ශාසති නිම්මලඞ්කාම්,

6 විරාජිතෙ මූර්ධනි පුරා පුරාං යො
වරෙ'නුරාධාඛ්‍යප්‍රරෙ සමෘද්ධ්‍යා
විනිඃසෘබුද්ධිර් යමිනාං ගරිෂ්ඨස්
සනූපාද්‍යමාරාම්මලඤ්චකාර;

7 යඃ ඵාලිහාෂාං චිරජීවශක්ති-
පූර්ණාං කුශාග්‍රියමතිඃ ප්‍රවක්‍රෙ
නිරාකුලං මාගධශබ්දශාස්ත්‍ර-
මිනූනමාතන්‍ය නිරස්තශඞ්කම්;

8 යශ්චාථ වෘත්තිං විරචය්‍ය තස්‍ය
තත්පඤ්චිකාං ශාස්ත්‍රනයානිතාං ච
ශුද්ධාං වරිෂ්‍යාං විපුලාඊක්ෂිකා-
මන්‍යාසාධාරණතාං ප්‍රපෙදෙ.

9 භ්‍රාජිෂ්ණු තනමාගධශබ්දශාස්ත්‍ර-
මූචෙවසතරාං සංපූජ්‍යතමූර් යතීශාඃ
ශාත්‍රාවිදුතෘන් විධිවත් ප්‍රණිය
ශ්‍රුත්වාකතෙකාන් පරිවාරභූතාන්.

10 තවිඡබ්දශාස්ත්‍රාඛ්ධිවිවිඡෂොයෙ
ශබ්දාවිචින්තාපටවස්සඛීඃ
ජිඥාසවොඊං ඔටවොභවන්නි
විධිතසවොධ්‍යාපකපාදසෙවාම්,

11 මාගීං විකීර්ෂූගීමනාය තෙෂාං
තස්‍යෙව ශිෂ්‍යොයමිනාං ප්‍රශස්‍යඃ
යථාතථං මාගධශබ්දශාස්ත්‍ර-
සාරාවිදර්ශි ප්‍රියදර්ශිනාමා,

12 විධිත්සුනා බාලහිතං නිජෙන
මනීෂිණා මාතුලතල්ලජෙන
රඹහාවිහාරාධිපනාමිතෙන
ව්‍යාපාරිතඃ 'ඤජ්ජින'නාමකෙන

13 සූත්‍රක්‍රමං නාතිසුබොධහූතං
නිරස්‍ය ලඤ්‍යක්‍රමමාදදානඃ
ග්‍රන්ථං ලඝිෂ්ඨං පදසාධනාඛ්‍යං
ප්‍රෙෂ්ඨං ශිශූනොවිදධෙ වරිෂ්ණූ.

14 දඤ්ඩිනනූජොනතිපයොධිපූරෝ-
ලලාසාය යදාලලනුඩෙඕමුදි සා,
වාඤ්ඡාදධෙ සංග්‍රහිතඤ්ච බාලා-
වබොධනං ඤාශ්‍යපඝඞ්ඝරාජෙඃ,

15 ඤාත්‍යායනාබධාවිව ධර්මකීර්ති
බාලාවතාරස්සුකරාවතාරඃ
වරිවෘතීනි ප්‍රියදර්ශිනාමෙනා
රඤානාතෙඃසමින් පදසාධනාඛ්‍යඃ;

16 මෙධඞ්කරාභිධස්‍ය යතීශ්වරස්‍ය
ශිෂ්‍යොවරියාන් විවෘතාං යදීයාම්
ආනන්දනාම්නා මුනිරාවවක්ෂේ
ව්‍යාඛ්‍යාං විශුද්ධාං නිජභාෂයෛතාම්,

17 තච්ඡ්‍රවාගීශ්වරරාහුලාඛ්‍ය-
යතීන්ද්‍රවයෝ'ඛිලශාස්ත්‍රවේදී
ටීකාං මිතිඤ්චං විතතාන බුද්ධි-
ප්‍රසාදනීති ප්‍රථිතාං ච යස්‍ය.

18 ග්‍රන්ථස්‍යාදුකතාඃ පදසාධනාඛ්‍යෝ
ව්‍යාඛ්‍යා ච ඥානන්දයතිප්‍රණීතා
කාලෙ චිරං ගච්ඡති ලෙඛකානාං
භ්‍රමප්‍රමාදෛර් මලිනීබභූව.

19 ගණේන්ද්‍රවයෝ විරරාජ විද්‍ව-
ල්ලේඛාරවිඳ්‍යසදනෙ හරියාන්
ධම්මාවචිත් තීක්ෂ්ණමතිස් ස ධර්ම-
ලොකාභිධානොා මුනිමානනීයඃ;

20 තස්‍යාග්‍රශිෂ්‍යස් ස කුශාග්‍රබුද්ධි-
රහර්නිශං සංසමරණීයනාම්ා
ශ්‍රීධර්මකීර්තීනිපදග්‍රධර්ම-
රාමාඛ්‍යවාගීශයතීශ්වරොා'භූත්;

21 ආවාසීහාරොඬ්ඩනනෙ විදඞ්ඝ්
සඞ්ඝාග්‍රණීරසති තදග්‍රශිෂ්‍යඃ;
ශ්‍රීධර්මකීර්තීර් ගුණවාන් ස ධර්ම-
නන්දනිධානෙනා'භිමතොා යතීනාම්

22 තාංස්තාන් ප්‍රමාදභ්‍රමජාතනෙකාංශ්
තත්‍රත්‍යදෙශානපනීය සම්‍යක්
ගුරූපදෙශානවලම්බ්‍ය ශුද්ධිං
ග්‍රන්ථො ඊවිනාභූදයායස නිත්‍යෙ.

23 වරෙ මිහාතීර්ථපුරෙ මහාදි-
මන්ත්‍රීන්ද්‍රවිද්‍යාසදනාධිනාථඃ
ශ්‍රීධර්මකීර්තීනිපදග්‍රධර්ම-
රාමාභිධානස්සුධියාං ධුරීණඃ

24 නෙතා යතීන්ද්‍රං දිගි දක්ඛිණස්සං
සහඤාති සප්‍රෙම සමායයාවෙ
ශුද්ධිං විධාතුං **පදසාධනස්ස**
විරාගතාවද්‍යගණං නිරස්‍ය.

25 කිඤ්චාපි සෝ'පි ප්‍රභාවීවභාර
යථාභථඤ්ඤින් **පදසාධනාථම්**,
ආනඤ්ජනාම්නා ග්‍රථිතෙන නෙන
න භාව්‍යමෙතෙන පුරාහතෙන.

26 අසන්නිහෙතෝරිතරස්‍ය හස්‍ය
ව්‍යාඛ්‍යානහාගද්වියමිශ්‍රිතස්‍ය
මුද්‍රාං විධාය ප්‍රකටිකාහස්‍ය
සසම්භාරනා'ස්‍යා විදුෂාං සමූහඃ.

27 නෙතෙතෙව දුබ්බාඩි මලෙරතෙසෝ-
රුනාධිසතෙර් ලිපිකාරජාතේඃ
නෙතාවතෙතෂා සම්‍යියාය ශුද්ධිං-
ශිෂ්‍යාඊදෘන්‍ර් බුධචිත්තහර්ත්‍රි.

28 යදෙවිමෙවාවගණයය භූයසී
ත්‍යජෙදිමාමසාමිතා භවෙන් භූ?
ඉති ස්ම චින්තා සමුදෙති නිත්‍යං
සා චොදයාමාස විශොධනෙ'ස්‍යාඃ.

29 විශොධිතෙෂ ශ්‍රීමති සෞගතෙ'බෙද
බාණාදිසිඩ්ඩෙ මෙගරාජරාශෙෂ
ප්‍රතේත්‍ය සතාං බාලනිතාය වෘද්ධ්‍යෙ
ස්‍යාත්තාං නථා- ශ්‍රීඝනශාසනස්‍ය.

30 අද්‍ය්‍යභවමසමාභිරතෙ'ප්‍රමෙඛ-
මත්‍රාවශිෂ්‍යවං ඝකලිනං යදි ස්‍යාන්
විවෙකිනෙ මන්‍දධියං භිභාවීං
නාඤමාශ්‍රිත්‍යමිහනනි භි සප්‍රමාණම්.

ඉති ශම්

සන්‍යාසහිත

පදසාධනය.

නමෝ තස්ස භගවතෝ අරහතෝ
සම්මාසම්බුද්ධස්ස.

බුද්ධම්බුජං නමයසිත්වා සද්ධම්මඩුභාජ්නං
ඝුණාමොදපදං සඞ්ඝමධුබබතනිසෙවිතං

මොග්ගල්ලායනාවරියවරඤ්ච යෙන ධීමතා
ඤාතං ලහුමසඤ්ඤිඛමනූනං සද්දලක්ඛණං

ආරභිස්සං සමාසෙන බාලත්ථං පදසාධනං
මොග්ගල්ලායනසද්දත්ථරතනාකරපඩිනිං.

සඤ්ඤූපරිග්ගහෙනෙව ලක්ඛණෙසු සරාදයෝ
ඤ්‍යන්තීති තමෙවාදෙ දස්සයිස්සං විභාගතෝ.

ශාස්ත්‍රාරම්භයෙහි සදුවාරානුරක්ෂණය පිණිස සතුතිපූජාව වූ ඉෂ්ටදෙවතානමස්කාරාදිය දක්වන්නාහු 'බුද්ධම්බුජං' යනාදි ගාථාත්‍රය උපන්‍යාස කළෝ.

එහි පළමුවෙනි ගාථාවෙන් සතුතිපූජාව වූ ඉෂ්ටදෙවතා නමස්කාර සඳහා දැක්වූ ය; දෙවෙනි ගාථාවෙන් ග්‍රන්ථාරම්භ කාරක යන්ට නමස්කාර සඳහා දැක්වූ ය; තුන්වන ගාථාවෙන් ප්‍රකරණාභිධානාභිධේයාදි සඳහා දැක්වූ ය.

මේ මෙහි සමුදායාර්ථ යැ. අවයවාර්ථ කියනු ලැබේ:-

'බුද්ධම්බුජං මොග්ගල්ලායනාවරියවරං ච නමස්සිත්වා පද සාධනං ආරභිස්සං' යි‍නු මෙහි ක්‍රියාකාරකපදසම්බන්ධ කි.

බුද්ධම්බුජං-සම්බුද්ධ නැමැති පදමය ද, මොග්ගල්ලායනාවරිය වරං වංශමහාචාර්‍යයන නම් වූ ආචාර්‍යෝත්තමයා ද, නමස්සිත්වා-වැඳ, පදසාධනං-පදසාධන නම් වූ ප්‍රකරණය, ආරභිස්සං-කියම්. කෙසෙ වූ දී යත්?

අආදයො තිතාලිස වණ්ණා. 1. 1.

ජීනවච්චානුරූපා අකාරාදයෝ නිගහගීහනත්තා නෙවත්තාලී සකඛරා පවෙච්ඡා වණ්ණා නාම හොන්ති. යථා:- අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ඪ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං ඉති. කාරාදිසඤ්ඤාරෝ උච්චාරණත්ථෝ. 'වණ්ණීයන්ති අත්ථා එතෙහී'ති වණ්ණා. 'අ ආදි-මරියාදාවුච්චාරණා යෙසන්තෙ' අආදයෝ.

සද්ධම්ම-සපයත්‍ථාපනිකනවලෝකොත්තරසද්ධම්මී නාමැති, මධු-ප්‍රෂ්පරසයට, භාජනං-ආධාරවූ, ගුණ-ශීලසමාධ්‍යාදි වූ ගුණ නැමැති, ආමෝද-පුගන්ධයට, පදං-පිහිටවූ, සඞ්ඝ-අෂ්ටායස්‍යීපුද්ගල සඞ්ඝ නැමැති, මධුබබත-භෘඞ්ගයන් විසින්, නිසෙවිතං-සෙවුනා ලද, බුද්ධම්බුජං-සම්බුද්ධ නැමැති පද්මය ද,

ඨිමතා-ප්‍රශස්තවූ බුද්ධි ඇති, යෙන-යම් ආචාර්‍යෝත්තම යක්හු විසින්, ලහුං-අල්පග්‍රන්ථප්‍රතිපත්තිවශයෙන් ලඝු වූ, අසන්දිග්ධං-අනාකුලප්‍රසිද්ධවචනයෙන් කියන ලද හෙයින් සන්දෙහ රහිත වූ, අන්‍වත්ථං-අශෙෂලක්ෂ්‍යය පරිග්‍රහ කළ හෙයින් සම්පූර්ණ වූ, සද්දලක්ඛණං-ශබ්දානුශාසනයෙක්, කතං-කරන ලද ද, (තං) මොග්ගල්ලායනාචරියවරං ච-ඒ මෞද්ගල්‍යායන නම් වූ ආචාර්‍යෝත්තමයා ද, නමස්සිත්වා-වැඳ,

මොග්ගල්ලායන-මෞද්ගල්‍යායන නම් වූ, සද්දත්ථ-ශබ්දශාස්ත්‍ර නැමැති, රතනාකර-රත්නාකරයට, පඨිතිං-මාර්ගයක් බඳු වූ, බාලත්ථං-අව්‍යුත්පන්නජනයා ප්‍රයෝජක කොට ඇති, පදසාධනං-පදසාධන නම් වූ ප්‍රකරණය, සමාසෙන-විස්තාරමධ්‍යමය හැර සංක්ෂෙපයෙන්, (අහං-මම,) ආරභිස්සං-පටන් ගනිම් හෙවත් නියම්.

ලකඛණෙසු-'සරෝ ලොපෝ සරෙ' 1·26 යනාදි එ එ සූත්‍ර ප්‍රදෙශවල්හි දක්වන ලද, සරාදයෝ-සවරාදිසංඥීහු, සඤ්ඤුපරි. ගහහෙතුව-සංඥුපරිග්‍රහයෙන් ම, ඤායන්තීති-දන්නා ලැබෙත් නු සි, තමෙව-ඒ ම සවරාදිසංඥුව, ආදෙ-ප්‍රකරණාදියෙහි, විභාග තො-විභාග හෙයින් හෙවත් වෙන් වෙන් කොට, දස්සයිස්සං-දක්වම්.

අආදයො තිතාලිස වණ්ණා 1·1 යනු වර්ණසංඥාවිධාන සූත්‍ර සි. අආදයො යනු පද යැ තිතාලිස යනු පද යැ වණ්ණා යනු පද සි.

අආදයොනි වත්තතෙ යාව 'බිඳු නිගහීත'න්නි[1·3·] තඤ්ච ඛො 'අත්ථවසා විහතනිච්පරිණාමො'ති සත්තම්‍යන්තමභිසම්බ න්ධියතෙ.

දසාදෙ සරා. 1. 2.

අආදිසඞ්ඛාදිමහි නිද්දිට්ඨා ඔදන්තා දසවණ්ණා සරා නාම හොන්ති. යථා:- අ ආ ඉ ඊ උ ඌ එ ඒ ඔ ඕ. 'සරන්ති-පවත්ත න්තීති සරා.

දසාදෙති වත්තතෙ නීසු වක්ඛමානෙසු.

ජිනවචනානුරූපං- සර්ව්වඥවචනයට සුදුසු වූ, අකාරාදයො- අකාරයා ආදි කොට ඇති, නිගහීතන්තා- නිගහීතයා කෙළවර කොට ඇති, තෙවත්තාලිසක්ඛරා- තෙසාලිසක්පමණ අක්ෂරයො, පවෙඛාං- වෙන වෙන ම, වණ්ණා නාම හොන්ති- වර්ණියො නම් වෙත්. යථා-එ මෙසෙ සි:- අ ආ ඉ ඊ-පෙ-ය ර ල ව ස හ ළ අං ඉති- සරලවසහළඅං යන මොහු සි.

කාත්‍යායනයන් විසින් සංඝකෘතානුසාරයෙන් එ ඔ දෙදෙන දීර්ඝයො ම ය සි ගෙන 'අක්ඛරාපාදයො එකවත්තාලිසං'[1·1·2] සී එක්සාලිස් අක්ෂරකෙනොක් දක්වන ලදහ. එසෙ කීම සෙයෙහා, සොඪී යනාදි ප්‍රයොගයෙහි හ්‍රස්ව එඔකාර පැනෙන බැවින් අයුක්ත නු සි මෙහි හෙසාලිසෙක් දක්වන ලදහු සි.

කකාරාදිසු- කකාරාදීන් කෙරෙහි, අකාරො- අකාර තෙම, උච්චාරණත්ථං- සුඛොච්චාරණය ප්‍රයොජන කොට ඇත්තෙ සි. ඒතෙහි-මොවුන් කරණ කොට ගෙන, අත්ථං-අර්ථය තෙම, වණ්ණී යතීති- වර්ණිතා කරනු ලැබෙ නු සි, වණ්ණා- වර්ණියො නම් වෙත්. අ-අකාර තෙම, ආදි-ය සි සෙසී, මරියාදභූතො-හිම් වූයෙ, යෙසං-යම් වර්ණි කෙනකුන්ට ද, තෙ-ඔහු, අආදයො-අආදීහු නම් වෙත්.

'බිඳු නිගහීත'න්නි[1·3]-බිඳු නිගහිතං යන සූත්‍රය, යාව-යම්තාක් ද එතාක්, අආදයොති-අආදයො යනු, වත්තතෙ-වැටෙ. තං ච ඛො-එ අනුවර්ත්තිතප්‍රථමාන්තපදය ද, අත්ථවසා-අර්ථවශයෙන්, විහන්නිච්පරිණාමොති-විහකතිච්පරිණාමය වෙ නු සි, සත්තම්‍යන්තං-සප්තම්‍යන්තයවූයෙ, අභිසම්බන්ධියතෙ-සම්බන්ධ කරනු ලැබේ.

දසාදෙ සරා[1·2] යනු සවරසංඥාවිධානසූත්‍ර සි. දස යනු පද යෙ ආදෙ යනු පද යෙ සරා යනු පද සි.

මෙ මෙ සවණණා. 1. 3.

අආදිසවාදිමෙසු දසසු දෙව දෙව සවණණා නාම හොනති යථාරහමං. යථා:- අආ ඉති, ඉඊ ඉති, උඌ ඉති, එඒ ඉති, ඔඕ ඉති. 'සමානා-සදිසා වණණා' සවණණා; සමානතතසඳව ඨානතො.

ඡ වණණානං හි උපපතතිටඨානානි කණඨතාලුමුධදනත ඔටඨනාසිකාවසෙන. තෙසු අවණණභාවගගහණානං කණෙඨා ඨානං; ඉවණණවවගගයානං තාලු; ටවගගහරළානං මුධා; තවගගලසානං දනතා; උවණණපවගගානං ඔටඨා; එවණණසස කණඨතාලු; ඔවණණසස කණෙඨාටඨා; වකාරසස දනතොටඨා; නිගගහීතසස නාසිකා; ඞඤණනමානං සකටඨානං නාසිකා ච.

දෙව දෙවති වතතතෙ.

අආදිසු- අආදීන් අතුරෙහි, ආදිමහි නිදදිටඨා- ආදියෙහි දක්වන ලද, ඔදනතා-ඔකාරයා කොළුවර කෝට ඇති, දසවණණා-වණියො දසදෙන, සරා නාම හොනති-සවරයො නම් වෙත්. යථා-එ මෙසෙ සි:- අආ-පෙ-ඔඕ යන මොහු සි, සරනති-ය සි සෙ සි, පවතතනතීති-ඔප්‍රධානභාවයෙන් පවතින්ත් හු සි, සරා-සවරයො නම් වෙත්. වකඛමානෙසු තීසු-මතු කියනු ලබන තුන් සූත්‍රයෙහි, දසාසෙති-දසදෙ යනු, වතතතෙ-වැටෙ.

මෙ මෙ සවණණා[1·3] යනු සවණීසංඥවිධානසූත්‍ර සි. දෙව දෙව යනු පද යැ සවණණා යනු පද සි.

අආදිසු-අආදීන් අතුරෙහි, ආදිමෙසු දසසු-ආදියෙහි වූ සවරයන් දසදෙනා අතුරෙහි, දෙව දෙව-දෙදෙනෙක් දෙදෙනෙක්, යථාරහමං-පනතීන්, සවණණා නාම හොනති-සවණියො නම් වෙත්. යථා-එ මෙසෙ සි: අආ ඉති-අආ සි-පෙ-ඔඕ ඉති, ඔඕ යන මොහු සි. සමානා-ය සි සෙයි, සදිසා-සදෘශ වූ, වණණා-වණියො, සවණණා-සමානවණියො නම් වෙත්. සමානතතං ව-සමාන බව ද, ඨානතො-සථාන හෙයිනි.

හි-එසෙ මැ සි, වණණානං-වණියන්ගෙ, උපපතතිටඨානානි-උපපතතිසථානයො, කණඨ-කණඨ යැ, තාලු-තල්ල යැ, මුධ-මුදුන යැ, දනත- දනතයො යැ, ඔටඨ- ඔෂ්ඨදවය යැ, නාසිකා වසෙන-නාසිකාව යැ යන මොවුන්ගෙ වශයෙන්, ඡ-සදෙනෙකි.

තෙසු-එ සථානයන් සදෙනා අතුරෙහි, අවණණ-අවණී යැ, කවගගහානං- කවගී යැ හකාර යැ යන මොවුන්ව, කණෙඨා-කණඨය තෙම, ඨානං හවති-සථාන වෙ. ඉවණණ-

පුබ්බා රස්සෝ. 1. 4.

තෙසෙවව දසසු යෙ දෙව දෙව සවණ්ණා තෙසු යෙ යෙ පුබ්බා සෝ සෝ රස්සසඤ්ඤ හොති. යථා:- අඉ උ ඒ ඔ.

තෙසු සංයොගපුබ්බාව දිස්සන්ති දෙව පන්නකිමා;
දීපෙතුං තස්ස සාධ්‌ත්තං තෙසම්පි ඉධ සඞ්ගහෝ.

'රස්සකාලයොගා තබ්බන්නතාය වා' රස්සා; තථා දීඝා.

ඉධාපි දෙව දෙවෙති වත්තතෙ.

ඉවණ්ණේ යැ. වවග්ගයානං- වවගී යැ යකාර යැ යන මොවුන්ට, තාලු-තල්ල, (ඨානං භවති-ස්ථාන වෙ.) ටවග්ග- ටවගී යැ. රළානං-රෙළු යැ ළකාර යැ යන මොවුන්ට, මුද්ධා- මුදුන, (ඨානං භවති-ස්ථාන වෙ.) තවග්ග-තවගී යැ, ලසානං-ලකාර යැ සකාර යැ යන මොවුන්ට, දන්තා-දන්තයො, (ඨානං භවන්ති- ස්ථාන වෙත්.) උවණ්ණුපවග්ගානං- උවණ්ණේ යැ, පවග්ගී යැ යන මොවුන්ට, ඔට්ඨා-ඔෂ්ඨයො දෙදෙන, (ඨානං භවන්ති- ස්ථාන වෙත්.) එවණ්ණස්ස- එවණ්ණයහට, කණ්ඨතාලු-කණ්ඨය හා තල්ල, (ඨානං භවති- ස්ථාන වෙ.) ඔවණ්ණස්ස- ඔවණ්ණයහට, කණ්ඨොට්ඨං-කණ්ඨය හා ඔෂ්ඨද්වය (ඨානං භවති-ස්ථාන වෙ.) වකාරස්ස-වකාරයහට, දන්තොට්ඨා-දන්තයන් හා ඔෂ්ඨ ද්වය, (ඨානං භවති-ස්ථාන වේ.) නිග්ගහීතස්ස-නිග්ගහීතයහට, නාසිකා-නාසිකා තොමො, (ඨානං භවති-ස්ථාන වෙ) ඞඤ්ඤණන මානං-ඞඤ්ඤණනම යන මොවුන්ට, සකට්ඨානං-තමතමන්ට කී ස්ථාන හා, නාසිකා ච-නාසිකා තොමො ද, (ඨානං භවති-ස්ථාන වේ.)

දෙව දෙවෙති-දෙව දෙව යනු, වත්තතෙ, වෙ.

පුබ්බා රස්සෝ 1.4 යනු හ්‍රස්වසංඥාවිධානසූත්‍ර යි. පුබ්බා යනු පද යැ රස්සෝ යනු පද යි.

තෙසෙවව දසසු-එ ම ස්වරයන් දසදෙනා අතුරෙහි, සවණ්ණා- සමානවර්ණී වූ, යෙ දෙව දෙව- යම් දෙදෙනෙක් දෙදෙනෙක් ඇද් ද, තෙසු- ඔවුන් අතුරෙහි, යො යො- යමෙක් යමෙක් තෙම, පුබ්බා- පූර්‍ව ද, සෝ සෝ- හෙ හෙම හෙ තෙම, රස්ස සඤ්ඤ හොති-හ්‍රස්වසංඥ ඇත්තෙ වේ. යථා- එ මෙසෙ යි:- අඉඋඑඔ- අඉඋඑඔ යන මොනු යි.

පරෝ දීඝෝ. 1. 5.

. . . අආදිසුවාදිහුතස්සු දසසු යෙ දෙව දෙව සවණ්ණා තෙසු යෝ යෝ පරෝ සෝ සෝ දීඝසඤ්ඤ හොති. යථා:- ආ ඊ ඌ ඒ ඕ.

තෙසු- ඒ හ්‍රස්වයන් පස්දෙනා අතුරෙහි, අනන්තිමා- අන්ත යෙහි වූ, දෙව පන- වණ්ණියෝ දෙදෙන වත්‍රාහි, සංයොග පුබ්බිරව-සංයොගයහට පූර්‍ව වූවාහු ම, දිස්සතනි- දක්නා ලැබෙති. තත්‍ථ- ඒ සංයොගවිෂයෙහි, සාධ්‍යත්තං- නිෂ්පන්න බව, දීපෙතුං- ප්‍රකාශ කරනු පිණිස, පෙසමපි-ඒ හ්‍රස්වයන් දෙදෙනාගෙ ද, ඉධ- මේ මෙත්‍රාලක්‍ෂණයෙහි, සඞ්ගහෝ- සංග්‍රහය තෙම, (කතෝ-කරනලදි.)

ඒ හ්‍රස්වයන් පස්දෙනා කෙරෙහි ආදි තුන්දෙන අනියත ප්‍රත්‍යයගයහ. අනන්තිම දෙදෙන සංයොගවිෂයෙහි ම පැනෙන බැවින් නියතප්‍රයොගයෝ සි.

රස්සකාලයොගා-හ්‍රස්වකාලයා හා යෙදීමෙන් හෝ, තබ්බන්ත තාය වා- ඒ හ්‍රස්වකාලය ඇති බැවින් හෝ, රස්සා-හ්‍රස්වයෝ නම් වෙත්.

නිමේෂොන්මේෂයන් අතුරෙන් එක්තරා කාලයක් හා සම වූ කාලය හ්‍රස්ව නමැ. ඒ කාලයෙන් යුක්ත හෙයින් * අහෙතුප චාරයෙන් හෝ 'සෝ අස්ස අත්ථි' යන අර්‍ථයෙන් හෝ හ්‍රස්වකාල යුක්තවණ්ණි ද හ්‍රස්ව නම් වේ. දීඝා- දීඝිකාරයෝ ද, තථා- එසෙ මැ සි. දීඝිකාලයොගයෙන් හෝ දීඝිකාලවත් හෙයින් හෝ දීඝී වෙති සි සෙ සි.

ඉධාපි- මේ මත්‍ර කියන සූත්‍රයෙහි දු, දෙව දෙවති- දෙව දෙව යනු, වත්තතෙ-වැටෙ.

පරෝ දීඝෝ 1.5 යනු දීඝිසංඥාවිධානසූත්‍ර සි. පරෝ යනු පද යැ දීඝෝ යනු පද සි.

අආදිසු- අකාරාදීන් කෙරෙහි, ආදිහුතෙසු දසසු-ආදියෙහි වූ සවරයන් දසදෙනා අතුරෙහි, සවණ්ණා- සමානවණ්ණි වූ, යෙ දෙව දෙව-යම් දෙදෙනෙක් දෙදෙනෙක් ඇද් ද, තෙසු-ඔවුන් අතු රෙහි, යෝ යෝ- යමෙක් යමෙක් තෙම, පරෝ- පර ද, සෝ සෝ-හේ තෙම හේ තෙම, දීඝසඤ්ඤ හොති-දීඝිසංඥ ඇත්තෙ වේ. යථා-ඒ මෙසෙ සි:- ආඊඌඒඕ- ආඊඌඒඕ යන් මොහු සි.

---

* 'යුක්ත හෙයින් හෝ'-හැම.

කාදයෝ බ්‍යඤ්ජනා. 1. 6.

අආදිසු කාදයෝ නිග්ගහීතපරියන්තා තෙතාලිංස බ්‍යඤ්ජනා නාම හොන්ති. යථා:- ක ඛ ග ඝ ඞ ච ඡ ජ ඣ ඤ ට ඨ ඩ ළ ණ ත ථ ද ධ න ප ඵ බ භ ම ය ර ල ව ස හ ළ අං. 'බ්‍යඤ්ජීයන්ති අත්ථෝ එතෙහී'ති බ්‍යඤ්ජනා.

කාදයෝති වත්තතෙ.

පඤ්ච පඤ්චකා වග්ගා. 1. 7.

අආදිසු කකාරාදයෝ මකාරන්තා පඤ්ච පඤ්චකා වග්ගා නාම හොන්ති. යථා:- කඛගඝඞ, චඡජඣඤ, ටඨඩළණ, තථදධන, පඵබභම.

'වජෙජන්ති යකාරාදයෝ'ති වග්ගා.

කාදයෝ බ්‍යඤ්ජනා 1·6 යනු බ්‍යඤ්ජනස්ඤ්ඤාවිධානසූත්‍ර යි. කාදයෝ යනු පද යෑ බ්‍යඤ්ජනා යනු පද යි.

අආදිසු- අකාරාදීන් අතුරෙහි, කාදයෝ- කකාරයා ආදි කොට ඇති, නිග්ගහීතපරියන්තා- නිග්ගහීතයා කෙළවර කොට ඇති, තෙතාලිංස-තෙතිස්දෙන, බ්‍යඤ්ජනා නාම හොන්ති-බ්‍යඤ්ජනයෝ නම් වෙත්. යථා- එ මෙසෙ යි:-

කඛගඝඞ-පෙ-අං යන මොහු යි. එතෙහි- මොවුන් කරණ කොට ගෙන, අත්ථෝ- අර්ථය තෙම, බ්‍යඤ්ජීයන්තීති- ප්‍රකාශ කරනු ලැබෙ නු යි, බ්‍යඤ්ජනා-බ්‍යඤ්ජනයෝ නම් වෙත්.

කාදයෝ ඉති- කාදයෝ යනු, වත්තතෙ-වැටෙ.

පඤ්ච පඤ්චකා වග්ගා 1·7 යනු වර්ගසංඤ්ඤාවිධානසූත්‍ර යි. පඤ්ච යනු පද යෑ පඤ්චකා යනු පද යෑ වග්ගා යනු පද යි.

අකාරාදිසු- අකාරාදීන් අතුරෙහි, කකාරාදයෝ- කකාරයා ආදි කොට ඇති, මකාරන්තා- මකාරයා අන්ත කොට ඇති, පඤ්චකා පඤ්ච- පඤ්චකයෝ පස්දෙන, වග්ගා නාම හොන්ති- වර්ගාක්ෂරයෝ නම් වෙත්. යථා- එ මෙසෙ යි:- කඛගඝඞ-පෙ-පඵබභම්ඤන මොහු යි.

යකාරාදයෝ-යකාරාදීන්, වජෙජන්තීති-දුරු කෙරෙත් නු යි, වග්ගා-වර්ගාක්ෂරයෝ නම් වෙත්.

බිඳු නිගහීතං. 1. 8.

අකාරාදිසු යොයං වණ්ණෝ බිඳුමත්තෝ සෝ නිග්ගහීත සඤ්ඤඃ හොති. 'රස්සසරං නිස්සාය ගහිතමුච්චාරිතං' නිග්ගහීතං.

සඤ්ඤාවිධානං.

සඤ්ඤා වුච්චතෙ. පුරිස උත්තමොං, පඤ්ඤ, ඉන්ද්‍රියං, සති ආර කෙඛා, හොති ඉත්ථි, චක්ඛු ආයතනං, අක්ඛි ආයතනං, ධනමෙම අත්ථි, කුතොං එත්ථාතීධ:

සරෙ ලොපෝ සරෙ. 1. 26.

සරෙ සරෝ ලොපනීයෝ හොති. සරෙතොපසිලෙසිකාධාර සත්තමී; තතෝ වණ්ණකාලව්‍යවධානෙ කාරියං න හොති; එවමසි, කතමා වානන්ද අනිච්චසඤ්ඤා.

අඤ්ඤත්ථාපි සංහිතායමොපසිලෙසිකාධාරෙයෙව සත්තමී.

විධිති වත්තමානෙ,

බිඳු නිගහීතං [1·3] යනු නිග්ගහීතසංඥාවිධානසූත්‍ර යි. බිඳු යනු පද යෑ නිග්ගහීතං යනු පද යි.

අකාරාදිසු- අකාරාදීන් අතුරෙහි, බිඳුමත්තෝ-බිඳුමාත්‍ර වූ, යෝ අයං වණ්ණෝ- යම් මෙ වර්ණයෙක් ඇද්ද, සෝ- හෙතෙම, නිග්ගහීතසඤ්ඤඃ හොති-නිග්ගහීතසංඥ ඇත්තෙ වෙ. රස්සසරං නිස්සාය-හ්‍රස්වස්වරයා නිසා, ගහිතං-ග යි සෙයි, උච්චාරිතං- කියන ලද්දෙ, නිග්ගහීතං- නිග්ගහීත නම් වෙ.

සඤ්ඤාවිධානං.

සඤ්ඤා වුච්චතෙ-සංහිතාකාර්‍ය්‍ය කියනු ලැබෙ.

පුරිස උත්තමෝ-පෙ-කුතොං එත්ථාති- කුතොං එත්ථ යන, ඉධ- මෙහි, (සඤ්ඤා වුච්චතෙ-සංහිතාකාරිය කියනු ලැබෙ.)

සරෙ ලොපෝ සරෙ [1·26] යනු විධිසූත්‍ර යි. නිපද යි.

මෙයින් මතු යම් සූත්‍රයෙක් සංඥාපරිභාෂාදිවශයෙන් වෙසෙසා නොං කියන ලද්දෙ වී නම් එ විධිසූත්‍රය යි දතයුතු.

සරෙ- සවරයා කෙරෙහි, සරෝ- අව්‍යවහිත වූ සවර තෙමෑ, ලොපනීයෝ හොති-ලොප් කටයුතු වෙ. සත්තමී- සරෙ යි

සත්තමීයං පුබ්බස්ස. 1. 14.

සත්තමීනිද්දෙසෙ පුබ්බසෙව විධීති පුබ්බසරලොපො. පුරිසුත්තමෙ, පඤ්චින්ද්‍රියං, සත්තාරකෙඛා, හොඝිත්තෙ, චක්ඛායතනං, අඝිහායතනං, ධනමමඤ්ඤි, කුතෙත්ථ.

පුබ්බිස්ස කාරියවිධානා සත්තමීනිද්දිට්ඨස්ස පරතාවගම්‍ය තෙති පරෙතුපරි වචනම්පි ඝටතෙ.

සො අහං, චත්තාරෙ ඉමෙ, යතො උදකං, පාතෙ එවාකීඩ:

සරෙ ලොපෙ සරෙකී වත්තතෙ.

කියා, ඔපසිලෙසිකාධාරසත්තමී- ඖපශ්ලේෂිකාධාරසප්තමී යැ, තතො- එ හෙයින්, වණ්ණ- වර්ණියක්හු විසින් ද, කාල- කාල යක්හු විසින් ද, ව්‍යවධානෙ- ව්‍යවධානයක් ඇති කල්හි, කාරියං න හොති- සංහිතාකාරිය නො වෙ. කිමසි, කතමා වානන්ද අනිච්චසඤ්ඤුති-කිමසි, කතමා වානන්ද අනිච්චසඤ්ඤු යනාදි ය සි. කිමසි ශබ්ද තැන්හි කිං අසි සී පදවෙහි කළ කල්හි අකාරයා පර වුව ද නිග්ගහීතයා මැද සිටි හෙයින් පූර්වකාරසථ අකාර ලොපය නො වෙයි; සවරයා පරකල්හි නිග්ගහීතයහට 'මයඤ්ඤ සරෙ' 1.44 යන සූත්‍රයෙන් මකාරාදෙශ වෙයි; පර අකාරි මකාර යෙහි සංහිත වෙයි. කිමසි යනු වෙ. කතමා වානන්ද අනිච්ච සඤ්ඤ, යන තැන්හි කතමා වානන්ද සී කියා මැද සැකැප්මක් ඇති ව අනිච්චසඤ්ඤා සී කියන හෙයින් පදයන් දෙදෙනාගෙ උච්චාරණයැ අවිච්ඡින්නව නො පවත්නා හෙයින් මධ්‍යයෙහි විශ්‍රාමකාලයෙක් ඇත් නු සි කල්හු විසින් ව්‍යවහිත නු යි සවර ලොප්යැ නො වේ. අඤ්ඤත්‍රාපි සංහිතායං-යෙසු සංහිතායෙහි ද, ඔපසිලෙසිකාධාරෙයෙව සත්තමී- ඖපශ්ලේෂිකාධාරයෙහි ම සප්තමී සි. *

'ආධෙයෙන සහොපසිලෙසො සංයොගලක්ඛණො අත්ථ අස්සී'ති ඔපසිලෙසිකො, ආධාරො යනු වාක්‍ය සි.

විධිති- විධි යනු, වත්තතමානෙ-වැටෙන්නෙහි,

සත්තමීයං පුබ්බස්ස 1.14 යනු පරිභාෂාසූත්‍ර සි. දීපද සි.

සත්තමීනිද්දෙසෙ- සප්තමීන් දැක්වීමක් ඇති කල්හි, පුබ්බ සෙව-පූර්වයහට ම, විධිති- කාරිය වෙ නු සි, පුබ්බසරලොපො-

---

* ඔපසිලෙසිකාධාරසත්තමී- ඖපශ්ලේෂිකාධාරසප්තමී සි, සියලු.

පරෙ සඞවි. 1. 27.

සරමහා පරො සරො සඞවි ලොපනීයො හොති. සො'හං, චත්තාරොමෙ, යතොදකං, පංතොව. සඞචිති කිං? පඤ්ඤින්ද්‍රියං. අසසාඞිකාරො සබබසඞ්ඝ්‍ර.

පූර්‍වසවරයහට ලොප් වෙ. පුරිසුත්තමෙ පඤ්ඤින්ද්‍රියං-පෙ-කුතොසි යනු වෙ. පුරිස සී කියා තිබෙ සි; උත්තමො සී කියා තිබෙ; පඤ්ඤ සී කියා තිබෙ; ඉන්ද්‍රියං සී කියා තිබෙ;-පෙ-කුතො සී කියා තිබෙ; එත්ථ සී කියා තිබෙ; පුරිස සී කී තැන්හි සකාරසථ අකාර පහ වෙ; පඤ්ඤ සී කී තැන්හි ඤකාරසථ අකාර පහ වෙ; -පෙ-කුතො සී කි තැන තකාරසථ ඔකාර පහ වෙ; සවරයා කෙරෙහි අවසවධාන වූ සවරයහට 'සරො ලොපො සරෙ' 1·26 යන සූත්‍රයෙන් ලොප් වෙයි. වන්නෙ පූර්‍වයහට ද පරයහට ද අනිය මෙන් පත්තෙහි සපතමීවිභක්තීන් දක්වීමක් ඇති කල්හි 'සත්තමියං පුබබසස' 1·14 යන පරිභාෂාසූත්‍රසාමර්‍ථ්‍යයෙන් පූර්‍වසවරයහට ලොප් වෙයි; පර උකාර සකාරයෙහි සංහිත වෙයි; පර ඉකාර ඤකාරයෙහි සංහිත වෙයි; -පෙ-පර එකාර තකාරයෙහි සංහිත වෙයි: පුරිස උත්තමො, පඤ්ඤ ඉන්ද්‍රියං-පෙ-කුතො එත්ථ සි කියා පද බිඳ හැළූ තන්හි සංහිතාකාරිය ව පුරිසුත්තමො, පඤ්ඤින්ද්‍රියං -පෙ-කුතොත්ථ යනු වෙ. මත්තෙහි දු පූර්‍වසවර ලොප් කාරිය මෙ ම නය සි.

මෙ සූත්‍රයෙහි පරෙ යන්නක් නැත ද නො වැටුණ ද පරෙ යනු ලැබෙ සි හඟවනු පිණිස පුබබසස කාරියවිධානා යනු කීහු.

පුබබසස- පූර්‍වයහට, කාරියවිධානා- කාරිය කළ හෙයින්, සත්තමීනිද්දිට්ඨස්ස- සත්තමීන් දක්වන ලද්දහුගෙ, පරතා- පර බව, අවගම්‍යතෙති*-දන්නා ලැබෙ නු සි, පරෙති-පරෙ සී කියා, උපරි-මත්තෙහි, වචනමපි-කීම ද, සටතෙ- යෙදෙ.

සත්තම්‍යන්තා- සප්තම්‍යන්ත වූ, යසද්දා- යශබ්දයා තෙරෙන්, වා- විකල්පයෙන්, හිං හොති- හිංප්‍රත්‍යය වේ. යහිං-යනු වේ. වාති- වා යනු, එව- වැටෙ; යත්‍ර-යන තන්හි හිංප්‍රත්‍යය නො වන පිණිස සි

නා හසුවු 4.103. නිපද සි.

සත්තම්‍යන්තා- සප්තම්‍යන්ත වූ, හතෝ- තශබ්දයා තෙරෙන්, වා- විකල්පයෙන්, හං හොති- හංප්‍රත්‍යය වෙයි; හිසඳව- හිං ප්‍රත්‍යය ද වේ. තහං, තහිං-යනු වේ. වාති- වා යනු, එව- වැටෙ; තත්‍ර-යන තන්හි හිං හං ප්‍රත්‍යයන් * නො වන පිණිස සි

කුහිංසහං 4.104. එකපද සි.

සත්තම්‍යන්තා- සප්තම්‍යන්ත වූ, කිංසද්දා- කිංශබ්දයා සෙරෙන්, හිංහං නිපච්චතෙන- හිං හං දෙදෙන නිපදවනු ලැබෙති; කිස්ස- කිංශබ්දයාට, කුසා ච- කුආදෙශ සආදෙශයෝ ද නිපදවනු ලැබෙත්

සබ්බස්මිං කාලෙ ඉති- 'සබ්බස්මිං කාලෙ' යන, එවමාදිවිගහ මහ- මෙ ආදි වාක්‍යයෙහි,

සබ්බාසඤ්ඤාසත්තම්‍යතෙහි කාලෙ දා 4.105. නිපද සි.

සත්තම්‍යතෙහි- සප්තම්‍යන්ත වූ, එතෙහි- මෙ ශබ්දයන් තෙරෙන්, කාලෙ- කාලය කිවමනා කල්හි, දා හොති- දාප්‍රත්‍යය වේ. සබ්බදා යනාදි වේ. 'සබ්බස්මිං කාලෙ' යනාදි විග්‍රහ සි

---

* 'හිං-හං-ප්‍රත්‍යය' සමහර.

සබ්බකුදාඅද්‌ධුනෙදානි. 4. 106

එතෙ සබ්බ, නිපච්චනෙත්ථ 'සබ්බස්මිං කාලෙ' සබ්බ, කුදා. 'සබ්බ සම්මිං කාලෙ' සදා. 'ඉමස්මිං කාලෙ' අධුනා, ඉදානි.

අජ්ජඅජ්ජවපරජෙජ්ජවනරහිකරහා.* 4. 107

එතෙ සබ්බ, නිපච්චනෙත්ථ. පකතිපච්චයෙ ආදෙසෙ කාල විසෙසොනි සබ්බමෙතං නිපාතනා ලබ්භති. ඉමස්ස ඵො, ජ්ජා වාහනි නිපච්චතෙ; 'අස්මිං අහනි' අජ්ජ. සමානස්ස සභාවො, ජ්ජු වාහනි; 'සමානෙ අහනි' සජ්ජු. අපරසමා ජ්ජු අහනි;† 'අපරස්මිං අහනි' අපරජ්ජු. ඉමස්සෙසඵො, කාලෙ රහි ච; 'ඉමස්මිං කාලෙ' එතරහි කිංසද්දස්ස කො, රහ වානජ්ජතනෙ; 'සබ්බස්මිං කාලෙ' සබ්බරහ.

සබ්බකුදාඅද්‌ධුනෙදානි 4·106· එකපද සි.

එතෙ සබ්බ-මෙ ශබ්දයෝ, නිපච්චන්තෙ-නිපදවනු ලැබේත්. සබ්බස්මිං කාලෙ- සබ්බර කාලෙක්හි ද යන මෙ අර්ථයෙහි, සබ්බ, කුදා- යනු වේ. සප්තම්‍යන්තනාමයා කෙරෙන් කාලය කිවමකා කල්හි මෙ සූත්‍රනිපාතනයෙන් ද්‍රුත්‍යය ද කිංශබ්දයහට ස ආදෙශ ද කු ආදෙශ ද නිපදී සි.

සබ්බස්මිං කාලෙ- හැම කල්හි ය යන අර්ථයෙහි, සදා-යනු වේ. සබ්බශබ්දයහට ස ආදෙශ නිපදී සි.
ඉමස්මිං කාලෙ- මෙ කල්හිය යන අර්ථයෙහි, අධුනා, ඉදානි- යනු වේ. ඉමශබ්දයහට ව ආදෙශ වී ආදෙශයෝ ද ධුනා දානි ප්‍රත්‍යයෝ ද නිපදිත්.

අජ්ජඅජ්ජවපරජෙජ්ජවනරහිකරහා * 4·107· එකපද සි.

එතෙ සබ්බ- මෙ ශබ්දයෝ, නිපච්චන්තෙ- නිපදවනු ලැබෙත්. පකති- ප්‍රකෘති ය, පච්චයෝ- ප්‍රත්‍යය ය, ආදෙසෝ- ආදෙශ ය, කාලවිසෙසොනි- කාලවිශෙෂ ය යන, එතං සබ්බ - මෙ සියල්ල, නිපාතනා ලබ්භති- සූත්‍රනිපාතනයෙන් ලැබෙ. අහනි- දිනය කිවමනා කල්හි, ඉමස්ස- ඉමශබ්දයහට, ඵො- ව ආදෙශ ද, ජ්ජා ව- ජ්ජාප්‍රත්‍යය ද, නිපච්චතෙ- නිපදවනු ලැබෙ. අස්මිං අහනි- මෙ දිනයෙහි ය යන අර්ථයෙහි, අජ්ජ-යනු වේ. අහනි- දිනය කිවමනා කල්හි, සමානස්ස- සමානශබ්දයහට, සභාවො- සභාර්‍යම ද, ජ්ජු ව- ජ්ජුප්‍රත්‍යය ද, නිපදවනු ලැබෙ. සමානෙ අහනි- සමාන වූ දිනයෙහි ය යන අර්ථයෙහි, සජ්ජු-යනු වේ.

---

* 'අජ්ජඅජ්ජපරජෙජ්ජතරහිකරහා' ඉති ඉධ බහුසු.
† 'ජ්ජු වාහනි' ඉති සබ්බසු පදසාධනෙසු. තථාපි ව්‍යාඛ්‍යානෙ නාදිජ්ජති.

සබ්බාදිහි පකාරෙ ථා. 4. 108

සාමඤ්ඤස්ස හෙදකො-විසෙසො පකාරො. තස්ං වත්තමා නෙහි සබ්බාදීහි ථා හොති. 'සබ්බෙන පකාරෙන' සබ්බථා. යථා. තථා.

කථම්භූතං. 4. 109

එතෙ සද්දා නිපච්චනෙන පකාරෙ.* කිම්මෙහි ථංපච්චයො, ක ඉත් ච † නෙසං යථාකකමං. 'කෙන පකාරෙන' කථං. 'ඉමිනා පකාරෙන' ඉත්ථං.

එදවස ය සී සෙසි. අහනි- දිනය කිවමනා කල්හි, අපරසමා- අපරශබ්දයා කෙරෙන්, ජ්ජු- ජ්ජුප්‍රත්‍යය නිපදවනු ලැබෙ; අපරස්මිං අහනි- අන්‍ය දිනයෙක්හි ය යන අර්ථයෙහි, අපරජ්ජු- යනු වෙ. කාලෙ- කාලය කිවමනා කල්හි, ඉමස්ස- ඉමශබ්දය හට, එතො- එත යන ආදෙශ ද, රහි ච- රහිප්‍රත්‍යය ද නිපදවනු ලැබෙ; ඉමස්මිං කාලෙ-මෙ කල්හි ය යන අර්ථයෙහි, එතරහි- යනු වෙ. අනජ්ජතනෙ- අද දවසින් අන්‍ය වූ කාලය කිවමනා කල්හි, කිංසද්දස්ස- කිංශබ්දයගට, තො- කකාරාදෙශ ද, රහ ච- රහප්‍රත්‍යය ද නිපදවනු ලැබෙ; කස්මිං කාලෙ-කවර කලෙක්හි ද යන මෙ අර්ථයෙහි, කරහ-යනු වෙ.

සබ්බාදිහි පකාරෙ ථා 4·108· නිපද සි.

සාමඤ්ඤස්ස-සාමාන්‍යයාගෙ, හෙදකො-සී සෙසි; විසෙසො- විශෙෂය, පකාරො- ප්‍රකාර නම. තස්ං- එ ප්‍රකාරයෙහි, වත්තමා නෙහි- වැටෙන්නා වූ, සබ්බාදීහි- සබ්බාදීන් කෙරෙන්, ථා හොති- ථාප්‍රත්‍යය වෙ. සබ්බෙන පකාරෙන- සබ්බප්‍රකාරයෙන් යන අර්ථයෙහි, සබ්බථා- යනු වෙ. යථා, තථා- යනු වෙ. 'යෙන පකාරෙන, තෙන පකාරෙන' යනු විග්‍රහ සි.

කථම්භූතං 4·109· එකපද සි.

පකාරෙ- ප්‍රකාරාර්ථයෙහි, එතෙ සද්දා- මෙ ශබ්දයෝ, නිපච්චනෙන- නිපදවනු ලැබෙති. කිම්මෙහි- කිංශබ්ද ඉමශබ්දයන් කෙරෙන්, ථංපච්චයො- ථංප්‍රත්‍යය ද, තෙසං- එ ශබ්දයන් දෙවදනාට, යථාකකමං- පනතින්, ක ඉත් ච- කආදෙශ ඉත්ආදෙශ යො ද, නිපදවනු ලැබෙති. කෙන පකාරෙන- කවර ප්‍රකාරයෙකින්ද යන අර්ථයෙහි, කථං- යනු වෙ. ඉමිනා පකාරෙන- මෙ ප්‍රකාරයෙන යන අර්ථයෙහි, ඉත්ථං-යනු වෙ.

---

* 'පිකාරෙති' ඉති සාළුවි. † 'සඉත්' ම, 'කඉත්වෙවතෙසං' ඉධ කාළුවි.

'එකෙන පකාරෙන, එකං වා පකාරං කරොති'වෙවමාදි විගහෙහ,

ධා සංඛ්‍යාහි. 4. 110

සංඛ්‍යාවාචීහි පකාරෙ ධා පරෙ හොති. එකධා කරොති. දවිධා, * තිධා, චතුධා, පඤ්චධා කරොති. † බහුසදේද වෙපුල්ල වාචී, සංඛ්‍යාවාචී ච. යදා සංඛ්‍යාවාචි, තදා බහුධා කරොති.

වෙප්‍පා ජඤ්ඤං. 4. 111

එකසමා පකාරෙ ජඤ්ඤං ‡ වා හොති. එකජඤ්ඤං. වාති කිං? එකධා.

එකෙන පකාරෙන කරොති- 'එකෙන පකාරෙන කරොති' යන හො, එකං වා පකාරං කරොතීති- 'එකං පකාරං කරොති' යන හො, එවමාදිවිගහගහෙ- මේ ආදි වාක්‍යයෙහි,

ධා සංඛ්‍යාහි 4·110· දවිපද සි.

පකාරෙ- ප්‍රකාරාර්ථයෙහි වැටෙන්නා වූ, සඞ්ඛ්‍යාවාචීහි- සඞ්ඛ්‍යාවාචිශබ්දයන් කෙරෙන්, පරෙ- පර වූ, ධා හොති- ධාප්‍රත්‍යය වේ. එකධා කරොති- යනු වේ. දවිධා කරොති යනාදි වේ.

'එකෙන පකාරෙන, දවීහි පකාරෙහි, තීහි පකාරෙහි, චතූහි පකාරෙහි, පඤ්චහි පකාරෙහි කරොති' යනාදීන් හො 'එකං පකාරං, දෙ පකාරෙ, තයො පකාරෙ, චත්තාරෙ පකාරෙ, පඤ්ච පකාරෙ කරොති' සි කියා හො වාක්‍ය ගත යුතු.

බහුසදේද- බහුශබ්දය තෙම, වෙපුල්ලවාචී- විපුලත්වවාචී ද වෙයි; සඞ්ඛ්‍යාවාචී ච- සඞ්ඛ්‍යාවාචී ද වේ. යදා- යම් කලෙක්හි, සඞ්ඛ්‍යාවාචී- සඞ්ඛ්‍යාවාචී ද, තදා- එකල්හි, බහුධා කරොති- යනු වේ. දී 'බහූහි පකාරෙහි කරොති' සි කියා හො 'බහු පකාරෙ කරොති' සි කියා හො වාක්‍ය ගත යුතු.

වෙප්‍පා ජඤ්ඤං 4·111· වා යැ එකා යැ ජඤ්ඤං යැ යනු පද සි.

---

* 'විධා කරොති' ඉති කත්ථචි.

† යදිපි සබ්බෙසුපි සදෙසවිදෙසියෙසු ලිඛිතමුද්දිතපොත්ථකෙසු 'කරොති වෙවමාදිවිගහගහෙ' ඉවෙවව පාඨො දිස්සතෙ, තථාපි චිරකාලාභාරගහතෙන ලිපිකරඛ්‍යාමනාතොතා භවිතබ්බං; අසම්භවත්තා තාදිසස්ස විගහගහස්ස, අත්‍ථපකාසිතත්තා චෙත්ථ වාක්‍යස්ස.

‡ 'ඤං' ඉධ කත්ථචි. § 'යනාදි වේ' සී සන්‍ය.

දවිතීහෙධා. 4. 112

දවිතීහි පකාරෙ එධා වා හොති. දෙධා; තෙධා. වාසෙව; දවිධා; තිධා.

'එකං වාරං භුඤ්ජති'වෙවමාදිවිගහහෙ,

වාරසංඛ්‍යාය කඛත්තුං. 4. 114

වාරසම්බන්ධිනියා සංඛ්‍යාය කඛත්තුං හොති. එකකඛත්තුං භුඤ්ජති. දවිකඛත්තුං, තිකඛත්තුමිවවාදි. වාරගහහණං කිං? පඤ්ච භුඤ්ජති. සංඛ්‍යායාති කිං? පහූතෙ වාරෙ භුඤ්ජති.

එකසමා- එකශබ්දයා කෙරෙන්, පකාරෙ- ප්‍රකාරාර්ථයෙහි, වා- විකල්පයෙන්, ජඛං හොති- ජඛංප්‍රත්‍යය වේ. එකජඛං-යනු වේ. 'බහූ පකාරෙ එකප්පකාරං කරොති' යනු විග්‍රහ යි. වාති- වා යනු, කිං- කුමට ය? එකධා- යන තන්හි ජඛංප්‍රත්‍යය නො වන පිණිස යි.

දවිතීහෙධා 4·112· දවිපද යි.

දවිතීහි- දවිශබ්ද තිශබ්දයන් කෙරෙන්, පකාරෙ- ප්‍රකාරාර්ථයෙහි, වා- විකල්පයෙන්, එධා හොති- එධාප්‍රත්‍යය වේ. දෙධා, තෙධා- යනු වේ. වාති- වා යනු, එව- වැටෙ; දවිධා, තිධා-යන තන්හි එධා ප්‍රත්‍යය නො වන පිණිස යි.

එකං වාරං භුඤ්ජතීති- 'එකං වාරං භුඤ්ජති' යන, එවමාදි විගහහෙ- මෙ ආදි වාක්‍යයෙහි,

වාරසඛ්‍යාය කඛත්තුං 4·114· දවිපද යි.

වාරසම්බන්ධිනියා- වාරසම්බන්ධී වූ, සංඛ්‍යාය- සංඛ්‍යාවාචී වූ ශබ්දයන් කෙරෙන්, කඛත්තුං හොති- කඛත්තුං ප්‍රත්‍යය වේ.

වාරයාගෙ සංඛ්‍යාව වාරසංඛ්‍යා නම් වේ. එකකඛත්තුං භුඤ්ජති- යනු වේ. එක වරෙක අනුභව කෙරෙයි යන අර්ථ යි. දවිකඛත්තුං, තිකඛත්තුං ඉති- දවිකඛත්තුං, තිකඛත්තුං යන, ආදි- මෙ ආදිය වේ. වාරගහහණං-වාරග්‍රහණය, කිං-කුමට ය? පඤ්ච භුඤ්ජති-යන් තන්හි කඛත්තුං ප්‍රත්‍යය නො වන පිණිස යි. මෙහි ප්‍රත්‍යුදාහරණයෙහි පසක් අනුභව කෙරෙයි යන අර්ථය ඔත් පස් වරෙක අනුභව කෙරෙයි යන අර්ථයක් නැති හෙයින් කඛත්තුං ප්‍රත්‍යය නො වී.

සංඛ්‍යායාති- සංඛ්‍යාය් යනු, කිං- කුමට ය? පහූතෙ වාරෙ භුඤ්ජති-යන තැන්හි කඛත්තුං ප්‍රත්‍යය නො වන පිණිස යි. මෙහි

කතිමහා. 4. 115

වාරසම්බන්ධිනියා කතිසංඛ්‍යාය කම්මත්තං හොති. 'කති වාරෙ භුඤ්ජති' කතිකම්මත්තං භුඤ්ජති.

බහුමහා ධා ච පවාසතනියං. 4. 116

වාරසම්බන්ධිනියා බහුසංඛ්‍යාය ධා හොති; කම්මත්තඤ්ච; වාරානඤ්ච පවාසතනි හොති. 'බහූ වාරෙ භුඤ්ජති' බහුධා * දිවසස්ස භුඤ්ජති; බහුකම්මත්තං වා. පවාසතනියන්ති කිං? බහුකම්මත්තං මාසස්ස භුඤ්ජති.

සකිං වා. 4 117

එකං වාරම්චවසම්මං අත්තෙ සකින්ති වා නිපච්චතෙ. එකසමා කිං, එකස්ස ව සාදෙසො. 'එකං වාරං භුඤ්ජති' සකිං භුඤ්ජති. වාති කිං? එකකම්මත්තං භුඤ්ජති.

බොහෝ වර අනුභව කෙරෙයි යන පමණක් මුත් මෙතෙක් වර අනුභව කෙරෙයි යන වාරසංඛ්‍යාව නැති හෙයින් කම්මත්තං නො වී.

කතිමහා 4·115· එකපද යි.

වාරසම්බන්ධිනියා- වාරසම්බන්ධී වූ, කතිසංඛ්‍යාය- සංඛ්‍යා වාචී වූ කතිශබ්දයා කොරෙන්, කම්මත්තං හොති- කම්මත්තංප්‍රත්‍යය වෙ. † කති වාරෙ- කීප වරෙක, භුඤ්ජති- අනුභව කෙරෙ ද යන අර්ථයෙහි, කතිකම්මත්තං භුඤ්ජති- යනු වෙ.

බහුමහා ධා ච පවාසතනියං 4·116· සත්තරපද යි.

වාරසම්බන්ධිනියා- වාරසම්බන්ධී වූ, බහුසංඛ්‍යාය- බහුසංඛ්‍යාව කොරෙන්, ධා හොති- ධාප්‍රත්‍යය වෙයි; කම්මත්තං ච- කම්මත්තංප්‍රත්‍යය ද වෙ; වාරානං- වාරයන්ගෙ, පවාසතනි හොති වෙ- ආසන්නතාව වී නම්. බහූ වාරෙ භුඤ්ජති- බොහෝ වර අනුභව කෙරෙයි යන අර්ථයෙහි, දිවසස්ස- දවසකට, බහුධා භුඤ්ජති- බහුධා භුඤ්ජති යනු වෙ. බහුකම්මත්තං වා- බහුකම්මත්තං කියා හෝ වෙ.‡ පවාසතනියන්ති- ආසන්නතාවක් ඇති කල්හි වෙයි යනු, කිං- කුමට ය? බහුකම්මත්තං මාසස්ස භුඤ්ජති- යන තැන්හි ධාප්‍රත්‍යය නො වන පිණිස යි.

සකිං වා 4 117 දම්පද යි.

එකං වාරං ඉති- එක වරෙක යන, අත්ථෙ- මේ අර්ථයෙහි, වා- විකල්පයෙන්, සකින්ති- සකිං යනු, නිපච්චතෙ-

---

* 'බහුධා වා' ම.

† ''කතිශබ්දයා සංඛ්‍යාශබ්ද ත්‍රු වුව ද සංඛ්‍යාපරිමාණවිශයෙහි සාඛ්‍යා බැවින් 'කතිසංඛ්‍යාය' යි කියන ලදි.'' විරිතසත්‍ය.

‡ 'කියා ද වෙ' යි සම්භර.

සෝ විච්ඡාපකාරෙසු. 4. 118

ක්‍රියාය ගුණෙන දබ්බන වා භින්නෙ අත්ථෙ ව්‍යාපිතුම්ච්ඡා, ච්ඡා. ච්ඡායං පකාරෙ ච සෝ හොති බහුලං. සාමඤඤ නිද්දෙසා යථාසම්භවං විභත්‍යන්තානා යතෝ කුතෝචි සද්දා හොති. ච්ඡායං; 'ඛණ්ඩං ඛණ්ඩං කරොති' ඛණ්ඩසෝ කරොති. 'සබ්බන්න පකාරෙන' සබ්බසෝ.

අභූතනබ්භාවෙ කරසහූයොගෙ විකාර ච්. 4. 119

අවත්ථාවතෝ'වත්ථන්තරෙනාභූතස්ස තායාවත්ථාය භාවෙ කරාසහූහි සම්බන්ධෙ සති විකාරවාචකා ච් හොති. වකාරො

නිපදවනු ලැබෙයි. එකසමා- එකශබ්දයා කෙරෙන්, කිං- කිං ප්‍රත්‍යය ද, එකස්ස- එකශබ්දයහට, සාදෙසො ච- සකාරාදෙශ ද වෙ. එකං වාරං- එක් වරක්, භුඤ්ජති- අනුභව කෙරෙයි යනු අර්ථයෙහි, සකිං භුඤ්ජති-යනු වෙ වාති- වා යනු, කිං- කුමට ය? එකක්ඛත්තුං භුඤ්ජති- යන තැන්හි සකිං යනු නො වන්නා සිඹින්ස සි.

සෝ විච්ඡාපකාරෙසු 4·118· දම්පද සි.

භින්නෙ- දිශාදිභෙදයෙන් * අනෙකප්‍රකාර වූ, අත්ථෙ- ද්‍රව්‍ය ගුණක්‍රියාලක්ෂණ වූ වස්තූන්, ක්‍රියාය- ක්‍රියායෙකින් හෝ, ගුණෙන- ගුණයෙකින් හෝ, දබ්බන වා- ද්‍රව්‍යයෙකින් හෝ, ඛ්‍යාපිතුං- සම්බන්ධ කරන්නට, ඉච්ඡා- අභිලාෂා තොමෝ, ච්ඡා- ච්පසා නම්. ච්ඡායං- ච්පසාර්ථයෙහි ද, පකාරෙ ච- ප්‍රකාරාර්ථයෙහි ද, බහුලං- ඉෂ්ට පරිද්දෙන්, සෝ හොති- සෝප්‍රත්‍යය වෙ. සාමඤඤනිද්දෙසා- සාමාන්‍යනිර්දේශය හෙතු කොට ගෙන, යථාසම්භවං- සම්භව වූ පරිද්දෙන්, විභත්‍යන්තානා- විභක්‍ත්‍යන්ත වූ, යතෝ කුතෝචි සද්දා- යම් කිසි ශබ්දයක් කෙරෙන්, හොති- වෙ. ච්ඡායං- ච්පසාර්ථයෙහි සෝප්‍රත්‍යය කියනු ලැබෙ; ඛණ්ඩං ඛණ්ඩං කරොති- කඩ කඩ කෙරෙයි යන අර්ථයෙහි, ඛණ්ඩසෝ කරොති- යනු වෙ. සබ්බන්න පකාරෙන- හැම පරිද්දෙන් යන අර්ථයෙහි, සබ්බසෝ-යනු වෙ.

අභූතනබ්භාවෙ කරසහූයොගෙ විකාර ච් 4·119· සතර පද සි.

අවත්ථාවතෝ- අවස්ථාවත් වූ, අවත්ථන්තරෙන- අන්‍ය අවස්ථාවෙකින්, අභූතස්ස- නො වූවහුගෙ, තාය අවත්ථාය- ඒ නො වූ

---

* 'දෙසාදිභෙදෙන' යි විසා.

'ච්ච් ඩ්‍රියතෙහි' නි 3·14 විසෙසනතෝ 'අධවලං ධවලං කරොති' * ධවලී කරොති. 'අධවලෝ ධවලෝ සියා, භවති' වා ධවලී සියා, ධවලී භවති. අභූතතබ්භාවෙති කිං? ඝටං කරොති. කරාසභූයොගෙති කිං? අධවලෝ ධවලෝ ජායතෙ. විකාරොති කිං? සුවණ්ණං කුණ්ඩලී කරොති.

ණාදිසඤ්ඤා.

—()—

අවස්ථාවෙන්, භාවෙ- විමෙහි, කරාසභූහි- කර=කාරණෙ යැ අස=භූවි යැ භූ=සත්තායං යැ යන ධාතූන් තුන්දෙනා හා. සම්බන්ධෙ සති- යෙදීමක් ඇති කල්හි, විකාරවාචකා- විකාරවාචීහු කෙරෙන්, චී හොති- විප්‍රත්‍යය වේ. චකාරෝ- චකාර තෙමැ, චී ක්‍රිය තෙහීති- 'චි ක්‍රියතෙහි' 3·14 යන සූත්‍රයෙහි, විසෙසනතෝ- විශෙෂණය ප්‍රයොජන කොට ඇත්තෙ සි. අධවලං- පෙර ධවල නො වූවා, ධවලං කරොති- දැන් ධවල කෙරෙයි යන මෙ අර්ථයෙහි, ධවලී කරොති-යනු වේ.

'අධවලං ධවලං කුරුතේ' යන වාක්‍යයෙහි ධවලං යන දවීතී යාන්තයා කෙරෙන් පෙර ධවල නො වූවා දැන් ධවල කෙරෙයි යන මෙ අර්ථයෙහි මෙ සූත්‍රයෙන් චිප්‍රත්‍යය වෙයි. චකාර අප්‍රයොගී වෙයි. 'එකන්තතායං' 2·121 යි දුතීයාවිභක්ති ලොප් වෙයි. 'සරො ලොපෙ සරෙ' 1·26 යි පූර්වස්වර ලොප් වෙයි. මෙසෙ නිපද වූ ධවලීශබ්දයා කෙරෙන් වූ සියලු ඒහක්තීන්ට 'අසං ඛ්‍යෙහි සබ්බාසං' 2·120 යි ලොප් වෙ.

අධවලෝ- පෙර ධවල නො වූයෙ, ධවලෝ සියා- දැන් ධවල විය යන අර්ථයෙහි හො, භවති වා- වෙයි යන අර්ථයෙහි හො, ධවලී සියා, ධවලී භවති-යනු වේ, සිද්ධ යට කී නියෙන් ම දත යුතුයි.

අභූතතබ්භාවෙති- අභූතතබ්භාවයක් විවක්ෂිත කල්හි ය යනු, කිං- කුමට යැ? ඝටං කරොති- යන තන්හි චිප්‍රත්‍යය නො වන පිණිස සි. ඝටං කරොති යි කම්මමාත්‍රයක් විවක්ෂිත යැ; අභූතතබ්භාවය අවිවක්ෂිත යැ; එහෙයින් චිප්‍රත්‍යය නො වේ.

කරාසභූයොගෙති- කරාසභූධාතූන් හා යොගයක් ඇති කල්හි ය යනු, කිං- කුමට යැ? අධවලෝ ධවලෝ ජායතෙ- යන තැන්හි චිප්‍රත්‍යය නො වන පිණිස සි. මෙහි ජන=ජනනෙ ඝන්ත භූගෙ යොගය හෙයින් නො වේ.

* 'කරොතීති' ම.

'අථ තබ්බාදයො වුච්චමන්න ක්‍රියත්ථේහි 'ක්‍රියත්ථා'ති 5.14
අධිකාරතො. * 'ක්‍රියා අත්ථො එතසසා'ති ක්‍රියත්ථො-ධාතු. සො ච
දුවිධිධො සකම්මකාකම්මකුවසෙන. තත්ථ යසමිං ක්‍රියත්ථේ කත්තු
වාචිනි කම්මං ගවෙසීයතෙ, සො සකම්මකො. ඉතරො අකම්මකො.

විකාරාති-විකාරවාචිහු කෙරෙන් වෙයි යනු, කිං- කුමට ය?
සුවණ්ණං කුණ්ඩලී කරොති-යන තැන්හි ප්‍රකෘතිවාචිහු නොවෙරෙන්
විප්‍රත්‍යය නො වන පිණිස යි. සුවණ්ණං කුණ්ඩලී කරොති යී
කුණ්ඩලරූපයෙන් † නො වූවහුගෙ කුණ්ඩලරූපයෙන් වීම ඇති
කල්හි අභූතතබ්භාවය ද කරධාතුයොගය ද ඇති බැවින් ප්‍රකෘති
වචන වූ සුවණ්ණශබ්දයා කෙරෙන් විප්‍රත්‍යය නොවන පිණිස
'විකාරා' යී කියන ලදි.

සාමඤ්ඤඤ්ච විසෙසො ච නිපාතො භාවජෝ තථා
ඉති විඤ්ඤෑහි විඤ්ඤෙය්‍යා තද්ධිතා තු චතුබ්බිධො.

මෙහි සාමාන්‍යතද්ධිත නම් අපත්‍යාදර්‍ථයෙහි විහිත වූ ලිඞ්ග
ත්‍රයට සාධාරණ වූ වාසිට්ඨාදිය යැ; විශෙෂතද්ධිත නම් සඞ්ඝ
සමූහාර්‍ථාදියෙහි වූ එකෙනෑ ලිඟු ඇති 'ආකිඤ්චඤ්ඤං, ගාමිතා'
යනාදිය යැ; නිපාතතද්ධිත නම් තෝදි ප්‍රත්‍යයාන්ත වූ ගාමතො
යනාදිය යැ; භාවතද්ධිත නම් භාවයෙහි වූ 'වඤ්ඤත්තං' යනාදිය යි.

ණාදයො.

—()—

අථ- ඉක්ඛිත්තෙන්, ක්‍රියත්ථාති අධිකාරතො- 'ක්‍රියත්ථා' 5.14
යනු වැටෙන නෙසින්, ක්‍රියත්ථෙහි- ධාතූන් නෙරෙන්, තබ්බා
දයො- තබ්බාදිප්‍රත්‍යයො, වුච්චන්තෙ- කියනු ලැබෙත් ක්‍රියා-
ක්‍රියා නොමෙ, අත්ථො- අර්‍ථ වූයෙ, එතසසාති- මෙයාට නු සි,
ක්‍රියත්ථො- ක්‍රියත්ථ නම් වෙ; ධාතු- ධාතුව සි. ධාතුශබ්දය භූවා
දීන් කෙරෙහි වැටෙන කල දිවලිඞ්හිඞ්සි.

'ධාතු දිවිසවටසීවකඛාදිභූවාදිගෙරිකාදිසු'

යනු නිඝණ්ඩු සි. සො ච- ඒ ධාතුව ද, සකම්මකාකම්මක
වසෙන- සකර්‍මක අකර්‍මකවශයෙන්, දුවිධිධො- දෙවිප්‍රකාර වේ.
තත්ථ- ඒ දෙවිධ ධාතූන් අතුරෙහි, යසමිං ක්‍රියත්ථේ- යම්
ධාතුවක්හු, කත්තුවාචිනි- කර්‍තෘවාචී කල්හි, කම්මං- ඔදනාදි
කර්‍මය අහම, ගවෙසීයතෙ- සොයනු ලැබෙ ද, සෙය- හෙ තෙම,
සකම්මකො- සකර්‍මක යැ. ඉතරො- එයින් අන්‍ය වූ ධාතුව තෙම,

---

* 'අධිකාරතා' ඉධ සබ්බත්ථ. † 'කුණ්ඩලරූපත' යී සත්‍ය.

තෙසු සථාරහං සකම්මකතෝ කම්මාදි කාරකෙ කම්මාථවති චජ්ඣයං භාවෙ ච තබ්බාදයෝ වෙදිතබ්බා. අකම්මකතෝ පන භාවෙ කම්මවජ්ජිතෙ ච කාරකෙ. ක්‍රියාති ච ගමනපචනාදිකෝ අසත්තසම්මතෝ කත්තරි කම්මෙ චා පතිට්ඨිතෝ කාරකසමූහ සාධියෝ පදත්ථෝ වුච්චති. වුත්තං හි:

'අදුබ්බභූතං කත්තාදිකාරකගහාමසාධියං,
පදත්ථං සත්ථුසම්මටඨං ක්‍රියම්ඵජ්ජනති තබ්බිදූ'

කර=කරණෙ; අකාරෝ උච්චාරණත්ථෝ. එවමුත්තරත්‍රාපි. කර් ඉති සිතෙ,

අකම්මකෝ- අකර්මක යි. තෙසු- ඔවුන් අතුරෙන්, සථාරහං- සුදුසු සුදුසු පරිද්දෙන්, සකම්මකතෝ- සකර්මකධාතුහු කෙරෙන්, කම්මාදි කාරකෙ- කර්මාදිකාරකයෙහි ද, කම්මාවචනිච්ඡාථං- විද්‍යමාන වූ කර්මය අවිවක්ෂිත කල්හි, භාවෙ ච- භාවයෙහි ද, තබ්බාදයෝ- තබ්බාදිප්‍රත්‍යයෝ, වෙදිතබ්බා- දත යුත්තාහ. අකම්මකතෝ පන- අකර්මකධාතුහු කෙරෙන් වනාහි, භාවෙ- භාවයෙහි ද, කම්මවජ්ජිතෙ ච කාරකෙ- කර්මවර්ජිත වූ සෙසු කාරකයෙහි ද වෙත්. ක්‍රියාති ච- ක්‍රියා ය යි ද, ගමනපචනාදිකෝ- ගමනපචනාදි වූ, අසත්තසම්මතෝ- අද්‍රව්‍ය ය යි දන්නා ලද, කත්තරි- කර්තෘහු කෙරෙහි හෝ, කම්මෙ චා- කර්මයෙහි හෝ, පතිට්ඨිතෝ- පිහිටියා වූ, කාරකසමූහසාධියෝ- කාරකසමූහයා විසින් සිද්ධ කටයුතු වූ, පදත්ථෝ- පදාර්ථය තෙම, වුච්චති- කියනු ලැබේ. වුත්තං හි- ශබ්දාර්ථවිචාරකයෙහි රතනශ්‍රීඥානාචාර්‍යයන් විසින් කියන ලදමැයි: *

අදුබ්බභූතං- ද්‍රව්‍ය නු වූ, කත්තාදිකාරකගහාම- කර්තෘකරණාදි කාරකසමූහයා විසින්, සාධියං- සිද්ධ කට යුතු වූ, කත්තු සම්මටඨං- කර්තෘ කර්ම දෙක්හි පිහිටියා වූ හෙවත් කර්තෘසථ වූ හෝ කර්මසථ වූ හෝ, පදත්ථං- පදාර්ථය, තබ්බිදූ- ඒ ක්‍රියාලක්ෂණ දන්නාහු, ක්‍රියං- ක්‍රියාව ය යි, ඉච්ඡන්ති- කැමැති වෙත්.

කර- කර ඇති ධාතු, කරණෙ- කිරීමෙහි වැටෙ. අකාරෝ- ධාත්වන්ත වූ අකාර තෙමෙ, උච්චාරණත්ථෝ- සුඛොච්චාරණය ප්‍රයොජන කොට ඇත්තේ යි. උත්තරත්‍රාපි- මත්තෙහි දු, එවං- මෙසෙ මැ යි. මත්තෙහි දු අකාරාන්තධාතූන්ගෙ අයාර තෙම

---

* 'වුත්තං හි' මේ පදය හා අර්ථ ඝන්‍යයෙහි අවිද්‍යමාන් යි. කවිවිකාමු සාරණෙන් අඩිඝීකෘතයි.

භාවකම්මෙසු තබ්බානීයා. 5. 27

තබ්බඅනීයා ක්‍රියත්ථා පරෙ භාවකම්මෙසු බහුලං භවන්ති. 'පචචයෙ'ති පචචයවිධානතො 'ඤඤසම්ං සබ්බවිභත්තිකාරකා.

තුංතූනතබෙබසු වා. 5. 119

තුමාදිසු පචචයෙසු වා කරසස ආ හොති අඤඤත්ර,

පරරූපමසඛාරෙ බ්‍යඤඤනෙ. 5. 95

ක්‍රියත්ථානමනන්තබ්‍යඤ්ජනසස පරරූපං හොති යකාරතො 'ඤඤසම්ං බ්‍යඤ්ජනාදෙ පචචයෙති පරරූපං. 'කරණං' කාතබ්බං; කත්තබ්බං වා. නපුංසකලිඞ්ගං. භාවසෙසකතොත්‍ථෙ * 'තබ්බාදයොති තො භාවො දබ්බම්ව පකාසතී'ති බහුවචනඤ්ච හොති.

උච්චාරණය පිණිස යැ යී සෙයි. කර් ඉති- කර් ය යි, සීතෙ- සිවි කල්හි, බහුලං ඉති- බහුලං යනු, සබබඤ්- හැම තැන්හි, වත්ත තෙ- වැටෙ.

භාවකම්මෙසු තබ්බානීයා 5·27· දම්පද යි.

තබ්බඅනීයා- තබ්බඅනීයප්‍රත්‍යයො, ක්‍රියත්ථා- ධාතූහු තෙ රෙන්, පරෙ- පර වූවාහු, භාවකම්මෙසු-භාවකර්ම දෙක්හි, බහුලං- ඉෂ්ට පරිද්දෙන්, භවන්ති- වෙත්. පචචයෙති- පචචයෙ යනු, පචචයවිධානතො- ප්‍රත්‍යයවිධානයෙන්, අඤඤසම්ං- අන්‍ය වූ, සබබත්- හැම තැන්හි ම, අධිකාරො- සම්බන්ධ කරනු ලැබෙ.

තුංතූනතබෙබසු වා 5·119· දම්පද යි.

තුමාදිසු පචචයෙසු- තුමාදිප්‍රත්‍යයන් පර කල්හි, කරසස- කර යන ධාතුහට, වා- විකල්පයෙන්, ආ හොති- ආකාරාදෙශ වෙ. අඤඤත්ර- ආකාරාදෙශ නු වූ පක්ෂයෙහි,

පරරූපමසඛාරෙ බ්‍යඤඤනෙ 5·95· තිපද යි.

යකාරතො- යකාරයා කෙරෙන්, අඤඤසම්ං- අන්‍ය වූ, බ්‍යඤ්ජනාදෙ පචචයෙ- බ්‍යඤ්ජනාදිප්‍රත්‍යයා පර කල්හි, ක්‍රිය ත්‍ථානං- ධාතූන් සම්බන්ධි වූ, අනන්තබ්‍යඤ්ජනසස- අනන්ත වූ බ්‍යඤ්ජ නයහට, පරරූපං හොතීති- පරරූප වෙ නු යි, පරරූපං- පර රූපතාකාරයෙක් වෙ. කරණං- කිරීම, කාතබ්බං- කාතබ්බ නම් වෙ. කත්තබ්බං වා- කත්තබ්බ නම් හො වෙ. නපුංසකලිඞ්ගං-

---

* 'භාවසෙසකතොත්‍ථෙ' සඤ්.

කෙවෙම, 'කරියතී'ති කාතබ්බො, කත්තබ්බො. අභිධෙය්‍ය සෙසෙව ලිඞ්ගවචනානි.

විසෙසසලිඞ්ගා තබ්බාදී තත්‍රාදෙ පඤ්ච භාවජා
නපුංසකෙ සියුං භාවෙ කෙචා වානෝ අසත්තරි.

භාවසම්මිං ඝ්‍යණී පුමෙ එවං ඉය්‍යවණ්ණගහාදිජෝ
අපපච්චයෝ'පි වාසඞ්ඛ්‍යා තුමාදිකත්‍වානතකා * සියුං.

භාවයෙහි නිඝප්පන්න හෙයින් නපුංසකලිඞ්ග යි. භාවස්ස- භාවයා තමා, එකතෙත්'පි- † එසක්ම බව් වුව ද, ‡ තබ්බාදීහිභිතෝ භාවෝ- තබ්බාදීන් විසින් කියන ලද භාවය තෙම, දබ්බම්හි පකාසතීති- ද්‍රව්‍යයක් මෙන් ප්‍රකාශ වෙ නු යි, බහුවචනඤ්ච හොති- බහුවචන ද වෙ. මෙම කියෝ:

'තබ්බාදීහිභිතෝ භාවෝ දබ්බභූතෝ තු ඤ්‍ඤයතෙ
තස්මා යොආදයෝ'පෙත්ථ පාකා ඉවෙවමාදිසු' යි.

කර්=කරණෙ යන ධාතු කර කියා තිබෙයි. අකාර උච්චාරණ පිණිස ය. 'කරණං' යන වාක්‍යයෙහි ධාතුහු තෙරෙන් පර ව 'භාවකම්මෙසු තබ්බානීයා' 5.27 යන සූත්‍රයෙන් භාවයෙහි තබ්බ ප්‍රත්‍යය වෙයි. තබ්බ ප්‍රත්‍යයා පර කල්හි කර යන ධාතුහු ගෙ අන්තයහට 'තුන්නානතබ්බෙසු වා' 5.119 යන සූත්‍රයෙන් විකල්පයෙන් ආකාරාදෙශ වෙයි. පුමිසවර ලොප් වෙයි. කාතබ්බං යනු වෙ. නු වූ පක්ෂයෙහි යකාරවර්ජිත වූ බ්‍යඤ්ජනාදිප්‍රත්‍යයා පර කල්හි ධාත්වන්තයහට 'පරරූපමයකාරෙ බ්‍යඤ්ජනෙ' 5.95 යන සූත්‍රයෙන් පරරූප තකාරයෙක් වෙයි. කත්තබ්බං යනු වේ.

කෙවෙම- කර්මකාරකයෙහි උදාහරණ කියනු ලැබේ. කරියතීති- කරනු ලැබෙ නු යි, කාතබ්බො- කාතබ්බ නම් වෙ; කත්තබ්බො- කත්තබ්බ නම් වෙ. 'කාරණං' යනු භාවයට වාක්‍ය යැ; 'කරියති' යනු කර්මයට වාක්‍ය යැ; 'කාරෙති' යනු කර්තෘවට වාක්‍ය යි.

අභිධෙය්‍යසෙසෙව- වාච්‍යාර්ථයෙහි බඳු වූ ම, ලිඞ්ගවචනානි- ලිඟු හා වචන ඇත්තෝ යි.

තබ්බාදී- තබ්බාදීනන්තනාමයෝ, විසෙසසලිඞ්ගා- විශෙෂ්‍යයට බඳු වූ ලිඟු ඇත්තාහ; තත්‍ථ- ඔවුන් අතුරෙහි, භාවජා- භාව

---

* 'තුමාදිකත්‍වානතකා' ඉඩ.

† 'එසන්තාපි' යි සමහර. ‡ 'එව-ද' යි සමහර.

අනීයෙ,,

රා නස්ස ණො. 5. 171

රානන්තතො ක්‍රියස්ස පරස්ස පච්චයනකාරස්ස ණො හොති. කරණීයං. බහුලාධිකාරා කරණාදිසුපි භවන්ති. සිනා=සොවෙ යෙය්‍ය; දිවාදිසෙසො. 'සිනායනන්‍යනෙනා'නි* සිනායනීයං; චුණ්ණං. දෑ=දූනෙ; 'දීයතෙ අස්සා'නි දූනීයො; බ්‍රාහ්මණො. ඨා=ගතිනිවත්තියං; † උපපුබ්බා. 'උපතිට්ඨතී'ති උපට්ඨානීයො; සිස්සා.

යෙහි වූ, ආදෙ පඤ්ච- ආදියෙහි දක්වන ලද නඤ්, අනීය, ඤණ්, ය, යක් යන මොහු පස්දෙන ද, භාවෙ- භාවයෙහි කරන ලද, කෙතා- කෘත්‍රප්‍රත්‍යය ද, අකත්තරි- කර්තෘකාරකයෙන් පිටත් නන්හි කරන ලද, අනෝ ච- අනප්‍රත්‍යය ද යන මොහු, නපුංසකෙ- නපුංසකලිඟයෙහි, සියුං- වන්නාහ.

භාවසම්මං- භාවයෙහි කරන ලද, ඤණ්-ඤණ් ප්‍රත්‍යය, පුමෙ- පුල්ලිඟයෙහි වන්නෙ ය; ඉයුවණ්ණගහාදිහො- ඉවණ්ණාදන්ත උවණ්ණාදන්ත ධාතූන් කෙරෙන් හා ගහාදි ධාතූන් කෙරෙන් වූ, අපච්චයො'පි ච- අප්‍රත්‍යය ද, එවං- මෙසෙ ම පුල්ලිඟයෙහි වන්නෙ ය; තුමාදිඤ්ඤානඤ්ඤා- තුං ප්‍රත්‍යය ආදි කොට කඤ්ඤා ප්‍රත්‍යය අන්ත කොට ඇති ප්‍රත්‍යයො, අසඞ්ඛ්‍යා සියුං-අසංඛ්‍ය නම් වන්නාහු සි.

අනීයෙ- අනීයප්‍රත්‍යය කළ කල්හි,

රා නස්ස ණො 5.171. තිපද සි.

රානන්තතො- රකාරාන්ත වූ, ක්‍රියස්ස- ධාතුහු කෙරෙන්, පරස්ස පර වූ, පච්චයනකාරස්ස- ප්‍රත්‍යයා සම්බන්ධි වූ නකාරයා හට, ණො හොති- ණකාරාදෙශ වෙ. කරණීයං- යනු වෙ. මෙහි දු භාවයෙහි නපුංසකලිඟ යැ; කර්මයෙහි වාච්‍යලිඟ සි. බහුලාධිකාරා-'බහුලං' යනු වැටෙන්නෙහි, කරණාදිසුපි භවන්ති- කරණාදි කාරකයෙහි දු තබ්බාදිප්‍රත්‍යයො වෙත්. සිනා- සිනා යන ධාතු, සොවෙය්‍ය- ශුචිත්වයෙහි වැටෙ; දිවාදිසෙසො- මේ ධාතුව දිවාදිගණෙහි සි. ප්‍රචුරප්‍රයොග නො වන බැවින් ධාතුපාඨයෙහි අපඨිත සි. අනෙන- මේ කරණ සොට ගෙන, සිනායනනීති- නාත් නු සි, සිනානීයං- සිනානීය නම් වෙ; චුණ්ණං- චූර්ණීය සි. ධාතුහු ආකාරාන්ත හෙයින් ඉකාර අනු පානන්ත නු සි එකාරාභාවය සි. 'පරො සවී' 1.27 සි පරසවර

---

* 'සිනායනන්ත'නෙනානි' ඉති සාහිත්‍ය.

† 'ගතිනිවත්තියං' ඉති සාහිත්‍ය.

ධාතූනමනෙකත්ථත්තායෙව ඨා ඉවචසම්ං ධාතුමහි සත්තමේ වොපට්ඨානත්ථං උපසද්දෝ ජොතෙති. වුත්තං හි:

'සත්තමෙව හි නීලාදිවණ්ණං දීපාදයෝ විය
ධාතුසම්ං සත්තමෙවත්ථං උපසඟ්ගා පකාසකා'ති*

වච=බ්‍යත්තාවවචනෙ;

ලොප් වෙ. දෘ- දෘ යන ධාතු, දෘතෙ- දීමෙහි වැටේ; අස්ස- මෝහට, දීයතෙති- † දෙනු ලැබෙ නු ඔ, දෘතීයෝ- දෘතීය නම් වේ; බ්‍රාහ්මණො- බමුණු ඔ. සම්ප්‍රදානයෙහි ඔ. ඨා- ඨා යන ධාතු, ගතිනිවත්තියං- ගමන් වැළැකීමෙහි වැටේ; උපපුබ්බා- උප පුළු ඔ. උපතිට්ඨතීති- එළඹැ සිටී නු ඔ-උපස්ථාන කෙරෙ නු ඔ, උපට්ඨායිකා- උපට්ඨායිය නම් වේ; සිස්සො- ශිෂ්‍ය ඔ. කතීෘ යෙහි ඔ.

ධාතූනං- ධාතූන්ගෙ, අනෙකත්ථත්තා එව- ‡ අනෙකාර්ථයෙහි ප්‍රවෘත්ති ඇති බව හෙයින් ම, ඨා ඉති- ඨා යන, අස්මිං ධාතුම්හි- මෙ-ධාතුයෙහි, සත්තමෙව- විද්‍යමාන වූ මැ, උපට්ඨානත්ථං- උපස්ථානාර්ථයැ, ඉ උපසද්දෙ- උපශබ්දය තෙමැ, ජොතෙති- පහළ කෙරේ. වුත්තං හි- කියන ලද මැ ඔ:

සත්තමේව හි- විද්‍යමාන වූ මැ, නීලාදිවණ්ණං- නීලාදිවර්ණය ප්‍රකාශ කරන්නා වූ, දීපාදයො විය- ප්‍රදීපප්‍රභෘත්‍යාදීන් මෙන්, ධාතුසම්ං- ධාතුයෙහි, සත්තං එව- විද්‍යමාන වූ මැ, අත්ථං- ගමන පවනාදි වූ අර්ථය, උපසඟ්ගා- උපසර්ගයො, පකාසකා- ප්‍රකාශ කරන්නාහු ඔ.

උපපුළු වූ ඨා=ගතිනිවත්තියං යන ධාතු ඨා ඔ කියා තිබෙයි. 'උපතිට්ඨති' යන වාක්‍යයෙහි ධාතුහු කෙරෙන් පර ව 'බහුලං' යනු වැටෙන හෙයින් 'භාවකම්මෙසු භාඛ්‍යානියා' 5.27 යන සූත්‍රයෙන් කතීෘකාරකයෙහි අනීයප්‍රත්‍යය වෙයි. 'පරො කිවි' 1.27 යන සූත්‍රයෙන් පරසවර ලොප් වෙයි. ප්‍රාදි තෙම අස්‍යාද්‍යන්තයා හා එක් ව 'බහුලං' යනු වැටෙන හෙයින් 'කුප්‍යාදයො නිච්චමස්‍යාදි විධිම්හි' 3 15 යන සූත්‍රයෙන් සමාස වෙයි. උපට්ඨායිකා යනු වෙ.

වච- වච යන ධාතු, බ්‍යත්තාවවචනෙ- අක්ෂරාත්මක ශබ්දයෙහි වැටෙ. භාසනාලාදි නිරක්ෂරශබ්දයො අව්‍යක්තාද්‍ය නම් වෙති.

---

* 'පකාසිතා' ඉති ඤාළේ.
† 'දීයතීති' ඒ සන්ත.
‡ 'අනෙකත්ථතාය එව' ඒ සන්ත.
§ 'අත්ථං- අර්ථෙ' ඒ සන්ත.

ඤණි. 5. 28

භාවකම්මෙසු ක්‍රියත්ථා පරෝ ඤණි හොති බහුලං. ඤකාර ණකාරානුබන්ධා.

කගා වජානං ඝානුබන්ධෙ. 5. 98

ඝානුබන්ධෙ වකාරජකාරන්තානං ක්‍රියත්ථානං කගා හොනති යථාකකමං වස්ස සෝ.

අඤා ණානුබන්ධෙ. 5. 84

ණකාරානුබන්ධෙ පච්චයෙ පරෙ උපන්තස්ස අකාරස්ස ආ හොති. 'වුච්චති'ති වාක්‍යං.

වි=වයෙ; ඤණි.

සුවණ්ණානමෙඛපච්චයෙ. 5. 82

ඉවණ්ණුවණ්ණන්තානං ක්‍රියත්ථානං එඛ හොනති යථාකකමං පච්චයෙති ඉසෙසකාරෙ, 'සරමහා දෙ'ති 1.34 යස්ස දීඝාවෙ ච 'වයනං, චියතීති වා' වෙය්‍යං.

දූ=දූනෙ;

ඤණි 5.28. එකපද සි.

භාවකම්මෙසු- භාවකම්දෙක්හි, ක්‍රියත්ථා පරෝ- ධාතූහු කෙරෙන් පර වූ, ඤණි- ඤණි ප්‍රත්‍යය තෙම, බහුලං- ඉෂ්ට පරිද්දෙන්, හොති- වේ. ඤකාරණකාරා- ඤකාරණකාරයෝ, අනුබන්ධා- අනුබන්ධයෝ සි.

කගා වජානං ඝානුබන්ධෙ 5.98. තිපද සි.

ඝානුබන්ධෙ- ඝානුබන්ධප්‍රත්‍යය පර කල්හි, වකාරජකාරන්තානං ක්‍රියත්ථානං- වකාරජකාරාන්ත වූ ධාතූන්ට, යථාකකමං- පන්නීන්, කගා හොනන්තීති- කකාරගකාරයෝ වෙත් නු සි, වස්ස- වකාරයහට, කෝ- කකාරයෙක් වෙ.

අඤා ණානුබන්ධෙ 5.84. තිපද සි.

ණකාරානුබන්ධෙ පච්චයෙ පරෙ- ණකාරානුබන්ධප්‍රත්‍යය පර කල්හි, උපන්තස්ස අකාරස්ස- උපාන්ත වූ අකාරයහට, ආ හොති- ආකාරාදෙශ වේ. වුච්චතීති- කියනු ලැබේ නු සි, වාක්‍යං- වාක්‍ය නම් වෙ.

වි- වි ඊන ධාතු, වයෙ- රැස් කිරීමෙහි වැටේ; ඤණි- ඤණි ප්‍රත්‍යය වේ.

සුවණ්ණානමෙඛපච්චයෙ 5.82. තිපද සි.

පච්චයෙ- ප්‍රත්‍යය පර කල්හි, ඉවණ්ණුවණ්ණන්තානං ක්‍රියත්ථානං- ඉවණ්ණන්ත උවණ්ණන්තධාතූන්ට, යථාකකමං- පන්නීන්, එඛ හොන්තීති- එකාර ඔකාර දෙදෙන වෙත් නු සි, ඉස්ස- ඉකා

ආසෙ ච. 5. 29

ආකාරන්තතෝ ඝඤ්ණි හොති භාවකම්මෙසු; ආසස්ස එ ච. 'දානං, දීයතීති වා' දෙය්‍යං.

වද=වචනෙ; 'වදදීහි යෝ'ති 5·30 භාවකම්මෙසු යෝ. වචඝහපුබ්බරූපෙසු, * 'වදනං, වදිතබ්බං වා' වජ්ජං අම්, ගම=ගමනෙ; වදදිත්‍වා යෙ, † 'ගමනං, ගම්‍යතෙති වා' ගම්මං ‡

ගුහ=සංවරණෙ; 'ගුහාදීහි ණක්' 5·32 ඉති භාවකම්මෙසු ණක්. කකාරෝ කාතුබ්බකාරියත්‍ථො.

රයහට, එකාරෙ- එකාරාදෙශ ද, සරමහා ඉතෙති- 'සරමහා ඉඞ්' 1·34 යන සූත්‍රයෙන්, යස්ස- යකාරයහට, දීඝභාවෙ ච- දීඝත්ත ද කළ කල්හි, චයන- රැස් කිරීම හො, එයතීති වා- රැස් කරනු ලැබෙ නු සි හො, චෙය්‍යං- චෙය්‍ය නම් වෙ. භාවකම් දෙකට වාක්‍යයි. මත්තෙහි ද මෙබඳු තන්හි මෙ ම නය සි.

දා- ද යන ධාතු, දානෙ- දීමෙහි වැටෙ.

ආසෙ ච 5·29· නිපද සි.

ආකාරන්තතෝ-ආකාරාන්තධාතුහු කෙරෙන්, භාවකම්මෙසු- භාවකම්දෙක්හි, ඝඤ්ණි හොති- ඝඤ්ණිප්‍රත්‍යය වෙහි. ආසස්ස- ආකාරයහට, එ ච- එකාරාදෙශ ද වෙ. දානං- දීම හො, දීයතීති වා- දෙනු ලැබෙ නු සි හො, දෙය්‍යං- දෙය්‍ය නම් වෙ.

වද- වදයන ධාතු, වචනෙ- කීමෙහි වැටෙ. වදදීහි යොති- 'වදදීහි යෝ' 5·30 යන සූත්‍රයෙන්, භාවකම්මෙසු- භාවකම්දෙක්හි, යෝ-යප්‍රත්‍යය වෙ. වචඝහපුබ්බරූපෙසු-වචගී පූර්වරූප කළ කල්හි, වදනං- කීම හො, වදිතබ්බං වා- කියයුත්තෙ හො, වජ්ජං- වජ්ජ නම් වෙ. අම- අම් යන ධාතු ද, ගම- ගම් යන ධාතු ද, ගමනෙ- ගමන්හි වැටෙ; වදදිත්‍වා- වදදි බව හෙයින්, යෙ- යප්‍රත්‍යය කළ කල්හි, ගමනං- යාම හො, ගම්‍යතෙති වා- යනු ලැබෙ නු සි හො, ගම්මං- ගම්ම නම් වෙ.

ගුහ- ගුහ යන ධාතු, සංවරණෙ- මූවා කිරීමෙහි වැටෙ; ගුහාදීහි ණක් ඉති- 'ගුහාදීහි ණක්' 5·32 යන සූත්‍රයෙන්, භාවකම්මෙසු- භාවකම්දෙක්හි, ණක්- ණක්ප්‍රත්‍යය වෙ. කකාරෝ- කකාර තෙම, කාතුබ්බකාරියත්‍ථො- කාතුබ්බකාර්‍යයී ප්‍රයොජන කොට ඇත්තෙ සි; වෘද්‍ධි නො වීම ප්‍රයොජන කොට ඇත්තෙ සි සෙයි.

---

* 'වචඝහපුබ්බරූපෙ' කඤ්චි. † 'යෝ' කඤ්චි.

‡ 'ගම්‍යං' ඉති ම. ඉධ ච.

ලහුඝඤ්ඤුපණතස්ස. 5 83

ලහුඝතස්ස උපණතස්ස යුවණ්ණස්ස එඔ හොනති යථා කකමං පවවයෙති සම්පත්තසෙසාකාරස්ස 'න තෙ කාතුබඛිනා ගමෙසූ'ති 5·85 පටිසෙධො. 'ගහනං, ගුඛිතබබං වා' ගුයහං, විපල්ලාසො*

සාස=අනුසිට්ඨියං; යක්.

සාසඝස්ස සිස් වා. 5. 117

සාසස්ස වා සිස් හොති කාතුබඛෙ. පුබබරූපෙ, † 'සාසියතී'ති සිසෙසා

සිසාදෙසාභාවපඛෙ,

ඝඩි බ්‍යඤ්ජනස්ස. 5. 170

ලහුඝඤ්ඤුපණතස්ස 5·83· දවිපද සි.

පවවයෙ- ප්‍රත්‍යයා පර කල්ගි, ලහුඝතස්ස- ලඝු වූ, උපණතස්ස- උපානත වූ, යුවණ්ණස්ස- ඉවණ්ණුවණ්ණයාහට, යථාකකමං- පනතීන්, එඔ හොනතීති- එඔ දෙදෙන වෙත් නු සි, සම්පත්තස්ස- සම්ප්‍රාප්ත වූ-උකාරයහට සපැමිණි, ඔකාරස්ස-ඔකාරයහට, 'න තෙ කාතුබඛිනාගමෙසූති- 'න තෙ කාතුබඛිනා ගමෙසු' 5·85 යන සූත්‍රයෙන්, පටිසෙධො- ප්‍රතිෂෙධ වෙ. ගුහනං- සැඟවීම හො, ගුඛිතබබං වා- සැඟවිය යුත්තෙ හො, ගුයහං- ගුයහ නම් වෙ. විපල්ලාසො- ඔකාරවිපර්‍යාස වෙ*

සාස- සාස යන ධාතු, අනුසිට්ඨියං- අනුශාසනායෙහි වැටෙ, යක්- යක්ප්‍රත්‍යය වෙ.

සාසඝස්ස සිස් වා 5·117· තිපද සි.

කාතුබඛෙ- කාතුබඛිප්‍රත්‍යයා පර කල්ගි, සාසස්ස- සාස= අනුසිට්ඨියං යන ධාතුහට, වා- විකල්පයෙන්, සිස් හොති- සිස් යන ආදෙශ වෙ. පුබබරූපෙ- යකාරයහට පූර්වරූප කළ කල්ගි,† සාසියතීති- අනුශාසනා කරනු ලැබෙ නු සි, සිසෙසා- සිසස නම් වෙ ‡

සිස්සාදෙසාභාවපඛෙ- සිස් යන ආදෙශ නු වූ පක්‍ෂයෙහි,

ඝඩි බ්‍යඤ්ජනස්ස 5·170· දවිපද සි.

---

* 1. 50. † 1. 49. ‡ 'සිසස නම් වෙ' සමන්තර.

ක්‍රියස්ස පරස්ස බ්‍යඤ්ජනාදිපච්චයස්ස ඤ්ඩි වා හොති. ඤකාරො 'ඤ්ඩිලසෙසෙ'ති 5·163 විසෙසනත්ථො. සාසියෙ. වවත්‍ථිත විභාඝත්‍ථා වාධිකාරස්ස ඝවි ඤ්ඩිසාහාවො. කත්තබ්බං.

කත්තරි ලුතුණකා. 5. 33

කත්තරි කාරකෙ ක්‍රියත්ථා ලුතුණකා හොනති. ලකාරො 'ලුතුපිතාදීනමා සිමහි'ති 2·59 විසෙසනත්ථො. 'දදතී'ති දතා.

ණකො,

ආසසාණාපිමහි සුක්. 5. 91

ක්‍රියත්ථා පරස්ස- ධාතුහු කෙරෙන් පර වූ, බ්‍යඤ්ජනාදිපච්චයස්ස- බ්‍යඤ්ජනාදි ප්‍රත්‍යයයාට, වා- විකල්පයෙන්, ඤ්ඩි හොති- ඤ්ඩිආගම වෙ. ඤකාරො- ඤකාර තෙම, ඤ්ඩිලසෙසෙති- 'ඤ්ඩිලසෙ' 5·163 යන සූත්‍රයෙහි, විසෙසනත්ථො- විශෙෂණය ප්‍රයොජන කොට ඇත්තෙසි. සාසියෙ-යනු වෙ. වාධිකාරස්ස- වාධිකාර යාඃඝ, වවත්‍ථිතවිභාඝත්‍ථා- ව්‍යවස්ථිතවිභාඝ බව හෙයින්, ඝවි- කිසි තැනෙක්හි, ඤ්ඩිස්ස- ඤ්ඩිආගමයාගෙ, අභාවො- නො වීම වෙ. කත්තබ්බං-යනු වෙ. මෙහි බ්‍යඤ්ජනාදිප්‍රත්‍යයා පර වුව ද වාධිකාරයෙන් ඤ්ඩිආගම නො වෙ.

කත්තරි ලුතුණකා 5·33· දම්පද සි.

ක්‍රියත්ථා- ධාතුහු කෙරෙන්, කත්තරි කාරකෙ-* කර්තෘකාරක යෙහි, ලුතුණකා හොනති- ලුතු ණක ප්‍රත්‍යයො වෙත්. ලකාරො- ලකාර තෙම, ලුතුපිතාදීනමා සිමහීති- 'ලුතුපිතාදීනමා සිමහි' 2·59 යන සූත්‍රයෙහි, විසෙසනත්ථො- විශෙෂණය ප්‍රයොජන කොට ඇත්තෙ සි. දදතීති- දෙනු සි, දතා- දතා නම් වෙ.

දෘ=දනෙ යන ධාතුහු කෙරෙන් පර ව 'දදති' යන වාක්‍ය යෙහි මෙසින් ලුතුප්‍රත්‍යය වෙසි. ලකාර අප්‍රයොගී වෙසි. දතු ශබ්ද ය. ඔහු කෙරෙන් සිවිහක්නි වෙසි. සි පර කල්හි ලුතුප්‍රත්‍ය ඝාතනයගට 'ලුතුපිතාදීනමා සිමහි' 2·59 යන සූත්‍රයෙන් ආකාරා දෙශ වෙසි. සිහට 'ගසීනං' 2·119 යන සූත්‍රයෙන් ලොප් වෙසි. දතා යනු වෙ.

ණකෙ- ණකප්‍රත්‍යය කළ කල්හි,

ආසසාණාපිමහි සුක් 5·91· ආසස යැ අණාපිමහි යැ යුක් යැ යනු පද සි.

---

* 'කත්තරි' පොත්හි.

ආකාරන්තස්ස ක්‍රියත්ථස්ස යුක් හොති ණාපිතෝ'සඤ්ඤසම්ං ණානුබන්ධේ. දයතෝ.

වධ=හිංසායං; 'සදි බ්‍යසඤ්ඤනසසා'ති 5·170 සදි. 'වධෙතීති වධිතා. ණෙ, 'අසසා ණානුබන්ධේ'ති 5·84 උපන්තස්ස අස්ස ආතෙන සම්පත්තෙන,

අඤ්ඤදත්‍රාපි. 5. 87

කානුබන්ධනාගමතෝ'සඤ්ඤම්මපි තෙ එඔආ කිවි න හොනතීති පටිසෙධෝ. වධතෝ

ලූ=වෙජ්දනෙ;

කිවණේ. 5. 41

කම්මතෝ පරා ක්‍රියත්ථා කිවි අණේ හොති කත්තරි. ඔකාරෙ, *

ණාපිතෝ– ණාපිප්‍රත්‍යයා කෙරෙන්, අඤ්ඤසම්ං– අන්‍ය වූ, ණානුබන්ධේ– ණානුබන්ධප්‍රත්‍යයා පර කල්හි, ආකාරන්තස්ස ක්‍රියත්ථස්ස– ආකාරාන්ත වූ ධාතූනට, යුක් හොති– යුක් වේ. දයතෝ– යනු වේ.

වධ– වධ යන ධාතු, හිංසායං– හිංසා කිරීමෙහි වැටේ. සදි බ්‍යසඤ්ඤනසසාති– 'සදි බ්‍යසඤ්ඤනසස' 5·170 යන සූත්‍රයෙන්, සදි– සදිආගම වේ. වධෙතීති– මරා නුසි, වධිතා– වධිතා නම් වේ. ණෙ– ණෙප්‍රත්‍යය කළ කල්හි, අසසා ණානුබන්ධේති– 'අසසා ණානුබන්ධේ' 5·84 යන සූත්‍රයෙන්, උපන්තස්ස– උපාන්ත වූ, අසස– අකාරයහට, ආතෙන සම්පත්තෙන– ආත්ව පැමිණි කල්හි, †

අඤ්ඤදත්‍රාපි 5·87 දිවිපද සි.

කානුබන්ධනාගමතෝ– කානුබන්ධනාගමයෙන්, අඤ්ඤසම්ම්පි– අන්‍ය ද වූ ප්‍රත්‍යයා පර කල්හි, තෙ එඔආ– එ එ, ඔ, ආ යන ආදෙශයෝ, කිවි– කිසි තැනෙක්හි, න හොනතීති– නො වෙත් නු සි, පටිසෙධෝ– ප්‍රතිෂෙධ වේ. වධතෝ–යනු වෙ

ලූ– ලූ යන ධාතු, ඡෙදනෙ– කැපීමෙහි වැටේ.

කිවණේ 5·41· කිවි ඇ අණේ ඇ යනු පද සි.

කම්මතෝ පරා– කම්වාචීහු කෙරෙන් පර වූ, ක්‍රියත්ථා–ධාතූහු කෙරෙන් පර ව, කත්තරි– කර්‍තෘකාරකයෙහි, කිවි– කිසි තැනෙක්හි, අණ් හොති– අණ්ප්‍රත්‍යය වේ. ඔකාරෙ– ධාතූහුගෙ ඌකාරයහට ඔකාරාදෙශ කළ කල්හි, ‡

---

* 'ඔකාරෙ' බහුසු. † 'සම්ප්‍රාප්ත කල්හි' සමහර. ‡ 5. 82.

ආයාවා ණානුබන්ධෙ. 5. 90

එඹනමායාවා හොන්ති යථාකකමං සරාදෙ, ණානුබන්ධෙතී තසසාවාදෙසො. 'සරං ලුනාතී'ති සරලාවො. 'කුම්භං කරොතී'ති කුම්භකාරො. කුවීති කිං? කම්මකාරො. එත්ථ 'භාවකාරකෙ සවඤ්ඤකා'ති 5·44 අපපච්චයො.

දිස=පෙක්ඛනෙ;

සමානසදසභවනනයාදිතුපමානා දිසා සමෙම රීරික්ඛකා. 5. 43

ආයාවා ණානුබන්ධෙ 5·90· දවිපද සි.

සරාදෙ, ණානුබන්ධෙ- සවරාදි වූ ණානුබන්ධප්‍රත්‍යයා පර කල්හි, එඹනං- එකාර ඔකාර දෙදෙනාහට, යථාකකමං-පනතින්, ආයාවා හොන්තීති- ආය ආව යන ආදෙශයෝ වෙත් නු සි, තසස- ඔහට, ආවාදෙසො- ආව යන ආදෙශ වෙ. සරං- ශරය, ලුනාතීති- කපා නු සි, සරලාවො- සරලාව නම් වෙ. සරං යන දවිතීයාන්තය උපපද කොට ඇති ලූ=චෙජ්දනෙ යන ධාතුහු කෙරෙන් 'සරං ලුනාති' යන වාක්‍යයෙහි 'කුවණි' 5·41 යන සූත්‍රයෙන් කතෘකාරකයෙහි අණ්ප්‍රත්‍යය කොට, ඔකාර ද* ආවා දෙශ ද අමාදිසමාස ද කට සුතු.

කුම්භං- ඝටය, කරොතීති- කෙරෙ නු සි, කුම්භකාරො- කුම්භකාර නම් වෙ. කුම්භං යන දවිතීයාන්තයා උපපද කොට ඇති කර=කරණෙ යන ධාතුහු කෙරෙන් කී නියෙන් අණ්ප්‍රත්‍යයාදි කට සුතු.

කුවීති- කුවි යනු, කිං-කුමට යැ? කම්මකාරො යන තැන්හි අණ්ප්‍රත්‍යය එතා වන පිණිස සි. එත්ථ- මෙ කම්මකරෙ යන තැන්හි, භාව—පෙ—ඝකා ඉති- 'භාවකාරකෙසවඤ්ඤකා' 5·44 යන සූත්‍රයෙන්, අපපච්චයො- අප්‍රත්‍යය වෙ.

දිස- දිස යන ධාතු, පෙක්ඛනෙ- බැලීමෙහි වැටෙ.

සමානසදසභවනනයාදිතුපමානා දිසා සමෙම රීරික්ඛකා 5·43· සමානසදසභවන්නයාදිතො යැ උපමානා යැ දිසා යැ කතෙම යැ රීරික්ඛකා යැ ඝනු පද සි.

---

* 5. 82.

සමානාදීහි යාදීහි වොපමානෙහි පරා දිසා කම්මකාරකෙ රීරිකඛකා හොනති. 'රානුබඤ්ඤෙ'නන්තරාදිසස්ස'ති 4·132 දිසස්ස ඉස්භාගස්ස ලොපෙ, 'රීරිකඛකෙසූ'ති 3·85 සමානස්ස සාදෙසෙ ච, 'සමානො විය දිසතී'ති සදී; සදිකෙඛා.

කෙ,

න තෙ කානුබන්ධිනාගමෙසු. 5. 85

තෙ එඹා කානුබඤ්ඤ නාගමෙ ච න හොනතීති එතතා භාවෙ, සදිසො.

උපමානෙහි- උපමානවාචී වූ, සමානාදීහි- සමානාදීන් කෙරෙන් ද, යාදීහි ච- යාදීන් කෙරෙන් ද, පරා- පර වූ, දිසා- දිස=පෙකඛනෙ යන ධාතුහු කෙරෙන්, කම්මකාරකෙ- කර්මකාරක යෙහි, රීරිකඛකා හොනති- රී රිකඛ ක ප්‍රත්‍යයො වෙත්. රී යැ රිකඛ යැ ක යැ යන මෙ ප්‍රත්‍යයො තුන්දෙන වෙති යි සෙයි. සමානාදීහු නම් සූත්‍රොක්ත සමාන අසදෘස භවන්ත යන මොහු යි. යාදීහු නම් ය තය ත එත ඉම අමු කිං තුමහ අමහ යන සබ්බාදි යෙහි පඨිත ශබ්දයො යි.

රානු—පෙ—ඉනි- 'රානුබඤ්ඤෙ'නන්තරාදිසස්ස' 4·132 යන සූත්‍ර යෙන්, දිසස්ස- දිස යන ධාතුහුගෙ, ඉස්භාගස්ස ලොපෙ-ඉස්භාග ලොප ද, රීරිකඛකෙසූති- 'රීරිකඛකෙසූ' 3·85 යන සූත්‍රශෙෂන්, සමානස්ස- සමානශබ්දයහට, සාදෙසෙ ච- සකාරාදෙශ ද කළ කල්හි, සමානො විය- සදෘශයක්හු මෙන්, දිසතීති- දක්නා ලැබෙ නු යි, සදී- සදී නම් වෙයි; සදිකෙඛා- සදිකඛ නම් වෙ.

කෙ- කප්‍රත්‍යය කළ කල්හි,

න තෙ කානුබන්ධිනාගමෙසු 5·85 ප්‍රතිෂෙධසූත්‍ර යි. නිපද යි.

කානුබඤ්ඤෙ- කානුබන්ධප්‍රත්‍යයා පර කල්හි ද, නාගමෙ ච- නකාරාගමවිශයෙහි ද, තෙ එඹා- එ එ, ඔ, ආ යන මොහු, න හොනතීති- නො වෙත් නු යි එතතාභාවෙ- එවිය නු වූ කල්හි, සදිසො- සදිසො යනු වෙ.

ප්‍රථමාන්ත වූ සමානශබ්දයා උපපද කොට ඇති දිස= පෙකඛනෙ යන ධාතු දිස් කියා තුන් තැනකැ නිබඳයි. 'සමානො විය දිසතී' යන වාක්‍යයෙහි උපමානවාචී වූ සමානශබ්දයා කෙරෙන් පර වූ දිස=පෙකඛනෙ යන ධාතුහු කෙරෙන් පර වැ 'සමානසදිසෙ' 5·43 යනාදි සූත්‍රයෙන් කර්මකාරකයෙහි රීප්‍රත්‍යය වෙයි.

සමානා රෙ රීරිකඛසෙසු. 5. 125

සමානසඳ්‍දතො පරස්ස දීඝස්ස ර හොති වා රීරිකඛසෙසූසී පකෙඛ දස්ස රාදෙසෙ, සරි; සරිකෙඛා; සරිසො.

සඛඛාදීනමා. 3. 86

රීරිකඛසෙසු සඛඛාදීනමා හොති. අඤඤදී; අඤඤදිකෙඛා; අඤඤදිසො.

නතකිමිමානං ටාකීවී. 3. 87

රිකඛප්‍රත්‍යය වෙයි. ඝප්‍රත්‍යය වෙයි. රාත්‍රුඛඛිප්‍රත්‍යයා පර කල්හි දිස යන ධාතුහුගෙ ඉස්භාගයඝට 'රාත්‍රුඛකෙ'නනසරාදිසු'4·132 යන සූත්‍රයෙන් ලොප් වෙයි. 'විසෙසනමෙඝතෙන' 3·11 සී හො 'සඃාදි සඃාදිනෙඝතෙ' 3·1 සී හො සමානශබ්දයා හා සමාස වෙයි, රී රිකඛ ඝ ප්‍රත්‍යයන් පර කල්හි සමානශබ්දයඝට 'රීරිකඛ ඝසු'3·85 යන සූත්‍රයෙන් සකාරාදෙශ වෙයි සදී, සදිකෙඛා යනු වෙ. ඝප්‍රත්‍යයාගෙ ඝකාර අත්‍රුඛඛි ය; ප්‍රත්‍යයා පර කල්හි ලඹු වූ උපාන්තයඝට 'ලහුස්සුපන්තස්ස'5·83 සී එකාරාදෙශ ද පත්තෙහි, 'න තෙ කාත්‍රුඛඛිනාගමෙසු' සී ප්‍රතිෂෙධ වෙයි. සදිසො යනු වෙ.

සමානා රෙ රීරිකඛසෙසු 5 125· කිපද සී.

රීරිකඛසෙසු- රී රිකඛ ඝ ප්‍රත්‍යයන් පර කල්හි, සමානසඳ්‍දතො පරස්ස- සමානශබ්දයා කෝරෙන් පර වූ, දීඝස්ස- දීඝ යන ධාතුඝට, වා- විකල්පයෙන්, ර හොතීති- රකාරාදෙශ වෙ ත්‍රු සි, පකෙඛ- පක්ෂඝයක්හි, දස්ස- දකාරඝයඝට, රාදෙසෙ- රකාරාදෙශ ඝළ කල්හි, සරි යනාදි වේ. වාක්‍ය ද සිද්ධ ද අර්ථ ද ඝට කී නියෙනි.

සඛඛාදීනමා 3 86· දහිපද සී.

රීරිකඛසෙසු- රී රිකඛ ඝ ප්‍රත්‍යයන් පර කල්හි, සඛඛාදීනං- සඛඛාදීන්ට, ආ හොති- ආකාරාදෙශ වෙ. අඤඤදී යනාදි වෙ. 'අඤඤ විය දිස්සති' යනු විග්‍රහ සි. අනික්ඛ්‍ත මේන් දක්නා ලැබෙ ත්‍රු සි යන අර්ථ සි.

නතකිමිමානං ටාකීවී 3·87· නතයිම්මානං යැ ටාකීවී යැ යනු පදඝ සි.

රීරිකඛතොසු නත්ථකිංඉමසද්දානං වාකිරී හොනති යථාක්කමං. එකාරා සබ්බාදෙසත්ථා. භවාදී; භවාදිතෙකා; භවාදිසෝ. යාදී; යාදිතෙකා; යාදිසෝ. තාදී; තාදිතෙකා; තාදිසොවවාදි*

තුම්හඅම්හානන්තු අයං විසෙසෝ:

තුම්හාමහානං නාමෙකත්තම්. 3. 88

රීරිකඛතොසු තුම්හඅම්හානං† නාමා හොනේකත්තම්ං යථාක්කම්ං. නාදී; මාදී. නාදිතෙකා; මාදිතෙකා. නාදිසෝ; මාදිසෝ. එකත්තන්ති කිං? තුම්හාදිසෝ; අම්හාදිසෝ

රීරිකඛතොසු- රී රිඛඛ ක ප්‍රත්‍යයන් පර කල්හි, නත්ථකිංඉමසද්දානං- නත්ථ කිං ඉම ශබ්දයන්ට, යථාක්කමං- පනතින්, වාකිරී හොනති- වා කී රී යන මෙ ආදෙශයෝ වෙත්. වත්තාරා- වත්තාරයෝ, සබ්බාදෙසත්ථා- සර්‍වාදෙශය ප්‍රයොජන් හෝවේ ඇත්තා හු සි. භවාදී යනාදී වේ. 'භවං වීය දිස්සති, යෝ වීය දිස්සති, සෙයා ‡ වීය දිස්සති' යනු විග්‍රහ සි. භවං වීය- භවත්හු මෙන්. යෝ වීය- යම්කිහු මෙන්. සෙයා ‡ වීය- ඔහු මෙන්

තුම්හඅම්හානන්තු- තුම්හඅම්හශබ්දයන්ගෙ ච්‍යාඝි, අයං- මේ තෙමෑ, විසෙසෝ- වෙනස සි:

තුම්හාමහානං නාමෙකත්තම්.[3.88] තුම්හාමහානං යෑ නාමා යෑ එකත්තම්ං යෑ යනු පද සි.

රීරිකඛතොසු- රී රිඛඛ ක ප්‍රත්‍යයන් පර කල්හි, එකත්තම්ං- එකවචනයෙහි වැටෙන්නා වූ, තුම්හඅම්හානං- තුම්හ අම්හ ශබ්දයන්ට, යථාක්කම්ං- පනතින්, නාමා හොනති- නා මා යන ආදෙශයෝ වෙත්. නාදී යනාදි වෙ. 'තවම්ව දිස්සති, අහම්ව දිස්සති' යනු විග්‍රහ සි. තවම්ව- නා මෙන්. අහම්ව- මා මෙන්.

එකත්තන්ති- එකවචනයෙහි වැටෙන්නා වූ යනු, කිං- කුමට යෑ? තුම්හාදිසෝ, අම්හාදිසෝ- යන තැන්හි බහුවචනවිෂයෙහි

---

* 'නාදී තාදිඛඛා තාදිසොවවාදි' ඝණ්ඨ්.

අයමුදාහරණඝණ්ඨාමෝ පවත්තයිඛ්බායඝණ්ඨසුත්තඝණ්ඨාභිධම්ම දෙසනා; සුත්තානානං සම්මාදිට්ඨිදීපනං යථාපරිපාටියා උදාහරණානි භවන්තු ඉති කත්වා. තතොව කිඤ්චාපතෙන සුත්තෙන කිම්මානං කීවිආදෙසාපි විධීයතෙත්ථ, තත්ථාපි න තෙසමුඝාතසාමුදාහරණානි දත්තානි; ගන්ථලඝුභාවං ච සමාඛඛාය. තෙසං පන උදාහරණානි 'කීදී, කීදිඛඛා, කීදිසෝ; ඒදී, ඒදිඛඛා, ඒදිසෝ'ති සුතඛඛානි ඉවත්තෙඛඛි.

† 'තුම්හඅම්හසද්දානං' ඝණ්ඨ්. ‡ 'භෝ' ති ඝණ.

වි=වියෙ;

භාවකාරතොඤ්ඡඝණ්ඡකා. 5. 41

භාවෙ කාරතො ච ක්‍රියතථා අඝණ්ඡකා හොනති බහුලං. අ; ඉසෙසකාරෙ, *

එඛනමයවා සරෙ. 5. 89

සරෙ පරෙ එඛනමයවා හොනති යථාසකමනති තසස අයා දෙසො. 'වයනං, වියනීති වා' වියො. නී=පාපුණනෙ; † විපුබෙබා, 'විනයනං, විනෙතීති වා' විනයො. රු=සද්දෙ; 'රවනං' රවො.

නා මා යන ආදෙශ නො වන පිණිස යි. මෙ ප්‍රත්‍යුදාහරණයෙහි 'තුමෙහ විය දිසසති, අමෙහ විය දිසසති' යි බහුත්වයෙන් විග්‍රහ යැ. 'ඛ්‍යසජ්ජනෙ දිසරසසා' 1.33 සි දිඝ වෙයි‡.

වි- වි යන ධාතු, වියෙ- රැස් කිරීමෙහි වැටෙ.

භාවකාරතොඤ්ඡඝණ්ඡකා 5.44. ද්විපද යි.

ක්‍රියතථා- ධාතූහු තොරෙන් පර ව, භාවෙ- භාවයෙහි ද, කාරතො ච- කාරකයෙහි ද, බහුලං- ඉෂ්ට පරිද්දෙන්, අඝණ්ඡකා හොනති- අ ඝ ණ් ඡ ක ප්‍රත්‍යයො වෙත්. මෙහි ණකාරඝකාර කකාරයෝ එ ඒ කාර්‍ය්‍ය ප්‍රයොජන නොට ඇති අනුබන්ධයො ය; එහෙයින් අකාරමාත්‍රයෙක් ම වෙයි.

අ- අප්‍රත්‍යය වෙ; ඉසස- ඉකාරයහට, එකාරෙ- එකාරාදෙශ කළ කල්හි, *

එඛනමයවා සරෙ 5.89. නිපද යි.

සරෙ පරෙ- සවරයා පර කල්හි, එඛනං- ධාතූහු සඛන්ධි වූ එකාරඛකාරයන්ට, යථාසකමං- පනතීන්, අයවා හොනතීති- අය අව යන ආදෙශයෝ වෙත් නු යි, තසස- එ කරන ලද එකාරයහට, අයාදෙසො- අය්‍යාදෙශ වෙ. වයනං- රැස් කිරීම හො, වියතීති වා- රැස් කරනු ලැබේ නු යි හො, වියො- වය නම් වෙ. නී- නී යන ධාතු, පාපුණනෙ- පැමිණීමෙහි වැටෙ; විපුබෙබා-

---

* 5. 82. † 'පාපනන' කළුවි.

‡ තුමහාදිසො.යනාදිය විරිනඝන්‍යයෙහින් මෙසෙ ම දිඝ කොට සාධන ය. සාරත්‍ථවිලාසිනී පඤ්චිකාටීකායෙහි 'සඛ්‍යාදිනමා' 3.86 යන සූත්‍රයෙන් ආකාර දෙශ කොට ම සාධන යි. තුමහඅම්හඝබ්දයා සඛ්‍යාදියට ඇතුළත් ද වන් නාහු ය.

භූ=සත්තායං; 'භවනං' භවෝ. ගහ=උපාදානෙ; පපුබ්බා; 'පගහ' ණාභනං' පගහහෝ. ගහමදදරරණසරවරවරාදයෝ ගහාදයෝ.

කර=කරණෙ; කිවජ්ජතෙ දුමහි, අකිවජ්ජතෙසු ඊසංසුවූප පදෙසු, 'දුකෙඛන කරියතීති, කරණං වා' දුක්කරං. 'සුඛෙන කරියතීති, කරණං වා' ඊසක්කරං; සුකරං.

චජ=හානියං; ඝණි; 'වජ්ජතෙ' වාගෝ. පව=පාකෙ; නිපුබ්බා; ඝ; 'නිපවතී'ති නිපකෝ. ඛිප=පෙපරණෙ; ඝ; 'ඛිපතී'ති ඛිපෝ *

විපුළී සි; විනයනං- භික්ඛිම හෝ, විනෙතීති වා- භික්ඛවා නු සි හෝ, විනයෝ- විනය නම් වෙ. භාවකතීං දෙක්හි අප්‍රත්‍යය කොට ප්‍රාදිසමාස කට යුතු.

රෑ- රෑ යන ධාතු, සද්දෙ- ශබ්දයෙහි වැටෙ; රවනං- ශබ්ද කිරීම, රවෝ- රව නම් වෙ. භූ- භූ යන ධාතු, සත්තායං- ඕමෙහි වැටෙ; භවනං- වීම, භවෝ- භව නම් වෙ. ගහ- ගහ යන ධාතු, උපාදානෙ- ගැන්මෙහි වැටෙ; පපුබ්බා- පපුළී සි; පගහණාභනං- † ප්‍රග්‍රහ කිරීම, පගහහෝ- පගහහ නම් වෙ. පපුළී වූ ගහ=උපාදානෙ යන ධාතු ඝ. ප්‍රාදිසමාස සොට ගහා රූපහට දිවිබ කරනු.

ගහ—පෙ—වරාදයෝ- ගහ=උපාදානෙ, මද=උම්මාදෙ, දර=දරණෙ, රණ=සද්දෙ, සර=ගතිහිංසාඛ්‍යානාසු, වර=අවරණී චජාසු, වර=ගතිහකඛනෙසු යනමෙ ආදිහු, ගහාදයෝ- ගහාදිහු නම් වෙත්. ගහාදිධාතූන් කෙරෙන් භාවයෙහි කරන ලද අප්‍රත්‍යය පුලිඳු ය සි යම කී හෙයින් ගහාදිහු නම් මොහු ය සි දක්වනු පිණිස ගහාදීන්ගෙ නිදේශය කරන ලදි.

කර- කර යන ධාතු, කරණෙ- කිරීමෙහි වැටෙ; කීවජ්ජතෙ- කෘවර්ජ්‍රාර්ථයෙහි වැටෙන්නා වූ, දුමහි- දුහබදයා ද, අකිවජ්ජතෙසු- අකෘවර්ජ්‍රාර්ථයෙහි වැටෙන්නා වූ, ඊසංසු ව- ඊසං ය සු ය යන මොවුන් ද, උපපදෙසු- උපපද කල්හි, දුකෙඛන- දුකින්, කරියතීති- කරනු ලැබෙ නු සි හෝ, කරණං වා- කිරීම හෝ, දුක්කර- දුක්කර නම් වෙ. සුඛෙන- සුවයෙන්, කරියතීති- කරනු ලැබෙ නු සි හෝ, කරණං වා- කිරීම හෝ, ඊසක්කරං- ඊසක්කර නම් වෙ. සුකර- සුකර නම් වෙ.

---

* 'ඛිපකා' සබ්බත්ථ. † 'ඔගහණං' ති සමහර.

පි=තපපනෙ.

සුවණ්ණානමිඝඩ්වඩ් සරෙ. 5. 136

ඉවණ්ණුවණ්ණන්නානං ක්‍රියත්‍ථානමිඝඩ්වඩ් හොන්ති සරෙ කිඛිති ඉයඩ්. 'පිනෙති'ති පියො.

හු=සත්තායං; අභිපුබ්බො.

සී. 5. 47

ක්‍රියත්‍ථා සී හොති බහුලං භාවකාරකෙසු.

ඊසංඝබ්දයා සුකරබ්යෙහි වැටෙන හෙයින් 'සුඛෙන කරීයතීති, කරණං වා' යි කියන ලදි. 'ඊසමකිලෙජ්ජන කරීයතීති කරණා වා' යනු විග්‍රහ යි. 'සබ්‍යාදි සබ්‍යාදිනෙකන්ථං' [3 1] යි සමාස වෙ. සුකරං යනු ප්‍රාදිසමාස යි.

වජ-වජ යන ධාතු, හානියං- හැරීමෙහි වැටෙ; ඝණ්-ඝණ්ප්‍රත්‍යය වෙ; වජනං- හැරීම, චාගො- වාග නම් වෙ. පව-පව යන ධාතු, පාකෙ- පිසීමෙහි වැටෙ; නිපුඛෙකා- නිපුණී යි; ඝ- ඝප්‍රත්‍යය වෙ; නිපවන්ති- ඥානපරිපාකයට යෙනු යි, නිපඤ්ඤා- නිපඤ්ඤ නම් වෙ ඛිප්-ඛිප යන ධාතු, පෙරණෙ- දැමීමෙහි වැටෙ; ඝ- ඝප්‍රත්‍යය වෙ; ඛිපතීති- දමා නු යි, ඛිපොං- ඛිප නම් වෙ.*

පි- පි යන ධාතු, තපපනෙ- පිනවීමෙහි වැටෙ.

සුවණ්ණානමිඝඩ්වඩ් සරෙ [5·136·] නිපද යි.

සරෙ- සවරයා පර කල්හි, ඉවණ්ණුවණ්ණන්නානං ක්‍රියත්‍ථානං- ඉවණ්ණන්ත උවණ්ණන්තධාතූන්ට, කිඛි- කිසි තැනෙක්හි, ඉයඩ්වඩ් හොන්තීති- ඉයඩ් උවඩ් යන මොහු වෙත් නු යි, ඉයඩ්-† ඉයඩ් වෙ. පිනෙතීති- පිනවා නු යි, පියො- පිය නම් වෙ.

හු- හු යන ධාතු, සත්තායං- වීමෙහි වැටෙ; අභිපුබ්බො- අභිපූහී යි.

සී [5·47·] එකපද යි.

ක්‍රියත්‍ථා- ධාතුහු කෙරෙන් පර වැ, භාවකාරකෙසු- භාවකාරක දෙක්හි, බහුලං- ඉෂ්ට පරිද්දෙන්, සී හොති- සීප්‍රත්‍යය වෙ.

---

* 'ඛිපඤ්ඤා- ඛිපඤ්ඤ නම් වෙ' සියලු. † 'ඉයඩ් හොති' සී සත්‍ය.

සිස්ස. 5. 159

ක්‍රියත්ථා පරස්ස සිස්ස ලොපෝ හොතීති සිලොපෙ, 'අති භවතී'ති අතිභූ. එවං සයම්භූ. අම, ගම=ගමනෙ; සිම්හි, 'සිම්හි ලොපෝ'නන්තබ්‍යඤ්ඤනස්සා'ති 5·94 මලොපෝ. 'උරසා ගච්ඡතී'ති උරගෝ.

දෘ=දෘනෙ; 'අනෝ'ති 5·48 ක්‍රියත්ථා භාවකාරකෙසුතෝ. 'දත්ති, දීයතීති වා' දානං. සංපුබ්බෙඛ, 'සම්මා පදීයතෙ යස්ස' තං සම්පදානං. අපආපුබ්බෙඛ, 'අපාදදාති එතස්මා'ති අපාදානං. කර=කරණෙ; අධිපුබ්බෙඛා; 'රා නස්ස ණෝ'ති 5·171 ණෝ. 'අධිකරී යති එතස්මි'න්ති අධිකරණං.

සිස්ස 5·159· එකපද සි.

ක්‍රියත්ථා පරස්ස- ධාතුහු කෙරෙන් පර වූ, සිස්ස- සිහට, ලොපෝ හොතීති- ලෝප් වෙ නු සි, සිලොපෙ- සිහට ලෝප් කළ කල්හි, අභිභවතීති- මැඛ පවති නු සි, අතිභූ- අතිභූ නම් වෙ. ප්‍රාදිසමාස සි. (සයම්භූ- සයම්භූ යනු ද, එවං- මෙසෙ මැ සි.) 'සයං භවතී'ති සයම්භූ; ස්‍යාදිසමාස සි. සයං- තෙමෙ ම, භවතීති- වෙ නු සි, සයම්භූ- සයම්භූ නම් වෙ.

අම- අම යන ධාතු ද, ගම- ගම් යන ධාතු ද, ගම්නෙ- ගමන්හි වැටෙ; සිම්හි- සිප්‍රත්‍යය කළ කල්හි, සිම්හි—පෙ—ත්‍ති- 'සිම්හි ලොපෝ'නන්තබ්‍යඤ්ඤනස්ස' 5·94 යන සූත්‍රයෙන්, මලොපෝ-ධාතුහුගෙ මකාරයහට ලෝප් වෙ. උරසා- ළය කරණ කොට ගෙන, ගච්ඡතීති- යෙ නු සි, උරගෝ- උරග නම් වෙ; සඵියා සි. අමාදි සමාස සි.

(දෘ- දෘ යන ධාතු, දෘනෙ- දීමෙහි වැටෙ;) අනෝති- 'අනෝ' 5·48 යන සූත්‍රයෙන්, ක්‍රියත්ථා- ධාතුහු කෙරෙන් පර ව, භාවකාරකෙසු- භාව කාරක දෙක්හි, අනෝ- අනප්‍රත්‍යය වෙ. දත්ති- දීම හොා, දීයතීති වා- දෙනු ලැබෙ නු සි හොා, දානං- දාන නම් වෙ. සංපුබ්බෙඛ- ධාතුහු සං ප පුළු කළ කල්හි, යස්ස- යමක්හට, සම්මා-මනා කොට, පදීයතෙ-දෙනු ලැබෙ ද, තං- එ, සම්පදානං- සම්පදාන නම් වෙ. අපආපුබ්බෙඛ- එම ධාතු අප ආ පුළු කළ කල්හි, එතස්මා- මොහු කෙරෙන්, අපාදදාති- පහ වෙ නු සි, අපා දානං- අපාදාන නම් වෙ. මෙ දෙ තැන්හි ම ප්‍රාදිසමාස සි. (කර- කර් යන ධාතු, කරණෙ- කිරීමෙහි වැටෙ.) අධිපුබ්බෙඛා- අධි පුළු සි; 'රා නස්ස ණෝති- 'රා නස්ස ණෝ' 5·171 යන සූත්‍රයෙන්,

ගහ=උපාදනෙ;

තථනරුතං වඨණලා. 1. 52

තථනරුතං වඨණලා හොනති වා යථාකකමනති තස්ස ණාදෙසෙ, 'ගණ්හිතබබං' ගහණං.

පද=ගමනෙ; නිපුබෙබා.

පදුදීනං කිවී. 5. 92

පදුදීනං යුක් හොති කිවිපපවයෙ. 'නිපතති' නිපජ්ජනං. පී=තපපනෙ; අනමහි, 'වනා'දිනා 1·45 නාගමෙ ච, 'න තෙ' 5·85 ඉවවාදිනා එ න හොති. 'පිති' පීනනං. විජ=භයචලනෙසු; සංපුබෙබා; 'සංවිජති' සංවෙජනං. 'අසුසුත්‍රාපී'ති 5·87 එත්තා භාවෙ, සංවිජනං. කුධ=කොපෙ; 'කුජ්ඣති සීලෙනා'ති කොධනො.

ණො- ප්‍රත්‍යයනකාරයහට ණකාරාදෙශ වෙ. එතසම්ං- මෙහි, අධිකරියතීති- පිහිටුවනු ලැබෙ නු සි, අධිකරණං- අධිකරණ නම් වෙ. ආධාරයෙහි සි. ප්‍රාදිසමාස සි.

(ගහ- ගහ යන ධාතු, උපාදනෙ- ගැන්මෙහි වැටෙ;)

තථනරුතං වඨණලා 1·52· දවිපද සි.

තථනරුතං-තථ න ර යන මොවුන්ට, යථාකකමං-පනතීන්, වඨණලා- ව ඨ ණ ල යන මොහු, වා හොනතීති- විකල්පයෙන් වෙත් නු සි, නසස- නකාරයහට, ණාදෙසෙ- ණකාරාදෙශ කළ කල්හි, ගණ්හිතබබං- ගැන්ම්, ගහණං- ගහණ නම් වෙ.

පද- පද යන ධාතු, ගමනෙ- ගම්න්හි වැටෙ; නිපුබෙබා- නිපූර්ව සි.

පදුදීනං කිවී 5·92· දවිපද සි.

පචචයෙ- ප්‍රත්‍යයා පර කල්හි, පදුදීනං- පදුදිධාතූන්ට, (කිවි- කිසි තැනෙක්හි,) යුක් හොති- යුක් වෙ. නිපතති- හෙව්ම, නිපජ්ජනං- නිපජ්ජන නම් වෙ. ප්‍රාදිසමාස සි. (පී- පී යන ධාතු, තපපනෙ- පිනවීමෙහි වැටෙ.) අනමහි- අනප්‍රත්‍යය ද, වනාදිනා- 'වනා'දි 1·45 සූත්‍රයෙන්, නාගමෙ ච- නකාරාගම ද කළ කල්හි, න තෙ ඉති- 'න තෙ' 5·85 යන, ආදිනා- මෙ ආදි සූත්‍රයෙන්, එ න හොති- එකාරාදෙශ නො වෙ. පිති- ප්‍රීති තොම, පීනනං- පීනන නම් වෙ. විජ- විජ යන ධාතු, භයචල

භික්ඛ=යාචනෙ;

ඉත්ථියමණකතිඛයක්යා ච. 5. 49

ඉත්ථිලිඞ්ග භාවෙ කාරකෙ ච ක්‍රියත්ථා අආදයෝ හොනතෝ ච * බහුලං. අ, 'භික්ඛනං, භික්ඛියතීති වා' භික්ඛා; ආපපච්චයෝ. ණෝ, 'කාරණං' කාරා; චාරකං. යථාකථඤ්චි සද්දා නිපඵන්නති; රුළ්හිතෝ අත්ථනිච්ඡයෝ. † භිද=විදාරණෙ; කති, 'භෙදනං, භිජ්ජතෙති වා' භිත්ති. රුජ=භඞ්ගෙ; කෝ, 'රුජ්ති'ති

නෙසු- භය චලන දෙක්හි වැටෙ; සංපුබ්බෝ- සංපූජී සි; සංවිත්ති- කලකිරීම කෙරෙම, සංවෙජනං- සංවෙජන නම් වෙ. අඤ්ඤත්‍රාපිති- 'අඤ්ඤත්‍රාපි' 5.67 යන සූත්‍රයෙන්, එත්තාවතාවෙලහු වූ උපාත්තයහට, එඩිය නු වූ කල්හි, සංවිජනං- යනු වෙ. කුධ- කුධ යන ධාතු, කොපෙ- කිපීමෙහි වැටෙ; සිලෙන- ප්‍රකාශීන්, කුජ්ඣතීති- කිපෙ නු සි, කොධනෝ- කොධන නම් වෙ.

භික්ඛ- භික්ඛ යන ධාතු, යාචනෙ- ඉල්වීමෙහි වැටෙ.

ඉත්ථියමණකතිඛයක්යා ච 5.49. ඉත්ථියං යැ අණකතික යක්යා යැ ච යැ යනු පද සි.

ඉත්ථිලිඞ්ග- ස්ත්‍රීලිඟුයෙහි වැටෙන්නා වූ, ක්‍රියත්ථා- ධාතුහු කෙරෙන්, භාවෙ- භාවයෙහි ද, කාරකෙ ච- කාරකයෙහි ද, බහුලං- ඉෂ්ට පරිද්දෙන්, අආදයෝ හොනති- අ ආදි ප්‍රත්‍යයෝ වෙති; අනෝ ච- අනප්‍රත්‍යය ද වෙ. අ- අප්‍රත්‍යය වෙ; භික්ඛනං- සිඟීම හෝ, භික්ඛියතීති වා- සිඟනු ලැබෙ නු සි හෝ, භික්ඛා- භික්ඛා නමු; ආපපච්චයෝ- 'ඉත්ථියමන්වා' 3.26 සී ආප්‍රත්‍යය වෙ. ණෝ- ණප්‍රත්‍යය වෙ; කාරණං- කිරීම, කාරා- කාරා නම් වෙ; චාරකං- දහගෙය සි.

කිරීම පමණක් කාරා නම් වත් හොත් කාරාශබ්දය දහගෙය කෙසෙ වාච්‍ය වේ ද යන්නාහට පරිහාර දක්වන්නාහු 'යථාකථඤ්චි' යනාදි කීහු.

සද්දා නිපඵන්නති- ශබ්දා නිෂ්පන්නති තොමෑ, යථාකථඤ්චි- යම් කිසි පරිද්දෙකින් වන්නී ය; අත්ථනිච්ඡයෝ- අර්ථනිශ්චය තෙමේ, රුළ්හිතෝ- රුඪිවශයෙන් වන්නෙ සි.

භිදා භිද යන ධාතු, විදාරණෙ- පැළීමෙහි වැටෙ; කති- කතිප්‍රත්‍යය වෙ; කකාර අනුබන්ධ සි; භෙදනං- බිඳීම හෝ,

---

* 'හොවාච්‍යනෝ ච' කළුවි. † 'නිච්ඡොනි' ඉති කළුවි.

රූජා. විද=ඤ්ඤණෙ; යක්, 'වෙදනං, විදන්ති එතායාති වා' විජ්ජා. අජ, වජ=ගමනෙ; පපුබෙබා; යො, 'පබ්බජනං' පබ්බජ්ජා; 'වවගඡ බයඤ්ඤ'න්ති * යොගවිභාගා වස්ස බකාරෙ, දවිත්තං. වන්ද=අභිවාදන ථුතීසු; අනො, 'වන්දනං' වන්දනා.

ඉකිනී සරූපෙ. 5. 52

ක්‍රියත්‍ථස්ස සරූපෙ'භිධෙයෙ ක්‍රියත්‍ථා පරෙ ඉකිනී හොන්ති. ඉ, 'වව ඉච්චයං ධාතු එව' වචි. කිමහි, යුධි. නි, සරූපෙ නිමහි 'කරොතිස්ස ඛො'නි 5·133 විකරණස්ස ඤුවිතඤ්ඤා. 'ඝත්තරි ලො'නි 5 18 ලො. පවති.

භිජ්ජතෙති වා- † බිඳුනා ලැබෙ නු සි හොෘ, භිත්තිං- භිත්ති නම් වෙ. 'ලහුඤ්ඤුපන්නස්ස' 5·83 සි පැමිණි එකාර 'න තෙ කානුබන්ධ නාගමෙසු' 5·85 සී ප්‍රතිෂෙධ වෙයි. පරරූප වෙයි. භිත්තී යනු වෙ.

රූජ- රූජ යන ධාතු, භඞ්ගෙ- බිඳීමෙහි වැටෙ; කො- ඝප්‍රත්‍යය වෙ; රූජතීති- පෙළා නු සි, රූජා- රූජා නමු; කානු බන්ධ ගෙයින් ඔබ නිවෘත්ති ය සි. විද- විද යන ධාතු, ඤ්ඤණෙ- දැන්මෙහි වැටෙ; යක්- යක්ප්‍රත්‍යය වෙ; වෙදෙත්තං- දැන්ම හොෘ, එතාය- මෙ කරණ කොට් ගෙන, විදන්තීති වා- දනිත් නු සි හොෘ, විජ්ජා- විජ්ජා නමු. අජ- අජ යන ධාතු ද, වජ- වජ යන ධාතු ද, ගමනෙ- ගමන්හි වැටෙ; පපුබෙබා- පපුණී සි; යො- යප්‍රත්‍යය වෙ; පබ්බජනං- පැවිදි වීම, පබ්බජ්ජා- පබ්බජ්ජා නමු; වවගඡ බයඤ්ඤන්ති- 'වවගඡබයඤ්ඤ' * යන, යොගවිභාගා- යොගවිභාග යෙන්, වස්ස- වකාරයහට, බකාරෙ- බකාරාදෙශ කළ කල්හි, දවිත්තං- දීඝ වෙ. වන්ද- වන්ද යන ධාතු, අභිවාදනත්‍ථුතීසු- ප්‍රණාම ය සතුති ය යන මෙ දෙක්හි වැටෙ; අනො- අනප්‍රත්‍යය වෙ; වන්දනං- වැඳීම, වන්දනා- වන්දනා නමු.

ඉකිනී සරූපෙ 5·52· දවිපදයි.

ක්‍රියත්‍ථස්ස- ධාතුහුගෙ, සරූපෙ'භිධෙයෙ- සවරූපය කිව මනා කල්හි, ඉකිනී- ඉ කි නි ප්‍රත්‍යයොෘ, ක්‍රියත්‍ථා පරෙ- ධාතුහු කෙරෙන් පර වූවාහු, හොන්ති- වෙත්. සරූප නම් වව යනාදි ධාතුප්‍රකෘති සි. ඉ- ඉප්‍රත්‍යය වෙ; වව ඉති- වව යන, අයං ධාතු එව- මෙ ධාතුව මැ, වවි- වවි නම් වෙ. කිමහි- කිප්‍රත්‍යය

---

* 1. 48. † 'ඔජ්ජතීති වා' සමහර.

කථම්භූතෝ ඉච්චාදි? ඝණන්තෙන කාරසද්දෙන ඡට්ඨී සමාසෝ* *

භුජ=පාලනජෙඛ්ඛාහාරෙසු;

සීලාදිකඛසඤ්ඤුවයඝඤසු ණී. 5. 53

ක්‍රියත්ථා ණී ගොති සීලාදිසු පතීයමානෙසු. 'උණ්හං භුඤ්ජති සීලෙනා'ති උණ්හභොජී. පා=පූතෙ, 'ආසසා ණාවිමහි යුක්' 5 91

කළ කල්හි, යුධී- යුධි යනු වෙ; 'යුධ ඉච්චයං ධාතු එව' යනු විග්‍රහ සි. තී- තිප්‍රත්‍යය වෙ; සරූපෙ තිමහි- ධාතුසවරූපයෙහි විහිත තිප්‍රත්‍යයා පර කල්හි, කරොතිසස ඛොතී- 'කරොතිසස ඛො' 5·133 සි කියා, විකරණසස- විකරණයාගෙ, ඤූපිතත්තා- ඤූපිත බව හෙයින්, ඝත්තරි ලොති- 'ඝත්තරි ලො' 5·18 යන සූත්‍රයෙන්, ලො- ලවිකරණ වෙ. පවති- යනු වෙ.

'පව ඉච්චයං ධාතු එව' යන වාක්‍යයෙහි පව=පෘතෙ යන ධාතුහු කෙරෙන් පර ව 'ඉකිතී සරූපෙ' යන සූත්‍රයෙන් ධාතුසවරූපයෙහි තිප්‍රත්‍යය වෙයි. ධාතුසවරූපයෙහි විහිත තිප්‍රත්‍යයා පර කල්හි 'ඝත්තරි ලො' 5·18 යන සූත්‍රයෙන් ලවිකරණ වෙයි. ලකාර අප්‍රයොගී වෙයි. පවති යනු වෙ.

අකාරොති- අකාරො යන, ආදි- මෙ ආදිය, කථං- කෙසෙ වෙ ද යත්? ඝණන්තෙන- ඝණ්ප්‍රත්‍යයානන්ත වූ, කාරසද්දෙන- කාරශබ්දයා හා, ඡට්ඨීසමාසෝ- ෂෂ්ඨීසමාස වෙ.

කර=කරණෙ යන ධාතුහු කෙරෙන් 'කරණං' යන වාක්‍යයෙහි භාවයෙහි ඝණ් කොට නිපැද වූ කාරශබ්දයා හා අශබ්දයා හා ෂෂ්ඨීසමාස වෙයි. 'අසස කාරො' අකාරො; අසස- අවණ්ණයාගෙ,† කාරො- උච්චාරණය, අකාරො- අකාර නම් වෙ.

භුජ- භුජ යන ධාතු, පාලන- රක්‍ෂා කිරීමෙහි ද, ‡ අජ්ඣොහාරෙසු- අභ්‍යවහරණයෙහි § ද වැටෙ.

සීලාදිකඛසඤ්ඤුවයඝඤසු ණී 5·53· දිවපද සි.

සීලාදිසු පතීයමානෙසු- සීලාදියක් ගම්‍යමාන කල්හි, ක්‍රියත්ථා- ධාතුහු කෙරෙන්, ණී ගොති- ණිප්‍රත්‍යය වෙ. සීලෙන-

---

* 'ඡට්ඨීසමාසෝ, අසස කාරො අකාරෝ' ම.

† 'අසස- අඝබ්දයාගෙ' යි විරුද්ධ.

‡ 'පාලනෙ- රක්‍ෂා කිරීමෙහි වැටෙ' යි සහ.

§ අභ්‍යවහරණය නම් භොජනය යි.

ඉති යුක්; 'ඛීරමාභිකඛඤ්ඤං පිබති'ති ඛීරපායී. 'අවස්සං කරොතී'ති අවස්සකාරී; 'සතමවස්සං දදාති'ති සතදූසී.

ප්‍රකෘතීන් හෙවත් සවභාවයෙන්, උණ්හං- උෂ්ණය, භුඤ්ජතීති- අනුභව කෙරෙ නු සි, උණ්හභොජී- උණ්හභොජී නම් වෙ.

උණ්හං යන ද්විතීයාන්තයා උපපද කොට ඇති භුජ=පාලන පෙඛාහාරෙසු යන ධාතුහු කෙරෙන් 'උණ්හං භුඤ්ජති සීලෙන' යන වාක්‍යයෙහි මෙයින් ණිප්‍රත්‍යය වෙයි; 'ලහුඤ්චුපපන්නස්ස' 5.53 යි ඔ වෙයි; අමාදිසමාස වෙයි; උණ්හභොජී යනු වෙ. මේ සිලාර්ථයෙහි උදාහරණ සි.

පා- පා යන ධාතු, පානෙ- පිමෙහි වැටෙ; ආසඃ ණාපිමහි යුක් ඉති- 'ආසඃ ණාපිමහි යුක්' 5.91 යන සූත්‍රයෙන්, යුක්- යුක් වෙ; ආභිකඛඤ්ඤං- නැවත නැවත, ඛීරං- ක්ෂීරය, පිබතීති- * බොනු සි, ඛීරපායී- ඛීරපායී නම් වෙ.

ඛීරං යන ද්විතීයාන්තෙනොපපද වූ පා=පානෙ යන ධාතුහු කෙරෙන් 'ඛීරමාභිකඛඤ්ඤං පිබති' * යන වාක්‍යයෙහි මෙයින් ණිප්‍රත්‍යය වෙයි; යුක් වෙයි; අමාදිසමාස වෙ; ඛීරපායී යනු වෙ. ආභීක්ෂ්ණ්‍යයෙහි උදාහරණ සි.

අවස්සං- අවශ්‍යයෙන්, කරොතීති- කෙරෙ නු සි, අවස්ස කාරී- අවස්සකාරී නම් වෙ.

අවස්සං යන අසඞ්ඛ්‍යයා උපපද කොට ඇති කර=කරණෙ යන ධාතුහු කෙරෙන් 'අවස්සං කරොති' යන වාක්‍යයෙහි ආවශ්‍යකාර්‍යයෙහි මෙයින් ණිප්‍රත්‍යය වෙයි; වෘද්ධි ද නිගහීතලොප් ද වෙයි; සාදිසමාස වෙයි; අවස්සකාරී යනු වෙ.

සතං- ශතයක්, අවස්සං- එකාන්තයෙන්, දදාතීති- දෙ නු සි, සතදූසී- සතදූසී නම් වෙ.

'සතමවස්සං දදාති' යනු විග්‍රහ සි. අමාදිසමාස ව විභක්ති ලොප් නො වෙයි; නිගහීතයහට වගීාන්ත වෙයි; සෙස්ස අන්‍ය නාරසදෘශ සි. මෙ උදාහරණත්‍රය ආවශ්‍යකාර්‍යයෙහි සි. මෙහි සීල නම් ප්‍රකෘතිය; ආභීක්ෂ්ණ්‍ය නම් නැවැත නැවැත වීම ය; ආවශ්‍යක † නම් අවශ්‍යකර්තව්‍ය ය සි. මෙ තුන ගම්‍යමාන කල්හි ධාතුහු කෙරෙන් ණිප්‍රත්‍යය වෙයි.

---

* 'පිවතීති' යි සා්‍ය. † 'අවශ්‍ය නම්' ම යි යුදු.

කත්තරි භූතෙ කතවන්තුකතාවී. 5. 55

භූතෙ-පරිසමත්තෙ අත්ථෙ වත්තමානතො ක්‍රියාතො කතවන්තු කතාවී හොන්ති කත්තරි 'අභූඤ්ජී'ති භූතත්තවා; භූතත්තාවී. සු= සවනෙ; 'අසුණී'ති සුතවා; සුතාවී

කෙනා භාවකම්මෙසු. 5. 56

භාවෙ කම්මෙ ච භූතෙ කෙනා හොති. ආස=උපවෙසනෙ; 'ආසන'මාසිතං. ඤ්ඳි

රුද=රොදනෙ;

වා ක්වි. 5. 85

තෙ එඛආ ක්වි වා න හොන්ති කාතුබන්ධානාගමෙසු. 'රොදනං' රුදිතං; රොදිතං

කත්තරි භූතෙ කතවන්තුකතාවී 5·55· තිපද සි.

භූතෙ ය සී සෙසි; පරිසමත්තෙ අත්ථෙ- පරිසමාප්ත වූ අර්ථයෙහි, වත්තමානතො- වැටෙන්නා වූ, ක්‍රියාතො- ධාතුහු කෙරෙන් පරව, කත්තරි- කර්තෘකාරකයෙහි, කතවන්තුකතාවී- කතවන්තු ප්‍රත්‍යයෝ, හොන්ති- වෙත්. අභූඤ්ජීති- අනුභව කෙළෙනු සි, භූතත්තවා- භූතත්වනතු නම් වෙසි; භූතත්තාවී- භූතත්තාවී නම් වේ. සු- සු යන ධාතු, සවනෙ- ඇසීමෙහි වැටෙ; අසුණීති- ඇසීනු සි, සුතවා- සුතවනතු නම් වෙසි; සුතාවී- සුතාවී නම් වේ

කෙනා භාවකම්මෙසු 5·56· දිපද සි.

භූතෙ- භූතාර්ථයෙහි වැටෙන්නා වූ ධාතුහු කෙරෙන් පරව, භාවෙ- භාවයෙහි ද, කම්මෙ ච- කර්මකාරකයෙහි ද, කෙනා හොති- ක්ත ප්‍රත්‍යය වෙ. ආස- ආස යන ධාතු, උපවෙසනෙ- හිඳීමෙහි වැටෙ; ආසනං- හිඳීම, ආසිතං- ආසිත නම් වෙ. ඤ්ඳි- 'ඤ්ඳි බ්‍යඤ්ජනසස' 5·170 සි ඤ්ඳිආගම වෙ. ධාතුහු අකර්මක හෙයින් කර්මයෙහි නො වෙ

රුද- රුද යන ධාතු, රොදනෙ- හැඬීමෙහි වැටෙ.

වා ක්වි 5·86· දිපද සි.

කාතුබන්ධානාගමෙසු- කාතුබන්ධානාගමයන් පර කල්හි, තෙ එඛආ- එ එ, ඔ, ආ යන ආදෙශයෝ, ක්වි- කිසි තැනෙක්හි, වා- විකල්පයෙන්, න හොන්ති- නො වෙත්. රොදනං- හැඬීම, රුදිතං- රුදිත නම් වෙසි; රොදිතං- රොදිත නම් වෙ.

'කරීයිත්ථා'ති සතෝ;

ගමාදිරඤං ලොපෝ'ඤඤස්ස. 5. 109

ගමාදීනං රකාරඤඤානඤ්චානන්තස්ස ලොපෝ හොති තකාරාදෙ කානුබන්ධෙ පච්චයෙ කානන්තඤ්චජ්ජිතෙති * රලොපෝ

යා=පාපුණනෙ;

ගමනත්ථාකම්මකාධාරෙ ච. 5. 59

ගමනත්ථතෝ අකම්මකතෝ ච ක්‍රියත්ථා ආධාරෙ කෙත්තා හොති කත්තරි භාවකමෙසු ච. 'යාතවන්තෝ'සම්'නති යාතං; යාතං. 'යාතවන්තෝ' යාතා. 'යානං' යාතං. 'යාසිත්ථා'ති යාතෝ;

රුද=රොදනෙ යන ධාතුහු කෙරෙන් පර ව 'රොදනං' යන වාක්‍යයෙහි භාවයෙහි කෘත්‍රප්‍රත්‍යය වෙයි; ප්‍රත්‍යයා පර කල්හි ලහු වූ උපාන්තයාහට 'ලහුඋපන්තස්ස' 5.83 යි පැමිණි ඔකාරය හට, 'න තෙ කානුබන්ධිනාගමෙසු' 5.85 යි නිත්‍යයෙන් ප්‍රතිෂෙධ පත්තෙහි, 'වා ඛවි' 5.86 යන සූත්‍රයෙන් විකල්පයෙන් ප්‍රතිෂෙධ වෙයි; රුදිතං යනු වෙ. නු වූ පක්ෂයෙහි රොදිතං යනු වෙ.

කරීයිත්ථාති- කරන ලද නු යි, කතොං- කත නම් වෙ, කම්යෙහි කත වූ තැනි.

ගමාදිරඤං ලෙපෝ'ඤඤස්ස 5.109. නිපද යි.

කානන්තඤ්චජ්ජිතෙ- කාන කා වර්ජිත කොට ඇති, තකාරාදෙ- තකාරය ආදි කොට ඇති, කානුබන්ධෙ පච්චයෙ- කානුබන්ධප්‍රත්‍යයා පර කල්හි, ගමාදීනං- ගමාදිධාතූන්ගෙ ද, රකාරඤඤානඤ්ච- රකාරාඤඤධාතූන්ගෙ ද, අන්තස්ස- අන්තයහට, ලොපෝ හොතීති- ලොප් වෙ නු යි, රලොපෝ- රකාරයහට ලොප් වෙ

යා- යා යන ධාතු, පාපුණනෙ- පැමිණීමෙහි වැටෙ.

ගමනත්ථාකම්මකාධාරෙ ච 5.59. ගමනත්ථා යැ අකම්මකා යැ ආධාරෙ යැ ච යැ යනු පද යි.

ගමනත්ථතෝ- ගම්නාර්ථ වූ ද, අකම්මකතෝ ච- අකර්මක වූ ද, ක්‍රියත්ථා- ධාතුහු කෙරෙන්, ආධාරෙ- ආධාරකාරකයෙහි ද, කත්තරි- කර්තෘකාරකයෙහි ද, භාවකමෙසු ච- භාව කර්ම දෙක්හි ද, කෙත්තා හොති- කෘත්‍රප්‍රත්‍යය වෙ. අසම්ං- මෙහි, යාත

---

* 'ඤ්ඤානඤ්ඤාවජ්ජිතෙති' ම.

